# 2019.05.07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය**

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදූර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ.සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 9.30 රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී**☸

## (01)

### 01.01 2019 – 04 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම

2019-04-02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී දිනායාදූර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදී.

- **ඒ අනුව 2019 – 04 - 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

සංශෝධන

**01.** 2019.04.02 දින පැවති මාසික සභා රැස්විමේදි සභා වාර්තාව පරිසණක ගත කිරීමේදි විෂය ලිපිකාර මහත්මිය මඟින් එය පරිසණක ගත කරිමේදි වෙනත් කරුණු යටතේ අදහස් දක්වන ලද නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ විසින් දක්වන ලද අදහස වැරදිමකින් ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා දක්වන ලද අදහසක් ලෙස සටහන්ව තිබිම ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා දක්වන ලද අදහසක් ලෙස නිවැරදි කිරිම.

**තීරණය**

- 2019.04.02 දින පැවති මාසික සභා රැස්විමේදි විෂය ලිපිකරු මහත්මියගේ වැරදිමකින් වෙනත් කරුණු යටතේ අදහස් දක්වන ලද ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් දක්වන ලද අදහස පරිසණකත කිරීමේදි ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා දක්වන ලද අදහසක් ලෙස සටහන්ව තිබිම ගරු නගර සභා මන්ත්‍රි ග්‍රේෂන් කෙරමිණියගේ මහතා දක්වන ලද අදහසක් ලෙස නිවැරදි විය යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**02.** 2019.04.02 දින පැවති මාසික සභා වාර්තාවේ සඳහන් සභා තීරණ අංක 05.01.04 යෝජනාව යෝජනා වලින් ඉවත් විය යුතුය.

**තීරණය**

2019.04.02 දින පැවති මාසික සභා වාර්තාවේ සඳහන් සභා තීරණ අංක 05.01.04 යෝජනාව යෝජනා වලින් ඉවත් විය යුතුය. එය සංශෝධනය කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන ඇත

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා කතා කරමින්**

2019.04.21 වන දින රටතුළ ඇතිවූ බෝම්බ ප්‍රහාරය තුළින් මියගිය සියළුම පුද්ගලයන් සිහිකිරිම සඳහා විනාඩියක නිශ්ශබ්දතාවයක් දක්වන ලෙස ඉල්ලා සිටිනවා.

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 අම්බලන්ගොඩ පාපන්දු සංගමය සඳහා නගර සභාව සතු රෙදි කූඩාරම් 10ක් සහ ප්ලාස්ටික් පුටු 50 නොමිලේ ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදි**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ පාපන්දු සංගමය , ශ්‍රීලංකා පාපන්දු සංගමය හා එක්ව පවත්වනු ලබන දකුණු පළාත් වයස අවුරුදු 11න් පහළ පාපන්දු තරඟාවලිය 2019.04.06හා 07 වෙනිදින බද්දේගම මාපුර්ණගම ක්‍රිඩාංගණයේදි පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම තරඟාවලිය සඳහා ක්‍රිඩක ක්‍රිඩිකාවන් 350ක් පමණ සහභාගි වන අතර නගර සභාව සතු රෙදි කූඩාරම් 10ක් සහ ප්ලාස්ටික් පුටු 50ක් 2019.04.05 දින සිට 07 දින දක්වා නොමිලේ ලබාදෙන ලෙස පාපන්දු සංගමයේ සභාපති විසින් ඉල්ලීමක් කර ඇත. එය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දී ඇති අතර එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

ශ්‍රී ලංකා පාසල්පාපන්දු සංගමය , ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය හා අම්බලන්ගොඩ පාපන්දු සංගමය මගින් 2019 අප්‍රේල් මස 6 හා 7 දෙදින තුල පැවැත්වෙන පාපන්දු තරඟාවලිය සඳහා රෙදි කූඩාරම් 10 ක් හා ප්ලාස්ටික් පුටු 50ක් අප්‍රේල් මස 05 දින සිට 07 දක්වා සභා අනුමතියට යටත්ව ලබා දිම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි දිනායාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 03.02 අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව මගින් පුර නැගුම ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද නව ගොඩනැගිල් විවෘත කිරිමේ උත්සවය සඳහා 2019.04.07 දිනට වර්ණ ධජ 25ක්  සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද නව ගොඩනැගිල්ල විවෘත කිරිමේ උත්සවය 2019.04.07 වන දින පස්වරු 4.00 ට අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභා ප්‍රධාන කාර්යාලයේදි පැවැත්වේ. මෙම උත්සවය සාර්ථක කර ගැනිම සඳහා වර්ණ ධජ 25ක් නොමිලේ ලබා දෙන ලෙස අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ ලේකම් විසින් කාරුණික ඉල්ලා ඇත. එය සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දී ඇත. ඒ සඳහා සභා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව මඟින් ඉදිකරන ලද නව පුස්තකාල ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය සඳහා 2019.04.07 දිනට  වර්න ධජ 25ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබාදිම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ස්ථිර කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 03.03 වැලිවිටිය දිවිතුරු ප්‍රාදේශිය සභාව විසින් සභාව සතු ජල බවුසරය ඉල්ලා ඇති 2019.04.08 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැලිවිට දිවිතුර ප්‍රාදේශිය සභාව විසින් ජල බවුසරය ලබා ගැනිම සඳහා ඉල්ලීමක් කර ඇත. වැලිවිට දිවිතුර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මේ දිනවල පවතින නියං තත්වය නිසා අධික ජල හිඟයකට මුහුණ දි ඇත. වැලිවිට දිවිතුර ප්‍රාදේශිය සභාව විසින් එම ජනතාවට සහනය සැලසිමේ වැඩසටහනක් මේ වන විටත් ආරම්භ කර ඇත. එම කටයුත්ත සඳහා අප සභාව සතු ජල බවුසරය ප්‍රමාණවත් නොවන බැවින් ඔබ සභාව සතු ජල බවුසරය ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. ඒ සඳහා ට්‍රැක්ටරයට සවිකරන ලද ජල බවුසරය සති දෙකක කාලයකට සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දි තිබු අතර එය නැවත භාරදී ඇත. ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

වැලිවිට දිවිතුර ප්‍රාදේශිය සභාවට ට්‍රැක්ටරයට සවිකරන ලද ජලබවුසරය සති දෙකක පමණ කාලයකට සහා අනුමතියට යටත්ව නොමිලේ ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**03.04 ධර්මාශෝක විද්‍යාලයීය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය විසින් භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘති හා ශිෂ්‍යත්ව ව්‍යාපෘති සාර්ථක කර ගැනිම සඳහා පවත්වනු ලබන ප්‍රසංගය විනෝද බදු නිදහස් කර දිම හාප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය සම්බන්ධ ලිපිය සහා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ධර්මාශෝක විද්‍යාලයේ කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය විසින් විනෝද බද නිදහස් කර දෙන ලෙස ඉල්ලිමක් කර ඇත. ධර්මාශෝක විද්‍යාලයේ කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය තුළ පවතින භෞතික හා ශිෂ්‍ය සංවර්ධනය සඳහා වූ විශේෂ වැඩ පිළිවෙලක් 2019 වර්ෂයේදි ක්‍රියාත්මක කරමින් පවති. ඒ වැඩසටහන ව්‍යාපෘති 25කට අධික සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරමින් සිටි. භෞතික සම්පත් ව්‍යාපෘති , ශිෂ්‍යාත්ව ව්‍යාපෘති අංග කැපි පෙනෙන වැඩ කොටසක් ඉටු කරයි. මේ අංශ සාර්ථක කර ගැනිම සඳහා සංගමය විසින් වාර්ෂිකව ප්‍රසංග රාශියක් ක්‍රියාත්මක කරයි. මේ වර්ෂයේද ජුනි 22 දින විද්‍යාලීයිය මුදලිඳු එස් තෝමස් ද සිල්වා ශ්‍රවනාගාරයේදි පැවැත්වෙන අතර විනෝද බදු නිදහස් කර දිමෙන් අපේක්ෂිත ආදායම සෘජුවම දරුවන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු සඳහා යෙදවිමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා ඇත. ප්‍රචාරනය සඳහා අවශ්‍ය ප්‍රචාරක පුවරු සඳහා අවශ්‍ය අනුමතිය ද ලබා දෙන ලෙස ලේකම්තුමිය , සභාපති, හා විදුහල්පතිතුමා විසින් ඉල්ලිමක් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අනිවාර්ය අයකිරිමක් අය කිරිමට කමිටුව විසින් යෝජනා කර ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කලින් යෝජනා කර ඇත. අයවැය සමඟයි. නිදහස් නොකොට 10% ක මුදලක් තබා ගන්නා ලෙස

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි මේ කමිටුවෙන් තීරණය කරනු ලැබුවේ විනෝද බදු නිදහස් කිරිමට නොවේ. රු. 3000ට වැඩි විනෝද බඳ මුදල් 25% තිබුණ එය අඩුකිරිමට කමිටුව මඟින් තීරණය ගනු ලැබුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එය අනුමත කලාට අද දිනයේ සභාවේදි තමයි එය සම්මත කර ගනු ලබන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ඒ අනුව මෙය නිදහස් කරන නිසා තමයි මෙය අඩු කරනු ලැබුවේ. පාසලක් නිසා මගේ කිසි ගැටළුවක් නැහැ මෙය නිදහස් කිරිම සම්බන්ධව . දිගින් දිගටම මෙසේ නිදහස් කිරිමට ගියාම 10% මුදලත් 25% මුදලත් අපිට නැතිවෙනවා. මෙය නිදහස් කරනු ලබන්නේ කොහොමද ? පාසල් වලට කෙසේද? 10% මුදල ඉල්ලුවත් නිදහස් කරනු ලබනවා. පෞද්ගලික ආයතනවලට කොහොමද නිදහස් කරන්නේ.මෙතුමා එම යෝජනාව ගෙන ආවිට ඊට අදාලව මා කතා කරන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව කවුරුත් මොනවත් ප්‍රකාශ කරනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව තීන්දුවක් දිය නොහැකිය. මේ විනෝද බදු සම්බන්ධ ලිපිය සභාවට ගෙන ආ විට තීන්දුවක් දෙන්න .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එම ගාස්තු නිදහස් කිරිමේ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

මා ප්‍රකාශ කරන්නේ මෙය පාසලට ලබා දෙන ලෙසයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මා ඉල්ලා සිටින්නේත් මෙය පාසලට ලබා දෙන ලෙසයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එසේ නම් ප්‍රශ්නයක් නැහැ. විනෝද බද ආඥා පණතේ විධිවිධාන වලට  අනුව නිදහස් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා කරුණු කිහිපයක් ප්‍රකාශ කළ යුතුයි . සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනිම සඳහා. මේ නිදහස් කිරිම ඉල්ලා සිටින්නේ මේ පාසලේ දරුවන් වෙනුවෙන්. මේ ගරු මන්ත්‍රීවරුන්ගේ හරි අඩකට වඩා දරුවන් මේ පාසලේ ඉගෙනුම ලබයි. මේ සියළුම ජනතාව ඡන්දය දි මෙතැනට එවනු ලැබුවේ එම දෙමාපියන් විසිනි. මේ ප්‍රතිලාභය යන්නේ මේ දරුවන් වෙනුවෙනි. මා එය 100% ක්ම සහතික කරනවා. මේ වියදම් කිරිම ස්වේච්චාවෙන් ඒ අයගේ අතින් වියදම් කර ගනිමින් තමයි මෙහි සංවිධානය කටයුතු කරනු ලබන්නේ. එම නිසා මේ සියළු මුදල් ලැබෙන්නේ පාසලට. ඕනම දෙයක පොඩි අක්‍රමිකතා ඇති. එය මා නැහැ කියන්නේ නෑ.100% ම මේ මුදල් පාසලේ මේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා තමයි යොදවන්නේ.අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඕනෑම පාසලකට පොදුවේ ලබා නොදෙන පහසුකම් තිබෙනවා. අන්න එවැනි පහසුකම් ධර්මාශෝක විද්‍යාලය වගේ පාසල් වල වැඩි කරනු ලබන්නේ මේ ප්‍රජාව විසිනි. එම මුදල් වලිනි. මෙය නිදහස් කිරිම කරන ලෙස ඉල්ලිම කරනු ලබන්නේත් අන්න එම නිසායි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

විනෝද බදු සම්බන්ධයෙන් කමිටු පත්කර යම් යම් තීන්දු තීරන පසුගිය දිනවලදි ගනු ලැබුවා. පාසලක් නිසා මඟ හරින්නත් බැහැ. ධර්මාශෝක විද්‍යාලයේ පොඩි පොඩි ගැටළු තිබෙනවා.ගරු සභාපතිතුමා විසින් සභාවකදි කතා කළා නාවික හමුදාපතිවරයා පැමිණි අවස්ථාවේ ඇතිවූ ප්‍රශ්නය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නෑ ඒගැන දැන් කතා කරන්න අවශ්‍ය නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නැහැ කතා කරන්නේ නැහැ. ඒ සම්බන්ධවත් යම්කිසි තිරණයක් තිබිය යුතු යයි අපගේ මතය.නගර සභාව ලෙස අපගේ ගරුත්වයත් තිබිය යුතුයි. අම්බලන්ගොඩ නගරයේ දරුවන්ට ඇතුළත් විමටත් නොහැකි තත්වයක් තමයි දැන් ඇති වී ඇත්තේ. එය අනිවාර්යෙන්ම කිව යුතුයි. අපගේ දරුවකු ඇතුළත් කිරිමට ගියත් ලොකු ගැටළු සහගත තත්වයක් තිබෙනවා. පොදුවේ වර්ගිකරණය කරන ලද පාසලක් නිසා අපගේ සහායෝගය ලබා දෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එය ලබා දෙනවා.

**තීරණය**

ධර්මාශෝක විද්‍යාලයීය කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය විසින් 2019.06.22 දින පවත්වනු ලබන ප්‍රසංගය සඳහා විනෝද බදු නිදහස් කිරිම විනෝද බදු අඥා පණතේ විධිවිධාන වලට යටත්ව නිදහස් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.05 අම්බලන්ගොඩ , විද්‍යාල මාවත, යහ සාධක සමිතිය මඟින් 2019.04.15ත දින පවත්වනු ලබන බක්මහ උළෙල සඳහා කැනපි 03ක් සහ කොඩිකණු 10ක් සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

යහසාධක සමිතිය , විද්‍යාල මාවත, අම්බලන්ගොඩ. වාර්ෂිකව පවත්වනු ලබන බක්මහ උළෙල සඳහා කැනපි 03 ක් හා කොඩි 10 ක් හා පාට කොඩි 50ක් 2019 අප්‍රේල් මස 15 දිනට ලබාදෙන ලෙස කරන ලද ඉල්ලිමට අනුව සභා අනුමතියට යටත්ව ලබා දී ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ යහ සාධක සමිතිය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන බක්මහ උළෙල සඳහා 2019.04.15 දිනට කැනපි 03 ක් හා පාට කොඩි සහිත කොඩි කණු 10 ක් සභා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා ස්ථිර කරන ලදුව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.06 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු කිරිමේ මධ්‍යස්ථානය මගින් 2019.04.28 දින පවත්වනු ලබන බක්මහ උළෙල සඳහා කොඩි 25ක් හා කොඩි කණු 25ක් සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

තොරතුරු හා සන්නිවේදන පුරුදු කිරිමේ මධ්‍යස්ථානය.2019 වර්ෂයේ පැවැත්වෙන බක්මහ උළෙල සාර්ථක කර ගැනිමට.මේ ආයතනයෙනුත් ඉල්ලා තිබෙනවා ක්‍රිඩාංගණය ආලංකාර කර ගැනිම සඳහා. මා හිතන්නේ මෙය නොපැවැත්විණි. සහා අනුමතියට යටත්ව ලබා දෙන ලෙස දන්වා ඇත. මෙම බක්මහ උළෙල නොපැවැත්වූ බැවින් මෙය ඉවත් කර සිටිනවා.

**තීරණය**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු කිරිමේ මධ්‍යස්ථානය මගින් 2019.04.28 වන දින බක්මහ උළෙල සඳහා පුටු 50ක් කොඩි හා කොඩි කණු 25 ක් නොමිලේ ඉල්ලා සිටනු ලැබුවත් මෙම බක්මහ උළෙල නොපැවැත්වූ නිසා මෙම ලිපිය ඉවත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කරන අතර ලදුව ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**03.07 බලපිටිය ප්‍රාදේශිය සභාව විසින් ජල බවුසරය ලබා දීම සම්බන්ධව ස්තුතිය පුද කිරිමේ ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ප්‍රාදේශිය සභාව , බලපිටිය.ජල බවුසරය ලබා ගැනිම සම්බන්ධවයි. පසුගිය දිනවල පැවැති වියළි කාලගුණික තත්වය නිසා බල ප්‍රදේශයේ විශාල පානිය ජල හිඟයකට මුහුණ දෙන ලදි. එහිදි ඔවුන්ට ජලය සපයා දිමට අප සභාවට ගැටළුවක් විය. ඒ අනුව අපගේ ඉල්ලීම සලකා බලා රියදුරු මහතෙකු සමඟ ජල බවුසරය ලබා දීම පිළිබඳ 2019 අප්‍රේල් මස පැවති මසික සභා රැස්වීමේදි ගරු මන්ත්‍රිවරුන් විසින් අම්බලන්ගොඩ නගර සභාවට හා ඔබතුමාට පුද කළ යුතු බවට ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ඔබතුමා ලබා දුන් සහායෝගය පිළිබඳව ඔබතුමාට හා ගරු මන්ත්‍රි මණ්ඩලයට කෘතවේදය පුද කර සිටි.ඔබ ආයතනයට යම් සහායෝගයක් අවශ්‍ය වු විට ලබාදෙන බවට වැඩිදුරටත් දන්වා ඇත.

**තීරණය**

වියලි කාලගුණික තත්වයෙන් පිඩාවට පත් ජනතාවට පානීය ජලය සැපයීම සඳහා බළපිටිය ප්‍රාදේශිය සභාවට අප සභාව සතු ජල බවුසරය ලබා දීම සම්බන්ධයෙන් සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රි මණ්ඩලය වෙත ස්තුතිය පුද කිරිම සම්බන්ධ ලිපිය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.08 නියඟයෙන් පිඩාවට පත් වැලිවිටිය - දිවිතුරු ප්‍රදේශිය සභා බල ප්‍රදේශයේ ගම්මාන සඳහා ජලය හා සහන සේවා සැපයීම සඳහා ප්‍රශංසාව පල කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

වැලිවිට දිවිතුර ප්‍රාදේශිය සභාව. නියඟයෙන් පිඩාවට පත් ජනතාව සඳහා ජලය ලබා දිමේ සහනය සැලසිම සඳහා ජල බවුසරය ලබා දිම පිළිබඳව ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා විසින් ප්‍රශංසා පල කර ලිපියක් එවා ඇත. එය සභාවේ දැන ගැනිම පිණිස ඉදිරිපත් කර සිටිනවා.

**තීරණය**

නියඟයෙන් පිඩාවට පත් ජනතාවට පානීය ජලය සැපයීම සඳහා වැලිවිටිය - දිවිතුර  ප්‍රාදේශිය සභාවට අප සභාව සතු ජල බවුසරය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය හා ප්‍රශංසාව පුද කිරිම සම්බන්ධ ලිපිය සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

**03.09 පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් කාර්යාල පරික්ෂණ වාර්තාව - සභා රැස්විම ,ගෙවීම් වවුචර් , ආදායම් සම්බන්ධව  ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සහාකාර පළාත් පාලන කොමසාරිස්තුම් විසින් එවන ලද ලිපියක් ගරු සභාවේ දැන ගැනිම පිනිස ඉදිරිපත් කරනවා. කාර්යාල සභා වාර්තාව , ගෙවීම් වවුචර් හා ආදායම් , සභා රැස්වීම් පවත්වාගෙන යාම පිළිබඳව වාර්තා ලබා ගැනිම. ඔබ සභා රැස්විම පවත්වා ගෙන යාම , සභා වාර්තා තබා ගැනිම. ඔබ සභාවේ රැස්වීම පවත්වාගෙන යාම හා වාර්තා තබා ගැනිම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදි එකී රැස්වීම පවත්වාගෙන යාම අම්බලන්ගොඩ නගර සභාව විසින් ක්‍රියාත්මක කිරිමට පිළිගෙන ඇති 2013/05/17 දින අංක1811 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ගැසට් පත්‍රයේ iv (අ) කොටසේ එල කරන ලද සභා රැස්වීම්වල කටයුතු කරගෙනයාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුකුල නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව පහත කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කළ යුතුය.

( 01) සභාවට ලිපි සංදේශ පෙත්සම් ඉදිරිපත් කිරිම යටතේ කිසියම් සභිකයෙකුට පෙත්සම් හෝ සංදේශයේ අරමුණ ලුහුඩින් ප්‍රකාශ කළ හැක. එය සම්පුර්ණයෙන් කියවිය යුතු නම් ඒ සඳහා යෝජනාවක් සම්මත කළ යුතුය. ඒ අනුව පෙත්සම් ලුහුඩින් ඉදිරිපත් කිරිම හෝ සම්පුර්ණයෙන් කියවිම පමණක් සිදු කිරිමෙන් පසුව එය කාරක සභාවකට ඉදිරිපත් කිරිම හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට සභාපතිවරයාට හැකියත එසේ වුවත් අම්බලන්ගොඩ නගර සභා රැස්විම්වල ලිපි

සංදේශ විෂය කොට දීර්ඝ ලෙස සකච්ඡා, විවාද කර ඇති අතර ඇතැම් අවස්ථාවල යෝජනා සම්මුතින් ද මගින් තීරණ ගෙන ඇත. එකී කටයුතු සියල්ල වාර්තා කිරිමට ද පියවර ගෙන ඇත. එම තත්ත්වය ව්‍යවස්ථානුකුල නොවන බව පෙන්වා දි ඇත.

(02) යථා පරිදි කල් දී ඇති යෝජනාවල නිළධාරින් ඉදිරිපත් කරනු ලබන පරිපාලන යෝජනා ලෙස ලේකම් හා වෙනත් නිළධාරින් යෝජනා ඉදිරිපත් කරන බවට සභාපතිවරයා විසින් එකී යෝජනාව පිළිගත යුතු බව යෝජනා ඉදිරිපත් කරන බව වාර්තා ගත කර ඇත. ( 2018.07.03) හා 2018.10.02 මහා සභා වාර්තා ) යථා පරිදි කල් දී යෝජනා යටතේ නිළධාරින්ට යෝජනා ඉදිරිපත් කළ නොහැකි වන අතර යෝජනා පරිපාලනයට අදාළ වුවද එම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ සභාපතිවරයා හා ගැටලු සභිකයන් විසිනි.

(03) යෝජනා ඉදිරිපත් කිරිම විවාද කිරිම විවාදය අවසන් කිරිම ඡන්දය දිම නිසිලෙස සභා සම්මුතියට පත් කිරිම වාර්තා කළයුතු අතර සියළු යෝජනා සම්බන්ධයෙන් එක් එක් ක්‍රියාපාටි පාටි ඉටුකර ඇති බවට වාර්තාවල සටහන් වි නොතිබිම. ඒ අනුව යෝජනාවල ව්‍යවස්ථානුකුල නොවන බව පෙන්වා දෙමි.

(04) කාරක සභා වාර්තා සලකා බැලිමේදි කාරක සභා වාර්තා මහා සභා වාර්තාවට අන්තර්ගත කොට තිබේ.මහා සභා වාර්තාවට කමිටු වාර්තා ඇතුළත් කිරිම සම්පූර්ණයෙන්ම ඇතුළත් විය යුතු නැත.කමිටු වාර්තා වෙනම ගොනු කර තබා ගැනිමටත් කමිටු වාර්තාවේ නිර්දේශ සඳහා මහ සභාවේ අනුමතිය ලබාගෙන ඒ බව මහා සභා වාර්තාවේ සටහන් කිරිම ප්‍රමාණවත් වේ.

(05) මහා සභා රැස්විම්වල දැක්වෙන ආකාරයට සභිකයන් කතා කරන සියළු දේ හා අදහස් වාර්තා කර ඇත.තවද කතා කිරිමට අදාල රිතින්ටද පටහැනිව අදහස් දක්වා ඇත.එ අනුව රිති මතු කිරිමට කටයුතු නොකර ඇති අතරපවත්වාගෙන යන අවධිමත් බව පෙනි යයි.රැස්විම් පවත්වාගෙන යාමේ අතුරු ව්‍යවස්ථාව අනුව 8.4 අනුව සභිකයන් කතා කරන සියළු කරුණු අවශ්‍ය නොවන අතර යෝජනා සම්බන්ධයෙන් වැදගත් වනුයේ යෝජනා සම්බන්ධ කැමැත්ත අකමැත්ත යෝජනා සම්මුතිය සඳහන් කිරිමයි.ඒ අනුව අවධානය යොමු කිරිම අනුව දැනට පිටු 80 ප්‍රමාණය වු විශාල වාර්තාව කෙට වාර්තාවක් බවට පත්කර ගත හැකිවේ.

(06) න්‍යාය පත්‍රයට ඇතුළත් නොවු වෙනත් කරුණු යටතේ නැවත යෝජනා ඉදිරිපත් කිරිම වාද විවාද කිරිම දැක්විම ව්‍යවස්ථානුකුල නොවන බව පෙන්වා දේ.

ඊළගට ගෙවිම් වවුචර් අත්සන් කිරිම හා ගෙවිම් වවුචර් සහතික කිරිමට හෝ බලය පවරා ඇති විටක උප සභාපතිවරයා විසින් සිදු කළ යුතුව ඇත.එහෙත් ඔබ ආයතනයේ වවුචර් පත් අත්සන් කිරිම ප්‍රධාන කළමනාකාර සහාකාර විසින් සිදු කරන අතර ගෙවිම් අනුමතිය සභාපතිවරයා විසින් කරනු ලබයි.ඒ අනුව ගෙවිම් වවුචර් සහතික කිරිම සභාපතිවරයා විසින් සිදු කළ යුතු ය.මෙය ඉතා දිර්ඝ විස්තර සහිත ලිපියකි. සියළු විස්තර කියවීම අපහසුයි.ගරු මන්ත්‍රිවරුන්ට මේ ලිපියේ ඡායා පිටපත බැගීන් ලබා දෙන්නම්.මෙහිදි මට ඇත්තටම ගැටළුවක් මතුවෙනවා. මෙම ගෙවිම් වවුචර් ගෙවිම සඳහා අත්සන් කරනු ලබන්නේ මා නිසා. එම නිසා වවුචරය සහතික කිරිම මා විසින්ම සිදු කළහොත් එය ගැටළු සහගත තත්වයකි. එහි බලය ලේකම්වරයාට හෝ නිලධාරියෙකුට පැවරිම වඩාත් සුදුසු බවයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි. පළාත් පාලන විමර්ශන නිලධාරි මෙම ස්ථානයට පැමිණ නිරික්ෂණය කර විමර්ශනයක් සිදු කර ලබා දි ඇති වාර්තාවක් බවයි මා හට හැඟියන්නේ. අපිත් සොයා බැලු විදියට ඔය තත්වය සැබැවයි. මේ විෂයට අනුව සොයා බැලු ආකාරයට පරිගණක දැනුම නැතිනම් ඔවුන්ට පරිගණක දැනුම ලබා දිය යුතුයි. සමහර නිලධාරින් විසිනි ලබාදෙන ලද පරිගණක අයින් කර ඇත. ගබඩාවට මා ගිය විට දුටුවේ එහි පරිගණක කලින් සිටි නිලධාරි මහත්මිය විසින් අයින් කර ඇති බවයි. ඒ එයාගේ නොහැකියාවයි. පරිගණක පාවිච්චි කිරිමට නොහැකි විමයි.ඕනෑම ආයතනයක පලමුවෙන්ම පරිගණක ඇති ස්ථානය වන්නේ ගබඩාවයි.ගබඩාවෙත් පරිගණයක් නැතිනම් නගර සභාවේ මේ තාක්ෂණය පිළිබඳ කතා කිරිම පලක් නැහැ

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගබඩාවට පරිගණකයක් සපයා දී තිබුණා. ඒ අය පාවිච්චි නොකළ නිසා ක්‍රියා විරහිත වී ඇත.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එකනෙමේ මේ ප්‍රකාශ කරන්නේ . එයාට දිපු එකක් නෙමේ. ගබඩාවේ පරිගණක තිබෙන එක නෙමේ. එම නිලධාරියා මෙයට අනුගත විය යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එම නිලධාරියා ස්ථාන මාරු ලබා ගොස් ඇත. ඒ සඳහා නව නිලධාරියෙක් පත්කර ඇත. ඇයට පරිගණක දැනුම තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

මා මේ තාක්ෂණය සම්බන්ධ නිලධාරියා පිළිබඳ නෙමේ කතා කලේ.එම නිලධාරියා විශාල පරිශ්‍රමයක් දරනවා. මේ තාක්ෂණයට නිලධාරින් අනුගත කිරිමට. පුහුණු වීම් වලදි වැඩ මුළු වලදි ලබා දි ඇති මේ තාක්ෂණ මෙවලම් පිළිබඳ පුහුණුව. විශේෂයෙන්ම මහජනතාව සමඟ ගැටෙන අංශ පවා. වරිපණම් , කඩකුලි. ආදියේ යම් යම් දෝෂ තිබෙන අවස්ථා ඇත. මේවායේ පවා මුදල් ගෙවිමේ කුවිතාන්සිවල විශාල අඩු පාඩු තිබෙනවා. මා ඒවා පෙන්වා දෙන්නම්.අප ආයතනයෙන් පිටත යන්නේ මේ ලියකියවිලි. එම නිසා තාක්ෂණ දැනුම තිබෙන , උපදෙස් දිය හැකි පළාත් පාලන හරි යම් පිටස්තර මුදල් ගෙවා හරි නිලධාරියෙකු ගෙන්වා සවස 3න් පසු මහා ලොකු රාජකාරියක් සිදු කෙරෙන්නේ නැහැ. 3ත් 4ත් අතර පැයක පමණ කාලයක එම විෂය පිළිබඳ පුහුණුව ලබා දි මෙය යවත්කාලින කරන්න. සභාවක් විදියට නිලධාරින් තාක්ෂන මෙවලම් ඉල්ලන්නේ මොනවාද ඒ දේ ලබා දි තිබෙනවා. ඉන් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. මහජනතාවට ඉන් ප්‍රතිලාභ ලැබෙන්නේ නැතිනම්. මේ ලිපියේ සඳහන් සියළු දේ සත්‍යයකි. ඉතාම ස්වල්ප නිලධාරින් පිරිසක් පමණයි එයට අනුගත වී එය සිදු කරනු ලබන්නේ.නොදන්නවා වෙන්නත් පුළුවනි. හැබැයි සමහරු උවමනාවෙන්ම මෙය මඟ හරිනවා විය හැකියි.එහෙම වෙන්න බැහැ ආයතන වල. මේ සියළු දෙනාට පොදු විය යුතුයි. මෙය නැහැ කියන එක මා සොයා බැලුවිට මට දැන ගන්නට ලැබුණා. යම් වයස් සිමාවක් පසුකර පැමිනි නිලධාරින්. මේ අය පාසල් යන කාලයේදි මේ මෙවලම් භාවිතා කර නැහැ. ඉගෙන ගෙන නැහැ. ඉගෙන ගත්තාට මාස 3-4 ක් පමණ කාලයක් තමයි ඉගෙන ගෙන තිබෙන්නේ. ඒ අය දන්නවා කියන එක විශ්වාස කරන්න බැහැ. ඒ අයට අමතක විම් විමට පුළුවනි. පරිගණක වැඩ සටහන් සාදා දුන්නාත් ඔවුන්ට එතැනින් එහාට යාමට නොහැකිය. එ දැනුම නැහැ. ඒසේ සිදුවන අවස්ථා තිබෙනවා. මොකද ඔවුන් පාසල් වලින් මෙය ඉගෙන ගත්තා නෙමේ.තාවකාලික මාස 3 -4 ක පුහුණුවක් ලබා තමයි මෙම ආයතනයට එන්නේ. මේ විෂයටත් අලුත් විය හැකියි ඒ නිලධාරිතුමිය.අඩුම වශයෙන් මාස 3ක වත් පුහුණුවක් ලබා දී නිලධාරින්ට මෙය යාවත්කාලින කරන ලෙස ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කර කරුණ පිළිබඳව මාත් කතා කළ යුතුයි.පසුගිය දිනවල සභා වාර්තා ලබා දීමේදි සභා වාර්තා සකස් කරන නිලධාරි මහත්මිය සැහෙන අපහසුතාවයට පත් වුණා. මොකද සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා දන්වා ඇති ආකාරයට පසුගිය සභාවලදි අනවශ්‍ය දේවල් කතා බහ වුවා. ඒවා සභා වාර්තාව තුළ වාර්තා කිරිමට යාම නිසා තමයි වාර්තාවේ පිටු වැඩි වි ඇත්තේ. ගරු මන්ත්‍රිවරු 21 ක් සිටිනවා. සභාවේ අනවශ්‍ය සියළු දේවල් කතා කිරිම නිසා තමයි මේ තත්වය උදා වි ඇත්තේ. අත්‍යවශ්‍ය දේවල් පමණක් සභා වාර්තාවේ ඇතුළත් විය යුතුය යන්න මාගේ මතයයි. සභාවට ලිපි ඉදිරිපත් කිරිමේදි දින වකවානුවක් තබා ගත යුතුයි. සභාව දිනයේදිත් සමහර නිලධාරි මහත්ම මහත්මින් ලිපි ඉදිරිපත් කරනවා. සභාවට දින වකවනු තුල ලිපි ඉදිරිපත් කිරිමට නිත්‍යානුකුලව කටයුතු සිදු කරන ලෙස මා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ උපදෙස් අනුව කටයුතු සිදු කිරිමට ලේකම්තුමියට බලය පවරා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

කියන දේවල් සත්‍ය වුණත් නගර සභාව කිසිම දිනක නීත්‍යානුකූල නොවන විදියට වැඩ කටයුතු සිදු කර නැහැ. සහකාර පලාත් පාලන කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති සියළු දේවල් සත්‍ය ලෙස පිලිගැනිමට අපිට බැහැ. අපි මේ සභාවට පැමිණ කතා කරනු ලබන්නේ ජනතාවගේ දේවල්. එහෙත් මෙහිදි මේ සභා වාර්තාව විශාල වැඩියි . එය කෙටි කරන්න කියා එසේ තින්දු කිරිමට නොහැකියි. අප සියළුදෙනාම කතා කරනු ලබන්නේ මහජනතාවගේ කරුණුයි. එම නිසා මෙය කෙටිකරන්න කියන එක ඉතාම අසාධාරණයි. එහෙම කරන්න දෙන්න බැහැ. එහෙනම් මේ සභාව තබන්නේ නැතිව කොමසාරිස්තුමියට දිය යුතුයි මේ පාලනය. එහෙනම් මේ නගර සභාවක් අවශ්‍ය වන්නේ නැහැ. එයට මා එකඟ වන්නේ නැහැ. නිත්‍යානුකූල විය යුතු බවට නම් එකඟයි. නිත්‍යානුකූල නොවන විදියට වැඩ කර නැහැ. අනවශ්‍ය විදියට මේ සභාවට ඇඟිලි ගැසිමට නම් ඉඩ දෙන්න බැහැ. මෙය මීට කලින් ආවේ නැහැ. අපි මේ ගරු සභාව වසර 20ක් විතර නියෝජනය කලානේ. දැන් ඕක ආවේ කොහොමද ? දැන් මෙතෙක් කල් අපි තීරණය කලානේ. මේ වසර ගණනක් ගියපසු මේ මෑතකදි තමයි ඔවැනි ලිපි එවන්නේ.ඔබතුමා මේ ගරු සභාවේ 4 වතාවක් ගරු සභාපතිවරයා වශයෙන් කටයුතු කළා. නිත්‍යානුකූල නොවන අසාධාරණ ලෙස කටයුතු සිදු කළේ නැහැ. අනවශ්‍ය විදියට ජනතාවගේ මුදල් වෙන විදියට වැඩ කළේ නැහැ. නිත්‍යානුකූල වුණාට කමක් නැහැ. අනවශ්‍ය විදියට මේ ගරු සභාවේ මන්ත්‍රිවරුන්ගේ අයිතිවාසිකම් උදුරා ගන්න දෙන්න බැහැ. එය මා දැඩි පිළිකුලෙන් හෙලා දකිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, දැන් මේ අත්‍යවශ්‍යයි කියා එතුමිය විසින් නිර්වචනය කර ඇති දෙය තීරණය කරනු ලබන්නේ කවුද ? මා කියනා දෙය අත්‍යවශ්‍ය නම් එය කොහොමද අත්‍යවශ්‍ය වන්නේ නැහැ කියා පවසන්නේ. මා ප්‍රකාශ කරන දෙය මට අත්‍යවශ්‍යයි. එය කාටවත් වලකන්න බැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා . ඇත්තටම දැන් සියළු ගරු මන්ත්‍රිවරු සියළු දෙනාගේ අදහස් සාධාරණ ලෙස අපි අහුම්කන් දි තිබෙනවා. මෙහිදි අපි දැකිය යුත්තේ කියන දෙය ගැන නෙමේ . වාර්තා කිරිමේදි .එතුමිය ප්‍රකාශ කර ඇත්තේ වාර්තා කරන එක කෙටියෙන් කරන ලෙසයි.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

අපි මොනවා හරි දෙයක් ප්‍රකාශ කරන්නේ අපගේ ගමට අත්‍යවශ්‍ය දෙයක් නිසා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි වෙනසක් කරන්න යන්නේ නැහැ. මේ යනවිදියට කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

දෙවැනි කාරණය අර තොරතුරු තාක්ෂණය.තාක්ෂණය පිළිබඳ නිපුනත්වය ඇති අය අපගේ ගමේ ඕන තරම් සිටිනවා. මා හිතන්නේ ඔවුන් ස්වේච්ජාවෙන් පැමිණ අපේ නිලධාරින් දැනුවත් කිරිමට යොදා ගත හැකියි. එහෙම දින කිහිපයක් ඔවුන් ගෙන්වා දැනුවත් කිරිම කළ හැකියි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එතුමා ඒ පිළිබඳව දැන්විමට කලින් අපි වයඹ සංවර්ධනයෙන් ගෙන්වා එම නිලධාරින්ට පුහුණු කරනු ලැබුවේ. නමුත් නිලධාරින්ට පුරුදු පුහුණු කළාට නිලධාරින් ස්ථාන මාරු ගෙන වසර 5ක් ගිය පසු මේ ආයතනයේ සිටින්නේ නැහැ. එයයි මේ සඳහා මුලික ගැටළුව වි ඇත්තේ. හැමදාම මෙයට පැමිණෙන නිලධාරියෙකුට මෙය පුහුණු කළ යුතුයි. මෙය අපි පුහුණු කළා. මේ සඳහා මුදල් පවා ගෙව්වා. රු.80000/= ක පමණ මුදලක් ගෙව්වා. එම මුදල් ගෙවා තමයි ඔය තත්වයට ගෙන එනු ලැබුවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, වයඹ ආයතනයෙන් නිරන්තරයෙන් ගෙන්වා ගත හැකිය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ අය දැනට ප්‍රකාශ කර සිටිනවා. නැවතත් පැමිණ අලුත් නිලධාරින්ට මෙය පුරුදු පුහුණු කිරිමට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, සහකාර පළාත් පාලන කොමසාරිස්තුමියට නියෝගයක් හෝ උපදෙසක් මේ ගරු සභාවට දිය නොහැකියි. එය ගරු මන්ත්‍රිවරුන්ගේ අයිතියකි. ආඥා පණත් අනුව එතුමියට එහෙම අයිතියක් නැහැ. ගරු මන්ත්‍රිවරු පෙනි සිටින්නේ මේ මහජනතාව වෙනුවෙනි. මහජනතාව වෙනුවෙන් පෙනි සිටින ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස් කෙටි කරන්න කියන්න අයිතියක් නැහැ. මේ නිතිය පළාත් සභාවටත් පොදුයි. පාර්ලිමේන්තුවටත් පොදුයි.මෙයට එහෙම බලපෑමක් කරන්න කිසිම අයිතියක් නැහැ.ඔබතුමා එතුමිය විසින් එවන ලද ලිපියේ පිටපත් ගරු මන්ත්‍රිවරුන්ට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රිවරු තම ගමේ ජනතාවගේ යම් ප්‍රශ්නයක් සභාවට ඉදිරිපත් කරන විට එය කෙටි කරන ලෙස ප්‍රකාශ කිරිමට සහකාර කොමසාරිස්තුමියට නෙමේ කොමසාරිස්තුමාටත් අයිතියක් නැහැ.පළාත් පාලන ලේකම්තුමාටත් අයිතියක් නැහැ. එහෙම වුණොත් අපිට උසාවියට වුණත් යා හැකියි ඊට විරුද්ධව. පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. මෙය නගරයේ. අපි නියෝජනය කරනු ලබන්නේ අම්බලන්ගොඩ නගරයේ ජනතාවයි. එතුමිය විසින් එවන ලද ලිපියට නටන්න අපි කිසිම කෙනෙකු සූදානම් නැහැ. ගරු මන්ත්‍රිවරුන්ට අයිතියක් තිබෙනවා තම නගරයේ දකින්න තිබෙන දේ , කළ යුතු දේ ගැන අදහස් හා යෝජනා ඉදිරිපත් කිරිමට. එම අදහස් වාර්තා කිරිමට ඔබතුමා ලේකම්තුමිය ඇතුළු සියළු දෙනා බැඳී සිටි. එය කපා කොටා ඉවත් කරන්න බැහැ. එසේ සිදුවුවහොත් ඊට විරුද්ධව ක්‍රියා මාර්ග ගැනිමට අපි පෙළඹෙනවා.ගරු සභාවේ පළාත් පාලන කොමසාරිස්තුමිය විසින් එවන ලද ලිපියට ගරු මන්ත්‍රිවරු කිසිම කෙනෙකු එකඟ නැහැ. ගරු මන්ත්‍රිවරයෙකුට අයිතියක් තිබෙනවා. එය නගර සභාවද , පලාත් සභාවද , පාර්ලිමේන්තුවද කියා නැහැ.මෙසේ කටයුතු සිදු නොකරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

මේ කොමසාරිස්තුමියගේ ලිපියට අනුව සමහර විට ඔබතුමාත් , ගරු මන්ත්‍රිවරු අප සියළු දෙනාම අපහසුතාවයට ලක් වෙන්න පුළුවනි. අනවශ්‍ය දේවල් මෙහි කතා කෙරෙන්නේ නැහැ. යම්කිසි පුද්ගලයෙකු මා බොරුවක් ප්‍රකාශ කළා කියා කිව්වොත් එය නිවැරදිව පෙන්විමට ඇති එකම සාක්ෂිය මේ වාර්තාව පමණකි. මහජන නියෝජිතයන් හැටියට ගමේ සමහර පුද්ගලයින් යම් ප්‍රශ්නයකදි අපෙන් විමසා සිටිනවා ඔබතුමා මේ ගැන ප්‍රකාශ කළේ කුමක්ද කියා. අපිට පෙන්වීමට ඇත්තේ සභා වාර්තාව. ඔබතුමාටත් එය සිදු වි තිබෙනවා. ඔබතුමා යම් දෙයක් ගැන කතා කළා කියා ප්‍රචාරයක් යනවා නම් ඔබතුමාටත් පෙන්විමට ඇත්තේ සභා වාර්තාව පමණකි.මේ සඳහා අප සැමදෙනාම විරුද්ධයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මේ සඳහා කලින් පරිදි ගතයුතු හොඳ දේවල් ගෙන නැතිදේවල් බැහැර කරන්න.

**තීරණය**

පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් 2019.03.26 දින එවන ලද ලිපියේ සඳහන් කාර්යාල පරික්ෂණ වර්තා - සභා රැස්වීම් , ගෙවීම් වවුචර් , ආදායම් පිළිබඳව ඉදිරිපත්කරන ලද ලිපිය සම්බන්ධයෙන් ගරු සභාවේ මන්ත්‍රිවරුන් විසින් තමාට සභාවේ තමා අදහස් දැක්වීම ගරු මන්ත්‍රිවරුන්ගේ අයිතියක් බවත් , පිළිබඳව මහජනතාවට ඉදිරිපත් කිරිමට ඇති එකම සාක්ෂිය සභා වාර්තාව බැවින් ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එවන ලද ලිපියට විරුද්ධ අදහස් දැක්වූ අතර එහි කලින් සිදුකර ආකාරයට ගතයුතු හොඳ කාර්යයන් ගෙන අනෙක් කාර්යයන් බැහැර කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

**03.10 2019 අයවැය ලේඛණයේ ඉදිරි කටයුතු සිදු කිරිම සඳහා විෂය ලිපිකරු විසින් වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 අයවැය ලේඛණය සකස් කිරිමට අවශ්‍ය ඇත. ඒ සඳහා වර්ණ ජායා රූප මුද්‍රණය කිරිමට අවශ්‍ය වන බැවින් ඒ සඳහා වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් ලබා ගැනිමට ගරු සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා .

**තීරණය**

විෂය ලිපිකරු විසින් ඉල්ලීම් කර ඇති බැවින් 2019 අයවැය ලේඛනය සකස් කිරිම සඳහා අවශ්‍යවන වර්ණ මුද්‍රණය යන්ත්‍රයක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

**03.11 බස්නැවතුම්පොළ වෙළඳ සංකිර්ණයේ කඩ කාමර හිමියන් විසින් කරන ලද ඉල්ලිමට අනුව යතුරු පැදි නවතා තැබිමේ ස්ථානය සඳහා ඔවුන්ගේ යතුරුපැදි සඳහා වෙනත් ස්ටිකරයක් නිකුත් කිරිම සඳහා ස්ටිකර් මුද්‍රණය කර ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බස්නැවතුම්පොළ වෙළඳ සංගමය විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත. වෙළඳසැල් හිමියන්ගේ වාහන නතර කර ගැනිමට ස්ථානයක් ලබා ගැනිමට. අද දින අප වෙළඳසැල් හිමියන් හා කළ සාකච්ඡාව අදවැනි දිනක වැදගත් වන අතර ඔබතුමා අපහට ලබා දුන් සහාය පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.ඔබතුමා පෙන්වා දුන් පරිදි බස්නැවතුම්පොළේ කොළඹ පැත්තට වන්නට කුලි ත්‍රිරෝද රථ නතර කරන තැන යතුරු පැදි 20කට වැඩි ප්‍රමාණයක් ගල් කිරිමට ප්‍රමාණවත් වේ. සැහෙන කලක සිට අපට අවශ්‍යව තිබු අවශ්‍යතාවයක් ඉටු කිරිම ගැන නැවතත් බස්නැවතුම්පොළ වෙළඳ සංගමයේ ස්තුතිය පුදකරනවා. මෙහි කඩහිමියන්ගේ නම් සහ යතුරුපැදි අංක අත්සන් ලේඛණයක් ඉදිරිපත් කර ඇත. මේ අනුව අලුතින් ඇතිවූ රටේ ආරක්ෂක තත්වය මත බස්නැවතුම්පොළ ඉදිරිපිට නතර කරන වාහන ඉවත් කිරිමට සිද්ධ වුණා. ඒ ඉවත් කිරිම මත බස්නැවතුම්පොළ වාහන හිමියන්ගේ වාහනත් එතැන තිබෙනවා.එම ප්‍රජාවගේ වාහන නතර කර දිමට ස්ථානයක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියා. කොළඹ පැත්තේ ත්‍රිවිල් පාක් එකට පිටුපසින් සහ එම ස්ථානය වෙන්කර දුන්නා ඔවුන්ගේ වාහන නතර කරදිමට.එතැන දැන් කොටුකර සාදා දිය යුතුයි. ඒ අය එම කඩේ නමත් සහ අංක සමඟ ලිපියක් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව පොලිසියට අප විසින් දන්වා ඇත.අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ තුළට ඇතුල්වන එම කඩහිමියන්ගේ වාහන සඳහා අප ස්ටිකර් එකක් මුද්‍රණය කර දිමට තීරණය කළා. එම ස්ටිකරය මුද්‍රණය කර දිම සඳහාත් එව වෙළඳසැල්හිමියන්ගේ වාහන නතර කරන ස්ථානය කොටු කර දීමටත් සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ ලිපිය පරිදි ස්ටිකරයක් මුද්‍රණය කිරිමට තමයි පේන විදියට අවසර ඉල්ලා ඇත්තේ.නමුත් බස්නැවතුම්පොළ ගතහොත් සරසවි හංදියෙත් වෙළඳ සංකිර්ණයක් තිබෙනවා.අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේත් එකක් තිබෙනවා. දැන් ඉදිරිපස ගැසිමට බැහැ. එක හරි.අපි මෙය හදනවාට විරුද්ධතාවයක් නැහැ. නමුත් බස්නැවතුම්පොළේ කඩ කාමර බද්ද ගෙවනු ලබන්නේ රු.60000/, රු.70000/= හා රු.100000/= පමණ මුදලකිනි. එම ස්ථානය ලබා දුන්නාට කමක් නැහැ. වියදම කොපමණ මුදලක් යනවාද කියා දන්නේ නැහැ. එම ස්ථානය කොටුකිරිමට යන මුදල අයකර එය සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා. කඩ කාමර සඳහා ගෙවනු ලබන මුදල බැලුවිට අයිතිකරුවන්ට පුළුවනි මෙය සාදා ගන්න. සැමදෙයක්ම බලාපොරොත්තු වෙනවා නගර සභාවෙන්. නගර සභාවේ කාණු පද්ධතිය ගත් විට සම්පූර්ණයෙන්ම අබලන්. දැන් ඩෙංගු උවදුර තිබෙනවා. ඒවාට පුමුඛතාවය දක්වා විශාල වශයෙන් මෙවාට වියදම් කිරිමට සිදුවෙනවා . එවා ලබා දි මෙය සිදු කරන්න. විශාල වශයෙන් මුදල් යනවාද කියා දන්නේ නැහැ. ඇස්තමේන්තුවක් නැති නිසා. ඒ අයගෙන් මුදල් අයකර මෙය සකසා දෙනලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙහි පොඩි ප්‍රශ්නයක් මතුවෙනවා. මෙම රථනතර කිරිමට එම ස්ථානය දුන්නාට කමක් නැහැ. කලින් ඔය වම්පැත්තේ ආරම්භයේදි ත්‍රීරෝද රථ නතර කරන ස්ථානය පැවතුනා. පොලිසියේදි ප්‍රශ්න ඇති වුනේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියත් සමඟ. බොහෝ වේලාවට බස්රථ සඳහා රක්ෂණ ආවරණ නැහැ. මේ ඇතුලේ යම්කිසි අනතුරක් සිදුවුවහොත් විශාල ප්‍රශ්නයකට මුහුණ පැමට ලක්වෙනවා. අපි නිත්‍යානුකූල බැඳීමකට ලක්වෙනවාද කියා . ඒ අය ඇතුලේ ගමන් කරන්නේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහිදි අපි බස්නැවතුම්පොළ ඇතුලේ යාමට නෙමේ මෙය සකස් කරනු ලබන්නේ. මෙය හැටන් නැෂනල් බැංකුව අසළ ඇති මාර්ගයෙන් තමයි ඇතුල්වීමට ගේට්ටුව දමනු ලබන්නේ. එවිට බස්නැවතුම ඇතුළෙන් යතුරුපැදි ගමන් කිරිමට කොහෙත්ම අවශ්‍ය වන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එය හොඳයි. නගර සභාව මෙම වගකිමෙන් ඇත්වි කටයුතු කරන ලෙස ඉල්ලා සිටින්නේ. මොකද බස්රථ සඳහා රක්ෂණ නැහැ. බස්නැවතුම්පොළ ඇතුලේ අනතුරක් සිදු වුවහොත් මොකක්ද නිතිමය තත්වය කියන එක මෙන්ම මොකක්ද ඇති වන තත්වය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ අයට ඇතුළට වාහන ගන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

එසේ නම් බ ස්නැවතුම්පොළ ඇතුළෙන් සම්පුර්ණයෙන්ම වැසිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සම්පුර්ණයෙන්ම වසනවා. බස්නැවතුම්පොළ පැත්තෙන් වාහන ඇතුල් කරන්න බැහැ. මා සිතන්නේ එහෙම තැනක් සාදා දෙන එක අපේ යුතුකමක් හා වගකිමකි. එම වෙළඳසැල් වලින් අපිට මුදල් ලැබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එසේ කරන එක හොඳයි. උදේ පාන්දර රැකියාවල් වලට යන පිරිසත් බස්නැවතුම්පොළේ යතුරුපැදි දමා යනවා. උදේ 5.00 ට පමණ දමාගොස් රාත්‍රි 8.00 ට පමණ තමයි යතුරු පැදිය ගනු ලබන්නේ. එමනිසා බස්නැවතුම්පොළේ ව්‍යාපාරිකයන්ගේ යතුරුපැදි නැවතිමට තැනක් නැහැ. වෙළෙඳසැල්වලට පැමිණෙන පාරිභෝගිකයන්ගේ වාහන නැවැත්වීමටත් ඉඩක් නැහැ. එම නිසා මෙම කාර්ය ඉටු කිරිම ඉතා හොඳයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කර ආකාරයට මෙම කඩ බදු දි ඇත්තේ ඉතා අඩු මුදලකටයි. අඩු මුදලකට අපි මෙම කඩ කාමර බදු දි තිබුණත් ඔවුන් විසින් තවත් අයට වැඩි මුදලකට මෙම කඩ කාමර දි ඇත. මසකට රු.50000/= , රු.75000/=. රු.100000/= වැඩි මුදලකට මෙය ලබා දී ඇත. එහෙම දි තිබෙනවා නම් වෙළෙඳ සංගමයකුත් තිබෙනවා නම් ඇස්තමේන්තු මුදලකුත් නැහැ. මේ සඳහා යන වියදමකුත් නැහැ. දැන් මෙය අනුමත කරනු ලැබුවොත් ඊළඟ සභාවට රු.700000/= ක මුදලක් යන බව පවසා ඇස්තමේන්තුව ඉදිරිපත් කළහොත් ඒ පව අපට ගන්න බැහැ. වෙළඳ සංගමයක් තිබෙනවා. භූමිය අපේ ලබා දෙන්න. අපි මේ කටයුත්ත අධික්ෂණය කරන්න. ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට පිටු පස ගේට්ටුවෙන් වාහන ඇතුල් කරන්න කියන්න. ආරක්ෂාව තහවුරු කළ යුතුයි. අපි පහසුකම් සපයා දිය යුතුයි. නගර සභා මුදල් වලින් මෙය ඉදිකරනවාට අපි විරුද්ධයි. මොකද රු8000/= ,

රු.15000/= ගත් කඩය දෙනු ලබන්නේ රු.75000/= ක මුදලකට පමණ තමයි ඔය වෙළඳසැල දෙනු ලබන්නේ. එම නිසා වෙළඳ සංගමයට එම කාර්ය කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඇස්තමේන්තුවක් සැදූවාද මේ සඳහා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

මේ සභාවේ නෙමේ කලින් සභාවේ මෙය කතා කළා. මේ අයට රථගාලක් ලබා දෙන්න කතා වුණා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

රථගාලක් ලබා දෙන්න කතා වුණාට නගර සභා මුදල් වලින් එය ලබා දෙන්න කවුරුත් කතා වී නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**</u>

නැහැ. නගර සභාවේ මුදල් වලින් නෙමේ. සභාවේ අනුමතිය ආවා. මෙහි යතුරුපැදි නතර කිරිමට රථගාලක් ඉදිකිරිමට අවසර ලබා දෙන ලෙස.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මේ සඳහා රු.200000/= පමණ ඇස්තමේන්තුවක් ගරු සභාවේ අනුමත කර ඇත.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

අනුමත කරානම් එය අපට පෙන්වන්න කියන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එම ඇස්තමේන්තුව ගෙන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

බඩු ගෙනත් අනුමත කරලත් අවසන් . අපි මෙහි සිටින්නේ අත එසවීමටද ? එහෙමනම් අත ඔසවන්නේ නැහැ. එසේ අත එසවිමට නිකං සුදු ඇඳුම් ඇදගත් ගරු මන්ත්‍රිවරු නෙමේ . වගකිමක් තිබෙනවා ගරු මන්ත්‍රිවරුන්ට . මේ නගරයේ මුදල්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

අපි මේ පිළිබඳව කතා කරනු ලබන්නේ නගර සභාවේ මුදල් ඉතිරි කර ගැනීමටයි. නැතිව නිකන් නගර සභාවේ මුදල් වැය කරන්න නෙමේ. සමහර වෙළෙඳසැල් බදු දී තිබෙන්නේ රු80000/=, රු100000/= මුදලකට. නගර සභාවේ කොච්චර වැඩ තිබෙනවාද ? දැඩිසේ විරුද්ධ වෙන්නේ ඒ නිසයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස ඉතාම වැදගත් . මොකද සභාව පැත්තෙන් බැලුවාම. ඒ හා සමානම මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියත් සමඟ ගිවිසුමක් තිබෙනවා. ඒ ගිවිසුම ප්‍රකාරව අපිට කටයුතු කළ යුතුයි. එමනිසා පුද්ගලික අය විසින් මෙහි ඉදිකිරිම් කිරිමට කළ හැකිද යන්න පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එමනිසා මේ වෙළඳසැල් හිමියන් සමඟ සාකච්ඡා කර ස්වේච්චාවෙන් ඒ අය මේ සඳහා ඉදිරිපත් වෙනවා නම් ඒ අනුව කටයුතු කරන්න. මේ ගිවිසුම අනුව ගරු මන්ත්‍රිවරු කියන ආකාරයට කර ගැනීමට හැකිද කියා සොයා බැලිය යුතුයි. එවිට මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය හා අප අතරයි මේ කාර්ය සිදු විය යුත්තේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා සියළු ගරු මන්ත්‍රිවරුන්ට කියා සිටින්නේ මෙවැනි අවස්ථාවක මේ කටයුත්ත කිරිමට කාටවත් පවරන්න බැහැ. මෙය නගර සභාවේ වගකිමකි. නගර සභාව විසින් මෙහි කඩ 62 ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. එම 62 තුළ යම්කිසි මුදලක් ගරු සභාව විසින් ගනු ලබනවා. එම ගන්නා ලද අවස්ථාවේ මෙවැනි පහසුකමක් හා ආරක්ෂාව සපයා දිය යුතුයි. එහෙම නැතිනම් සභාව විසින් ගන්නා ලද තින්දුව අනුව හෙට දිනයේ සිට මෙහි වාහන ගාල් කිරිමට ඉඩ දෙනවා. හැබැයි මෙහි වගකීම ගන්න මේ සඳහා විරුද්ධ වු සියළු ගරු මන්ත්‍රිවරුන් සියළු දෙනාම.

**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපි කියන්නේ එය නෙමේ.

**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමාට එහෙම කියන්න අයිතියක් නැහැ. මෙහි වගකිම ගරු මන්ත්‍රිවරු ගත යුතුයි කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එහෙම කියන්න අයිතියක් තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

එහෙම අපි විරුද්ධ වුණා කියා එසේ කියන්න අයිතියක් කොහොමද තියෙන්නේ. දැන් මේ මා ළඟ තිබෙනවා ඔබතුමා යවන ලද ලිපියක්. අසියානු සංවර්ධන බැංකුවේ ඔය ගොඩනැඟිල්ල ඉදිකිරිමට වැයවු මුදල් තවමත් ගෙවා නැහැ. දැන් ඔබතුමා කියනවා ආදායමක් තියෙනවා කියා. ආදායමක් තිබෙනවානම් මේ මුදල් ගෙවන්න. මෙම මුදල ගෙවා වෙනත් ව්‍යාපෘතියක් කිරිමට වැඩ කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සම්පුර්ණ මුදල ගෙවා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

එහෙනම් ඇයි ගෙවා නැති බව පවසන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගෙවිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ  මහතා කතා කරමින්**

අපි කියන්නේ මේ නගර සභාවේ මුදල් වැදගත් දේවල් වලට යොදවන්න. මේ මහජන ක්‍රිඩාංගණය සැදිය යුතුයි. දැන් මේ මාස ගණනක් තිස්සේ කියනවා මේ ක්‍රිඩාංගණය සාදා නිමකරන්න කියා. කාටත් පොදුයි පිට්ටනිය. ඒ සඳහා මුදල් වියදම් කරන්නේ නැතිව මේ එක් එක් පොඩි පොඩි දේවල් වලට මුදල් වියදම් කරනවා. මේ පිට්ටනිය සාදන්න. අපි සියළු දෙනා මෙයට වගකිව යුතුයි. අපි ප්‍රකාශ කරන්නේ නගර සභාව සතු මිදුල් නගරයේ ප්‍රමුඛතාවයන්ට වියදම් කරන්න. වැඩ කරන්න එපා කියා කිසිම දිනක ඔබතුමාට අකුල් හෙලා නැහැ. අපි උදවු කරනවා.ඔබතුමා ඔය විදියට ක්‍රියා කරනවා නම් අපිටත් යම්කිසි මඟවල් තිබෙනවා. අපිත් ඒ විදියට එළෙඹෙනවා. මේ සභාව ගරු විපක්ෂ මන්ත්‍රිවරුන්ටත් කන්දිමට පුරුදු වන්න. එහෙම එනවා නම් කොහොමද? එවිට මේ ගරු මන්ත්‍රිවරු කවුද ? එහෙම දෙන්න බැහැ. සාධාරණ තින්දු ගන්න. මේ ලිපිය අනුව මිලියන 30 ගණනක් නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිමට තිබෙනවා. ආදායම් තිබෙනවා නම් ගෙවන්න බැරි ඇයි? මේ නගර සභාවෙන් රු.15000/= ගත් කඩය රු.75000/= ට දි තිබෙනවා. ඇයි ඔවුන්ට බැරි මෙය සාදා ගැනිමට. අපේ තාක්ෂණසේවා නිලධාරින්ට අධික්ෂණ කටයුතු කරන්න .  මෙය අනුමත නොකර බඩු ගෙන්නේ කොහොමද ? ඇස්තමේන්තු ඉදිරිපත් කරන්නේ නැතිව බඩු ගෙන්නේ කොහොමද ? ඒවා මින් ඉදිරියට මේ නගර සභාවට ඉදිරිපත් කරන්න එපා. කිසි දෙයකට

අපි අනුමතිය ලබා දෙන්නේ නැහැ. ඔබතුමාලා අනුමත කර ගන්න. ඒවාට ක්‍රියා මාර්ග අපි ගන්නවා. මෙහි සිටින ගරු මන්ත්‍රීවරු තුට්ටුවට දමා වැඩ කරන්න එන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , විපක්ෂනායකතුමා ඉදිරිපත් කරන ලද ඔබතුමාගේ ලිපියේ මා දන්නා කරුණක් ඉදිරිපත් කරනවා. ආසියානු සංවර්ධන ණය මුදලේදිත් මා නියෝජනය කළා. එහි ලක්ෂ 550ක් ලබා ගනු ලැබුවේ ස්ටොන් ව්‍යාපෘතිය සඳහා . එය තමයි අපට හිඟ වුයේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැන් එය ගෙවනවා. දැන් එහි සභාවේ තින්දුවක් තිබෙනවා ගෙවන්න එපා කියා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ආසියානු සංවර්ධන ව්‍යාපෘතියේ ණය මුදල ගෙවීමට සභාවේ තින්දුවක් ගනු ලැබුවා

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපි එය ඒ විෂයේදි කතා කරන්න. මෙහිදි දකින්නේ පසුගිය කාලයේ අප්‍රේල් මස 21 න් පසු ව තමයි තින්දු ගැනිමට සිදු වුයේ. ඉන් පසුවයි මේ තත්වය ඇතිවුයේ. ඒ අවස්ථානුකුලව තමයි මෙය සිදු කර ඇත්තේ. මෙය ගරු මන්ත්‍රිවරු අවශ්‍යා නැහැ කියා ප්‍රකාශ කරනවා නම් එය සිදු කරන්නේ නැහැ. මගේ නම් බස්නැවතුම්පොළේ නම් වෙළඳසැලක් නැහැ. මා හෙට දිනයේ සිට පරණ ක්‍රමයට කරන්න කියන්නම්. එහි ප්‍රශ්නයක් නැහැ. අපි ජනතාව වෙනුවෙනුයි මේ තින්දු ගනු ලබන්නේ . එය ඔබතුමාලා තේරුම් ගත යුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අපි කියන්නේ එය නෙමේ . ඔබතුමාට බැරි ඇයි ඒ මුදල අයකර ගැනිමට නොහැකි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මේ අවස්ථාවේදි අපේ වගකිමක් නැද්ද නගරය ආරක්ෂා කිරිමට

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඔබතුමා හදන්නේ අපි බිය ගන්වා වැඩ කිරිමට . එහෙම හරියන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඔබතුමා හිය කරන්න කිසිම උවමනාවක් නැහැ. ඔයා කවුද ? කාටවත් උවමනා නැහැ ඔයා භිය කරවිමට. මා එක්කෙනෙකුටවත් භිය නැහැ. මා කරනු ලබන්නේ නැවැරදි දේ පමණි. කාටවත් කැගැසුවා කියා මා වැඩ කරන එක නවත් වන්නේ නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මේ සභාව මෙවැනි තත්වයකට පත්විය යුතු නැහැ. පසුගිය 21 ඇතිවු තත්වය සමඟ ගරු සභාපතිතුමාට යම් යම් තින්දු තීරණ ගන්න වුණා. ගරු මන්ත්‍රිවරු රැස් නොකළත් ආරක්ෂක කමිටු කැඳවා ඒ අනුව තමයි. මා හිතන්නේ විපක්ෂ නායකතුමාත් සහභාගි වුණානේද? ඒ සඳහා ඔබතුමලා ගනු ලැබු තින්දු තමයි. මා නම් සහභාගි වුයේ නැහැ. ගරු සභාපතිතුමා , ගරු හිටපු ප්‍රධාන අමාත්‍යතුමා, ඔබතුමාත් සහභාගි වුණා. ඒ අනුන ගනු ලැබු තින්දු අනුව නගරය පාලනය කරන ප්‍රධාන පුරවැසියා ලෙස ගරු සභාපතිතුමාට අයිතියක් තිබෙනවා.එයට ගරු මන්ත්‍රිවරු සහායෝගය දිය යුතුයි. මේ නගරයේ තිබෙන විශාලතම වැදගත්ම ස්ථානයක් තමයි මේ. දිනකට 50000 ක පමණ ප්‍රමාණයක් එකරැස්වන ස්ථානයකි මෙය. මෙහි යම්කිසි සිද්ධියක් ඇතිවුවහොත් එහි වගකිම එන්නේ නගර සභාවට. මෙය ගරු සභාපතිතුමාටවත් මෙහි සිටින ගරු මන්ත්‍රිවරුන්ටවත් පැහැර හැරිය නොහැකිය. එම වගකිම අනිවාර්යෙන්ම නගර සභාව ගත යුතු වෙනවා.

නමුත් තාක්ෂණසේවා නිලධාරිතුමා දන්වා සිටියා මෙය අනුමත කළ බවට. මේ අනුමත දෙයක් පිළිබඳ මේ සිද්ධියට වියදම් වුණා කියා මෙය සභාවට කළයුතු දෙයකි. ගරු සභාපතිතුමනි, මෙය වගකීමක් ගතයුතු ස්ථානයකි. එය කිසිම කෙනෙකුට පැහැර හැරිය නොහැකිය. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාත් මේ නගරයේ වගකීමක් දරන පුද්ගලයෙකි. ඔබතුමා තමයි සහභාගි වුයේ. අපි සහභාගි වුයේ නැහැ කමිටු වලට. ඒ කමිටු තීරණ අනුව තමයි ගරු සභාපතිතුමා කටයුතු කරනු ලැබුවේ. මෙයට වාද විවාද ගතයුතු නැහැ. මෙය නගරයේ තිබෙන ප්‍රධාන තැනකි. මෙය නිත්‍යානුකූල විදියට කටයුතු කරන්න. ඔබතුමාට මෙහිදි තින්දුවක් ගත හැකිය.ගරු සභාපතිවරයා වශයෙන් මේ ස්ථානය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මේ සඳහා වාද විවාද මෙවැනි පොඩි දෙයකට ඇතිකර ගත යුතු නැහැ. මෙය මාගේ වත් ගරු සභාපතිතුමාගේ වත් දෙයක් නෙමේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළේ කඩහිමියන් විසින් නගර සභාවට යම්කිසි මුදලක් ගෙවනවා. ඒ අය ප්‍රකාශ කර සිටියොත් අපට දැන් වාහන නතර කරන ස්ථානය නැති වුණා.නගර සභාවේ වගකීමක් තමයි ඔවුන්ට වාහන නතර කිරිමට ස්ථානයක් සකස් කර දිම.මෙය අප්‍රේල් මස 21 දා ඇතිවූ තත්වය මත ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් මිසක් හිතා මතා ඔබතුමා ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් නෙමේ මෙය. ක්‍රිඩා පිටියේ වැඩ කටයුතු ඒ අකාරයෙන් සිදු වෙනවා. ක්‍රිඩා පිටියට මේ මුදල් ක්ෂණිකව වියදම් කළ නොහැකිය. මේ ඇති වූ තත්වය සමඟයි මෙය සිදු වුයේ. නැතිනම් වෙළඳ ව්‍යාපාරිකයන්ට ඒ අය කලින් වාහන නතර කරන ලද ස්ථානය ලබා දිය යුතුයි. ඒ අයගෙන් මුදල් ලබා ගන්නවානම් අපට වගකීමක් තිබෙනවා එම ස්ථානයක් සකසා දෙන්න.එහෙම නොවුණොත් ඔවුන් මැසිවිලි නගනුයේ නගර සභාවට. දැනටත් මෙය අයින් කරපු නිසා එම ස්ථානයට පාරිභෝගියන් යන්නේ නැහැ. මේ නිසා ඔවුන්ට පාඩුවක් සිදුවි තිබෙනවා. මේ අවස්ථාවේදි එම ක්‍රියා මාර්ගය ගත යුතු වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව පැහැදිලි කිරිමක් කළයුතුව තිබෙනවා. නගර සභාවට බදු ගෙවන මේ වෙළඳසැලවල් තිබෙන්නේ මේ නගර සභාවේ පමණක් නෙමේ. තවත් තියෙනවා. එවිට ඒ අයත් ඉල්ලා සිටියහොත් අපේ වාහනය නතර කිරිමට ස්ථානයක් ලබා දෙන ලෙස. අපි වගකීමෙන් බැදී සිටිනවා. අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ කියන්නේ වෙනත් තැන්වල වගේ විශාල භූමියක් නෙමේ. එහි සීමිත ඉඩකඩක් තිබෙන්නේ. මේ සීමිත ඉඩකඩ මා දන්නා විදියට කඩ සාප්පු දමා තිබෙනවා. එක එක පාලන වකවානු තුළ එක් පුද්ගලයන්ගේ හිත් සතුටු කර දීමට මේවා ලබා දී තිබෙනවා. නමුත් සිද්ධ විය යුත්තේ එය නෙමේ. රටේ ජනතාව ඉතා විශාල කැපකිරිමක් කරන මේ වෙලාවේ කඩ හිමියනුත් කැපකිරිමක් කළ යුතු වෙනවා රටේ ආරක්ෂාව වෙනුවෙන්. මෙතැන කලබල අපිට වෙනම තැනක් හදන්න ඕනා. තව කට්ටියක් කියනවා අපිට වෙනම තැනක් සැදිය යුතුයි. නගර සභාව මඟින් . මේ විදියට ගියහොත් නගර සභාවට ඔය ආරක්ෂිත ස්ථාන හද හදා ඉන්නවාට වඩා කරන්න වැඩක් නැතිවෙනවා. රටේ තත්වය ගැන සලකා බලා සුදුසු තැනක තම වාහනය නතර කර පැමිණ වෙළඳාමක් කළ යුතුයි. හැම වෙළඳසැලවල් වලට වාහන නතර කිරිම සඳහා ස්ථාන සකස් කිරිම නගර සභාවට කලෝචිත නොවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහල මහතාගේ අදහස වුයේ මේ වෙළඳ ව්‍යාපාරිකයන් සමඟ සාකච්ඡා කර බලන ලෙසයි. ඔබතුමා එම වෙළඳ ව්‍යාපාරිකයන් සමඟ සකච්ඡා කර බැලිය යුතුයි . ඔවුන්ට මෙය මගහරවා ගැනිමට අවශ්‍ය නම් නගර සභාව විසින් යුතුකමක් ලෙස මෙය ඉදිකළ යුතුයි. මේ ආරක්ෂක තත්වය යම්කිසි විදියකට සමතයකට පත් වුවහොත් යම් විදියකට මෙය ව්‍යාපාරිකයන්ට ලබා දෙන එක. මේ අවස්ථාවේ ඔවුන්ට හැකවේද ක්‍රියා මේ කාර්ය ඉටු කර ගැනිමට. ඔවුන්ගේ ව්‍යාපාර සියල්ල අඩපණ වී ඇත. ඒ අයට මෙය බැහැකියා ප්‍රකාශ කළහොත් අපි කුමක්ද ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? බැහැයි කියා ප්‍රකාශ කළහොත් අපි මෙය නොකර ඉන්නවාද ? එහෙම නොකර ඉන්න බැහැ. අම්බලන්ගොඩ නගරයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය තමයි අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ . මේ සඳහා ඔවුන් සමඟ සාකච්ඡා කර නගර සභාවට කළහැකි දෙයක් නම් එය ඉටු කරන්න. එසේ නොමැති ව ව්‍යාපාරිකයන්ටත් පාරිභොගිකයන්ටත් අපෙන් සහනයක් සැලසිම අපගේ යුතුකමකි. නගර සභාවේ

යුතුකමකි. මේ ආරක්ෂක තත්වය ගැන සලකා බලන්න. ක්‍රිඩාංගණය ගැන කතා කළහොත් අද උදයේත් ගරු සභාපතිතුමා හා මා ඒ ගැන කතා කළා. මේ වන විටත් එය ක්‍රියාත්මක වෙනවා. මේ සඳහා අපි හදිස්සි වි අපගේ නගර සභාවේ මුදල් වියදම් කිරිම අවශ්‍ය නැහැ. ඒ වැඩය කෙරෙමින් පවතිනවා. එම නිසා එම කාර්ය කිරිමට ඉඩ දෙන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙම ඉඩම දෙනවාට විරුද්ධත්වයක් නැහැ. සභා තීරණයක් ගෙන තිබෙනවානම් එය වෙනස් කිරිමට නොහැකි නිසා ලබා දෙන්න. නැතිනම් ඒ වෙළඳ ප්‍රජාව සමඟ සාකච්ඡා කර බලන්න්න. ඊට පසු  තීරණයක් ගැනිමට පුළුවනි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙවැනි දෙයක් කරන්න සිද්ධ වුණේ අද රටේ ඇතිවී තිබෙන තත්වය මිසක හදිස්සියේ අපේ උනන්දුවට කරන වැඩක් නෙමේ මෙය. අද අපට බස්නැවතුම්පොළේ තිබුණ ගැටළුවක් තමයි උදේ නතර කරනු ලබන යතුරුපැදිය සවස් වනතුරුම නතර කර තැබිම. මෙහිදි මුලිකවම මේ 21වන දින සිදුවූ සිද්ධියෙන් පසු පොලිසිය සමඟ එක්වි මා මුලස්ථාන පොලිස් අධිකාරිතුමාට හා  කොට්ඨාශ භාර පොලිස් අධිකාරිතුමාට දන්වා සිටියා මෙහි දිර්ඝ කාලිනව නතර කරනු ලබන වාහන හඳුනා ගෙන අපේ වාහන මඟින් පොලිසියට භාර දී අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසු අධිකරණයට තම අනන්‍යතාවය තහවුරු කර ලබා ගත යුතු බව. ඒ අනුව අප විසින් දැන්වීම් පල කරන ලදී. පැය 3 කට වැඩිය නතර කර තබන වාහන පොලිසියට භාර දෙන බවට සඳහන් කර . එම පල කිරිමත් සමඟ අපට ගැටළුවක් පැමිණියා මේ වෙළඳසැල් 62 ම හිමිකරුවන් ප්‍රකාශ කළා මෙහි අපගේ වාහන තිබෙනවා. මෙවැනි දෙයක් කළහොත් අපේ වාහන නතර කරන්නේ කොහේද කියා. මේ වෙළඳසැල් හිමියන් විසින් නම, තම වාහන අංකය , දුරකථන අංකය ආදිය පොලිසියට සපයා දී ඇත. මේ යතුරුපැදි හඳුනා ගැනිම සඳහා ස්ටිකර් එකක් නිකුත් කරනු ලබනවා. එම තින්දුවේ අවසරය මත තමයි මේ ලිපිය ඉදිරිපත් කරනු ලැබුවේ. එම ස්ථානයේ නතර කිරිමට දෙන්නේ නැතිනම් අපිට අවස්ථාව තිබිය යුතුයි වෙනත් ස්ථානයක නතර කිරිමට දීමට. මේ නිසා නගරයේ ආරක්ෂාව පිළිබඳ .තින්දුවක් ලබා ගැනීමට බැරි වෙනවා. එම නිසා තමයි මේ කටයුත්ත කරනු ලැබුවේ. අපිට කිසිම උවමනාවක් නැහැ. කලින් තිබුණ පරිදි එහෙම තිබුණට කමක් නැහැ. මේ රටේ උද්ගත වු තත්වය මිසක අලුතින් වාහන නතර කර දීමේ ස්ථානයක් ලබා දිමේ අවශ්‍යතාවයක් නැහැ. ගරු මන්ත්‍රිවරු ප්‍රකාශ කර සිටිනවා නම් මෙය අවශ්‍ය නැහැ කියා කලින් ක්‍රියාත්මක කර විදියටම සිදු කරන්න. යම්කිසි ප්‍රශ්නයක් සිදුවුවහොත් එහි වගකිම අපි  භාර ගත යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී.සරත් ශ්‍රි ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ ගරු මන්ත්‍රිවරුන් දෙපැත්තෙන්ම සකච්ඡා කරනු ලැබුවේ එම කඩ හිමියන්ගේ ඉල්ලිම තමයි එම යතුරුපැදි නතර කර දිමට ස්ථානයක් ලබා  දීම. ඒ අයට තිබුණු තැන නැතිවු නිසා තමයි අලුතින් තැනක් දිය යුතු වන්නේ. එම නිසා ඒ වෙළඳසැල් හිමියන් සමඟ සාකච්ඡා කරන්න. එ අයට ගොඩක් කැපකිරිමක් කළ හැකිය. අඩුම වශයෙන් මේ සඳහා රු.200000/= මුදලක් වැයවනවානම් එයින් වෙළඳසැල් හිමියන්ට රු.100000/= මුදලක් දැරිමට කියන්න. ඉතිරි මුදල සභාව විසින් දරා මෙම කාර්ය ඉටුකර  දෙන්න.  ඔබතුමා ඉදිරිපත් කළ විදියට ආරක්ෂක තත්වය මත තමයි එවැනි දෙයක් සිදු වුයේ. කලින් සිදුවුයේත් මේ සිද්ධියයි. ත්‍රිරෝද රථගාල එතැනට පැමිණිමට හේතුව කුමක්ද ? එල්.ටී.ටී. යුධ සමයේ මුලස්ථාන පොලිස් පරික්ෂක මහතා පැමිණ කියා සිටියා බස්නැවතුම්පොළ ඉදිරිපිට වාහන නතර කිරිම සිදු නොකරන ලෙස දැනුම් දුන්නා. එවකට සිටි ගරු සභාපතිවරයා විසින් ත්‍රිරෝද රථ ගාල අයින් කරනු ලැබුවා. එය අයින් කළ විට ඒ අය උද්ඝෝෂණය කළා අපිට තැනක් දෙන ලෙස. ඉන්පසු තමයි ඩිස්පැන්සරි ඉඩම ලබා දුන්නේ. දැන් අද සින්න වෙලා. නගර සභාවට බඳුවත් ගෙවන්නේ නැහැ.එහෙම තත්වයක් තිබෙන්නේ. මේවා දිමේදි කල්පනාකාරි විය යුතු වෙනවා. හැබැයි ගරු සභාපතිතුමනි මෙය දැනටමත් රථගාලකි. එය ගිවිසුමේම තිබෙනවා හැටන් නැෂනල් බැංකුව වම් පැත්තේ ත්‍රිරෝද රථ 45ක් පමණ නතර කළ හැකි  රථ ගාලක කොටසක් තමයි මේ දෙනු ලබන්නේ . ඒ අනුව අලුතෙන් රථගාලක් හදන එක නෙමේ මේ කරනු ලබන්නේ.එම ගැටළුව අපිට අවසන්. එකමේ මේ සම්බන්ධව ගරු මන්ත්‍රිවරු ප්‍රකාශ කළ ආකාරයට ඒ අයගේ අවශ්‍යතාවයක්නේ මෙය. පාරිභෝගිකයන්ට නෙමේ මේ රථගාල සාදනු ලබන්නේ. එම වෙළඳසැල්හිමියන්ට. ඒ අය අපට වාර්ෂිකව බඳු ගෙවන බව ඇත්ත. ඒ අය විශාල

දායකත්වයක් දරනවා. නමුත් ඒ හා සමානව ඔවුන් මුදල් උපයනවා. මේ ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කර සිටින්නේ මෙහි නියම අයිතිකරු නෙමේ මේ ඉල්ලීම කරන්නේ. වෙළෙඳසැල බද්දෙන් බඳු දුන් පුද්ගලයන්ය. ඒ අය මුදලක් උපයනවා. රු.60000/=, රු.70000/=,රු.100000/= මෙම වෙළඳසැල් බඳු දීපු ඒවා තිබෙනවා.ඒ අයට රු.100000/= මුදලක් දී තිබෙන නිසා ඒ අයට රු.2000/= ක මුදලක් මේ වෙනුවෙන් ගෙවීමට හැකියි. අර ආර්ථික අහේනිය තිබෙනවා කාටත් . එයත් මා පිළිගන්නවා. රටේ පවතින ආරක්ෂක තත්වය ගැන සිතා මෙම වෙළඳසැල්හිමියන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගෙන් රු.100000/= ක මුදලක් දමා ඉතිරි රු.100000/= මුදල සභාවෙන් යොදා මෙම කාර්ය ඉටු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට අනෙක් වෙළඳ සංකිර්ණ වලිනුත් ඉල්ලීමක් කළහොත් අපිට එම ඉල්ලීමත් ඉටු කරන්න වෙනවා. සරසවිය හංදියේ තිබෙන වෙළඳ සංකිර්ණයේ තිබෙන අත්වැල ගැසීමට යෝජනා කළා. මේ වනවිට එය ඉටු වී නැහැ. බස්නැවතුම්පොළ වෙළඳ සංකිර්ණයේ හොඳ ව්‍යාපාරිකයන් සිටින ස්ථානයකි. ඔවුන්ට රටේ පවතින ආරක්ෂාකාරි තත්වය ගැන සිතා මෙම කාර්ය ඉටුකර ගත හැකිය.මේ තත්වය ගැන සේම අනෙක් තැන් ගැනත් සිතිය යුතුයි. විශේෂයෙන්ම මාළු වෙළඳසැල වගේ තැන්වලටත් ආරක්ෂාව තිබිය යුතුයි. සාධාරණ ලෙස නගර සභාව සතු සැම ස්ථානයකම ආරක්ෂාව සලසන ලෙස කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

- **පෙරවරු 10.40 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු නතර කර රටේ ආරක්ෂක තත්වය පිළිබඳ සහකාර පොලිස් අධිකාරිතුමා සමඟ සකාච්ඡාවක් සිදු කිරිම නිසා සභාව කාරක සභා තත්වයකට පත් කරන ලදී.**
- **පෙරවරු 11.40 ට පමණ කාරක සභා තත්වයෙන් මිදි රැස්විමේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

බස්නැවතුම්පොළේ වාහන නැවතිම සම්බන්ධව ස්ටිකරයක් සැකසිම පිළිබඳවයි. ඒ සඳහා ඔබතුමාලාගේ අනුමතිය ඉල්ලා සිටිනවා. ඒ සඳහා විරෝධතාවයක් නැද්ද ? මිළඟට විරෝධතාවය දක්වන ලද බස්නැවතුම්පොළේ රථගාල සැදිම සම්බන්ධවයි. ඔබතුමාලා දැන්වත් හිතන්නේ නැද්ද දැන්වත් මෙය කිරිම සුදුසු බවට.අප්‍රේල් මස 21 දා සිට මේ දක්වා ඇති වු තත්වය පිළිබඳව ඒ අනුව කටයුතු සිදු කිරිමට සිදු වුණා. මෙය සැදිමට අද දිනයේ තමයි ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් වනුයේ.රු.130000/= ක ඇස්තමේන්තුව . මෙය අපිමයි සදන්නේ. මෙය සාදනවානම් මේ අවශ්‍ය භාණ්ඩ ගෙන්විය යුතු බවට ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ඔබතුමා වෙළඳසැල් හිමියන්ට ප්‍රකාශ කරන්න. මේ සඳහා රු.130000/= ක මුදලක් වැයවන බවත් මේ මුදල තනියම නගර සභාවට දැරිය නොහැකි බවත් ඒ සඳහා යම්කිසි දායකත්වයක් ලබා දී අපි සභාවෙන් රු.40000/= පමණ මුදලක් ලබා දී ඉතිරි මුදල ඒ අයට දැරිමට කියන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එය නිශ්චිත විය යුතුයි ගණන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

මේ සඳහා රුත130000/= න් සභාවෙන් රු.30000/= ක මුදලක් ලබා දෙන්න. ඉතිරිය රු.100000/= පමණ මුදල ඒ අයට දායකත්වය ලබා ගැනිමට කියන්න.නගරයේ ආරක්ෂාව පිළිබඳ ගැටළුවක් නැහැ. අපේ මුදල් පමණක් දමා ඇයි මේ අයට මෙය සාදා දෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ස්ටිකර් ලබා දිමට කිසිවෙකු විරුද්ධ නැහැ.

**තීරණය**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වෙළඳ සංකිර්ණයේ කඩ කාමර හිමියන්ගේ යතුරු පැදි නතර කිරිමට අවසර ලබා දිම වෙනුවෙන් ඔවුන්ගේ යතුරු පැදි සඳහා ස්ටිකරයක් නිකුත් කිරිම සඳහා ස්ටිකර් මුද්‍රණය කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

## 03.12 හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහන සඳහා අනුමතිය ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගත කිරිම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හිඟ වරිපණම් එකතු කිරිම සම්බන්ධවයි.2019.05.25 දින පෙ.ව.8.30 සිට ප.ව.4.30 දක්වා ජංගම වැඩසටහනක් කෙරමිණිය ප්‍රදේශයේ පැවැත්විමට සුදානම් කර තිබෙනවා. එම වරිපණම් බදු එකතුකිරිමේ වැඩ සටහන සඳහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම සේවය කොට්ඨාශ අංක 13 කොටසක් - කෙරමිණිය ප්‍රදේශයේ 2019.05.25 දින පැවැත්විම සඳහා අනුමතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

## 03.13 03.13 2019.05.25 දින හිඟ වරිපණම් එකතු කිරිමේ ජංගම වැඩසටහනක් කෙරමිණිය ප්‍රදේශයේ පැවැත්විමට සුදානම කර ඇත. ඒ සඳහා සහභාගිවන නිලධාරින්ට පැය 08 ක අතිකාල දිමනා හා දින වැටුප් ලබා ගැනිම සම්බන්ධ ලිපිය සභාගතකිරිම

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම ජංගම සේවය සඳහා සහභාගි වන නිලධාරින්ට පැය 8ක අතිකාල දිමනා ලබා දීමට අනුමතිය ඉල්ලා සිටිනවා.එසේම එම වැඩසටහන් පවත්වන ආකාරය පිළිබඳ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ සඳහා අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා</u>**

ගරු සභාපතිතුමනි, හිඟ වරිපණම් එකතු කර ගැනිමේ අවශ්‍යතාවය මෙවන් සභාවකට දැඩිව තිබෙනවා.එනමුත් අප කෙරමිණිය කොට්ඨාශය අංක 1 නිසා වෙන්නැති පලමු කොට තෝරා ගෙන ඇත්තේ. මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා මාස 5කට 6කට වැඩියි මේ වනවිට කසළ ගෙනයන ට්‍රැක්ටරය කැඩී. අපි දුටුවා සෞඛ්‍ය කමිටු කිහිපයකදි සෞඛ්‍ය පාරිපාලකවරයාගෙන් මේ ගැන විමසා සිටියා. අපි එතුමාගෙන් විමසා සිටින විට මිළ ගණන් කැඳවා ඇති බව ප්‍රකාශ කළා. දිගින් දිගටම ඇයි මේ අපේ ට්‍රැක්ටර් රථය යථා තත්වයට පත් කිරිම සිදු කරන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ කියන කාරණය ඇත්තද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙය දිගින් දිගටම සිදු කරන්නේ අනුන්ගේ ට්‍රැක්ටර් වලිනි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ අනුන්ගේ ට්‍රැක්ටර් නැහැ. මේ සභාවේ ට්‍රැක්ටර් තමයි තියෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

අනුන්ගේ ට්‍රැක්ටර් නෙමේ. සභාවෙන් අපේ ගමට වෙන්වූ ට්‍රැක්ටරයයි කැඩී තිබෙන්නේ. එම නිසා අපට අවශ්‍ය මොහොතක දිනපතා ගෙන්වා ගැනීමට නොහැකියි මේ කාර්ය සඳහා. එම ට්‍රැක්ටරය ඉක්මනින් සදා දෙන ලෙස තමයි අපි ඉල්ලා සිටින්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මොකක්ද ඒ ට්‍රැක්ටරයට වෙලා තියෙන්නේ. අපි ට්‍රේලරයක් අලුතින් ගෙන්වීමට හැදූවිට සභාවෙන් කිව්වා ට්‍රේලරය බඩු ගෙනවිත් සභාවෙන් හදන්න කියා. අලුත් ට්‍රේලරයක් ටෙන්ඩර් ගත්තානම් ඉවරයි. ට්‍රේලරයක් ගැනීමට සභාව අනුමත කර තිබෙනවාද? ලබන ටෙන්ඩර් කමිටුව ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ වරිපණම් බදුවලට කලින් කිරිමට අපහසු වේද මේ වැඩයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපහසු වේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ඊයේ දිනයේත් අපගේ වැසියෙක් පවසනවා මට ඇසුණා. කොමසාරිස් පාලනය මීට වඩා හොඳයි කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වෙන්නැති ගරු මන්ත්‍රීතුමා දකින්නෙත් සභාව දිනයට පමණයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

කොමසාරිස් පාලනය හොඳයි කියා කතා කළේ මේ කසළ අදින ට්‍රැක්ටරයයි. අපි මේ අපහසුව ඉතා ඉක්මනින් යථා තත්වයට පත්කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය**

2019.05.25 දින පැවැත්වෙන හිඟ වරිපණම් එකතු කිරීමේ ජංගම වැඩසටහන සඳහා සහභාගී වීමට නියමිත පහත නම් සඳහන් නිලධාරීන් හට පැය 08ක අතිකාල දීමනා හෝ දින වැටුප් ලබා ගැනීම සඳහා අනුමතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

- ලේකම් රණසි උත්පලා ගුණවර්ධන මිය - දින වැටුප්
- ආදායම් අංශ ප්‍රධානී ඉන්දිකා ස්වර්ණමාලි මිය
- දුල්කා මධුරංගනී මිය
- ෂෙහාරා මධුවන්ති මිය
- නිශාමලී වේවැල්වල මිය
- පවනි මහආරච්චි මෙනවිය
- ඉමේෂා කොඩිකාර මිය
- ලකීෂා යසස්වී මිය - දින වැටුප්
- ටී.චන්න මයා - දින වැටුප්
- ටී හංස ලක්ෂාන් මයා - දින වැටුප්
- නලින් චන්ද්‍රජිත් මයා
- බුද්ධික රංජන විජේසූරිය මයා
- භාග්‍යා පුෂ්පකාන්ති මිය
- චමින්ද සිසිර කුමාර මයා
- සුමිත් යසරත්න මයා
- කේ.ඩබ්.නිල්මිණි මිය
- සහන් සංකල්ප මයා
- යූ.ජී. තරංගනී මිය
- ඒ.එච්. දිපිකා මිය

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න — නැත

**(05)** hථා පරිදි කල් දී ඇති යෝජනා — ඇත

## 05.01 සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05.01.01 2019.04.02 දින පැවති සභා තීරණ අංක 03.17 යටතේ ඉදිරිපත් කර තිබූ කැටන්තොට 1 පටුමග හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් නම්කිරීමේ යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

2019.04.02 දින පැවති සභා තීරණ අංක 03.17 යටතේ ඉදිරිපත් කර තිබූ කැටන්තොට 1 පටුමග හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් නම්කිරීම සුදුසු බවට යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කර සිටිනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එම යෝජනාව පසුගිය සභාවට ලිපියක් මඟින් ඉදිරිපත් කර තිබුණා. එම යෝජනාව සඵල කර ගැනිම සඳහා ගරු මන්ත්‍රිවරයෙක් ලෙස යෝජනා වාරයකදි එය ඉදිරිපත් කළ යුතුයි. මේ යෝජනාව අද දිනයේ ඉදිරිපත් කරනු ලැබුවේ. හිටපු නගර සභා මන්ත්‍රිවරයෙක් වන දිප්ති සරත් චන්ද්‍ර ද සිල්වා මහතා 1997 තේරි පත්වුණු ඉතාමත් හොඳ නගරික මන්ත්‍රිවරයෙකි.එතුමා නමින් නම්කරන ලෙස මේ ගම්වැසියන් විසින් අත්සන් කර ලිපියක් එවා තිබුණේ. මෙම මාර්ගය තාර දමා නොතිබුණු පාරකි. මෙතුමාගේ මෙහෙයවිමෙන් තමයි එම පාර තාර දමා සදනු ලැබුවේ. එම පාර නම් කිරිමට යෝජනා කර ඒසඳහා විරෝධතා කැඳවා ඒ අවශ්‍ය කටයුතු සිදු කිරිමට බලාපොරෝත්තු වේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මේ සම්බන්ධව වාද විරහිතයි. මේ යෝජනා නිසා තමයි මෙය ප්‍රකාශ කරනු ලබන්නේ. මෙවැනි යෝජනාවක් කෙරමිණිය පුස්තකාලය කේ.පිටර් ද සිල්වා නමින් නම්කරන ලෙසට අපි විරෝධතා කැඳවන ලදි. ඉන් ඉදිරියට මෙය ක්‍රියාත්මක වුයේ නැහැ. දැන් මාස 5ක් පමණ වෙනවා.මේ යෝජනා ඇයි ඉදිරියට නොයන්නේ. දැන් මේ යෝජනාවත් මග හිර වෙයිද දන්නේ නැහැ ගරු ලක්ෂ්මි මැතිණියනි. ඉදිරියට යන ක්‍රම වේදය කුමක්ද? මොකද ඔබතුමා ප්‍රකාශ කරන්නේ කෙරමිණිය පුස්තකාලය නම් කිරිම සම්බන්ධව. දැන් කොහේද එම යෝජනාව තිබෙන්නේ. විරෝධතා කැඳවන ලදි

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අපේ වැඩ කොටස අවසන්. දැන් තිබෙන්නේ නිලධාරි වශයෙන් කරන වැඩ කොටසක් තිබෙන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

ඔවුන්ට මඟ පෙන්විමක් අවශ්‍ය වෙනවා. ඔවුන් නවක නිලධාරින් නිසා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙහි නවක කවුරුත් නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

මෙවැනි පළාත් පාලන ආයතන වල ක්‍රියා මාර්ග පිළිබඳව

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඔබතුමාගේ ප්‍රශ්නයට විරෝධතා කැදෙව්වා. එක විරෝධතාවයක් පැමිණියා. එම විරෝධතාවය විමර්ශනය කිරිමට විමර්ශන නිලධාරි පත් කරනු ලැබුවා. එම විමර්ශන නිලධාරි මහතා පැමිණි අවස්ථාවේ ඒ විරෝධතාකරු පැමිණ සිටියේ නැහැ. මේ ගැන මගෙන් ඇසුවා . මා ප්‍රකාශ කළා. මේ සඳහා විරෝධතාවයක් නැතිනම් මෙය අනුමත කර ඔබතුමා යන්න කියා. ඊට පසුදින මේ මනුස්සයා ලියාපදිංචි තැපැලෙන් ලිපියක් එව්වා. මේ විරෝධතාවය සඳහා පැමිණෙන ලෙස දන්වා ලිපිය ලැබුණේ අද දිනයේ බවට.එවිට වේලාව පැනලා. මා එම ලිපියත් පළාත් පාලන විමර්ශන නිලධාරි මහතාට යවන ලදි. ඒ අනුව තවම මෙහි තින්දුව පිළිබඳ විස්තරයක් මා හට ලැබි නැත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ වන විට විමර්ශන නිලධාරියාත් ස්ථාන මාරු ලබා ගොස් ඇත. එම නිසා මෙය එක්කෙනා එක්කෙනා අතට පත්වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නැහැ. එම නිසා තමයි ප්‍රකාශ කරනු ලැබුවේ විමර්ශන නිලධාරි කියා.විමර්ශන නිලධාරි පුද්ගලිකව යන්න පුළුවන්. නමුත් නිලධාරින් සිටිනවානේ. කවුරු හෝ විමර්ශන නිලධාරියෙක් සිටිනවා. අපි නම්කර ඇත්තේ පුද්ගලික ඒ තැනැත්තාගේ නමින් නෙමේ. විමර්ශන නිලධාරි යන නමිනි. එවිට විමර්ශන නිලධාරි ලෙස පත්වී එන ඕනෑම පුද්ගලයෙක් මෙය කළ යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

එසේනම් ලේකම්තුමියනි, මේ ගැන සොයා බලා අපට ඒ වැඩයට උදවු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තිරණය :-**

ගම්වැසියන් වැසියන් කරන ලද ඉල්ලීමට අනුව 2019.04.02 දින සභා තීරණ අංක 03.17 යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලිම පරිදි අම්බලන්ගොඩ , මහ අම්බලන්ගොඩ කැටන්තොට පාර - 1 පටුමග හිටපු නාගරික මන්ත්‍රී දිප්ති සරත් චන්ද්‍ර මහතා නමින් දිප්ති ද සිල්වා මාවත ලෙස නම් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.02 2019 ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරිම සුදුසු බවට යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019 ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරිම සුදුසු බවට යෝජනා යෝජනා කර සිටිනවා. මා හිතන්නේ එම වාර්තාව සියළු දෙනාටම ලැබෙන්නට ඇති. එම වාර්තාව මා යෝජනා කර සිටිනවා. මෙය ස්ථිර කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

එම වාර්තාව ස්ථිර කරනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ නගර සභාවේ පුස්තකාල කමිටුවේ උපදෙස් හා නිර්දේශයන් සැලකිල්ලට ගනිමින් 2019 වර්ෂයේ ජාතික කියවීමේ මාසය සඳහා වු වැඩසටහන ක්‍රියාත්මක කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.03 පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමට අදාලව ගෙවතු වගා ක්‍රමය ප්‍රචලිත කිරිම සඳහා 2019.04.02 දින සභා තීරණ අංක 03.04 ව්‍යාපෘති වාර්තා වැඩසටහන ( සංශෝධන පත්‍රිකාව) ක්‍රියාත්මක කිරිමේ යෝජනාව සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

පොල්වත්ත ග්‍රාම නිලධාරී වසමට අදාලව ගෙවතු වගා ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා 2019.04.02 දින සභා තීරණ අංක 03.04 ව්‍යාපෘති වාර්තා වැඩසටහන ( සංශෝධන පත්‍රිකාව) ක්‍රියාත්මක කිරීමේ යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නාගරික ගෙවතු වගා වැඩසටහන ( සංශෝධන පත්‍රිකාව ) අම්බලන්ගොඩ නගර සභාව. පොල්වත්ත ග්‍රාම සංවර්ධන වැඩ සටහනට අදාලව ගෙවතු වගාව ආරම්භ කිරීම සඳහා 2019.04. 02 දිනැති ඉදිරිපත් කර ඇති සභා තීරණ අංක 03.04 යටතේ ඉදිරිපත් කර ඇති වාර්තාව හා බැදේ.මේ ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීමට පහත සඳහන් සංශෝධනයන් ඉදිරිපත් කර ඇත.2019 මාසික සභා අනුමතිය ප්‍රකාරව කොම්පොස්ට් පොහොර බඳුන් ලබා ගැනීම රු5000/= හා රු.1,60,000/= වියදමක් යටතේ මිලදී ගැනීමට ඇස්තමේන්තු කොට තිබූ අතර දකුණු පළාත් පරිසර අමාත්‍යාංශයෙන් කොම්පෝස්ට් බඳුන් 32ක් රු.2500/= ක අඩ පිරිවැයකට රුපියල් 80,000/= ලබා ගැනීමට හැකි වුවහොත් ඉතිරි මුදලින් බඳුන් ගත කොම්පෝස්ට් භාවිත ගෙවතු වගාවට යෙදවීම. ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට 2019 මාර්තු මස සභා අනුමතියට ඉදිරිපත් කළ ඇස්තමේන්තුවෙහි ඇතුළත් වී නොතිබුණි)

ස්ථානය - **පොල්වත්ත අග්‍රාරාම විහරස්ථානයේදී**

විශේෂ ආරාධිත දේශනය - ජාතික රූපවාහිනී රිවිදින අරුණැල්ල වැඩසටහන ඉදිරිපත් කරන ප්‍රවීන කෘෂි විද්‍යාඥ උදය ද සිල්වා මහතා විසිනි.

ඉලක්ක කණ්ඩායම - ප්‍රදේශවාසීන් 250 ක් පමණ

**දළ ඇස්තමේන්තුව**

| | |
|---|---|
| සම්පත් දායක දීමනා | රු. 25000/= |
| (නවාතැන් පහසුකම් ආහාරපාන හා දේශන ගාස්තු සහිතව) | |
| බැනර් 03ක් ( අඩි 6*4)*55) | රු. 3960/= |
| ආරාධිත සංග්‍රහය 30 ක් ( 200*30) | |
| (කට්ලට්, සැන්විච්, පුවාළු කෙසෙල් , තේ ) | රු. 6000/= |
| සහභාගිත්ව සංග්‍රහය 100*250 | රු.25000/= |
| අත්පත්‍රිකා මුද්‍රණය | රු. 650/= |
| ගෙවතු වගාව පිළිබඳ දැනුවත් කිරීමේ පොත් පිංචක් මුද්‍රණය | රු. 5000/= |
| වෙනත් | <u>රු. 1000/=</u> |
| එකතුව | <u>රු 66610/=</u> |

**.තීරණය :-**

පොල්වත්ත ග්‍රාම නිලධාරී වසමට අදාලව ගෙවතු වගා ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා 2019.04.02 දින සභා තීරණ අංක 03.04 ව්‍යාපෘති වාර්තා වැඩසටහන ( සංශෝධන පත්‍රිකාව) ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.04** **නගර සභා මහජන ක්‍රීඩාංගණයේ බෝගස අසළ ආරක්ෂක වැට ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීමේ යෝජනාව සභා ගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා මහජන ක්‍රීඩාංගණයේ බෝගස අසළ ආරක්ෂක වැට ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය :-**

නගර සභා මහජන ක්‍රීඩාංගණයේ බෝගස අසළ ආරක්ෂක වැට ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.05** **නගර සභා මහජන ක්‍රීඩාංගණයේ ,ලංකා බැංකුව අසළ ආරක්ෂක වැට ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීමේ යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා මහජන ක්‍රීඩාංගණයේ ,ලංකා බැංකුව අසළ ආරක්ෂක වැට ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය :-**

නගර සභා මහජන ක්‍රීඩාංගණයේ ලංකා බැංකුව අසළ ආරක්ෂක වැට ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.06** **හෙප්පුමුල්ල හෙප්පුවාහන්දි වත්ත පාර කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරීමේ යෝජනාව සභා ගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හෙප්පුමුල්ල හෙප්පුවාහන්දි වත්ත පාර කාණු පද්ධතිය ඉදිකිරීමේ කර්මාන්තය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

හෙප්පුමුල්ල හෙප්පුවාහන්දි වත්ත පාර කණු පද්ධතිය ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.07** **මහ අම්බලන්ගොඩ පොදු නාන තොටුපල අලුත්වැඩිභයා කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සම්බන්ධ යෝජනාව සභා ගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මහ අම්බලන්ගොඩ පොදු නාන තොටුපල අලුත්වැඩිභයා කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

මහ අම්බලන්ගොඩ පොදු නාන තොටුපල අලුත්වැඩිභයා කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.08** නගර සභා බැඩ්මින්ටන් ක්‍රිඩා පිටියේ තීන්ත පිරියම් කිරිම සහා අලුත්වැඩියහා කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිමේ යෝජනාව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නගර සභා බැඩ්මින්ටන් ක්‍රිඩා පිටියේ තීන්ත පිරියම් කිරිම සහා අලුත්වැඩියහා කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

නගර සභා බැඩ්මින්ටන් ක්‍රිඩා පිටියේ තීන්ත පිරියම් කිරිම සහා අලුත්වැඩියහා කිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.09** අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ පිටුපස කොටස ආරක්ෂිත වැට ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ පිටුපස කොටස ආරක්ෂිත වැට ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිමට යෝජනා කරනවා

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ පිටුපස කොටස ආරක්ෂිත වැට ඉදිකිරිමේ කර්මාන්තය සහා අරමුදලින් කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.10** **අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාංගණය පස් අතුරා සංවර්ධනය කිරීමේ ( දෙවන අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිමේ යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාංගණය පස් අතුරා සංවර්ධනය කිරීමේ ( දෙවන අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ මානාන ක්‍රීඩාංගණය පස් අතුරා සංවර්ධනය කිරීමේ ( දෙවන අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී දිනායදුර ධර්මදාස මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.11** **අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය ආරක්ෂිත වැට ඉදිකිරීමේ ( දෙවන අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරමේ යෝජනාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය ආරක්ෂිත වැට ඉදිකිරීමේ ( දෙවන අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණය ආරක්ෂිත වැට ඉදිකිරීමේ ( දෙවන අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.12** **අම්බලන්ගොඩ හල්වතුර කසල බැහැරලන ස්ථානයේ කසළ වැසීම සඳහා පස් ඇතිරීම ( 2019 පලමු අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ හල්වතුර කසල බැහැරලන ස්ථානයේ කසළ වැසීම සඳහා පස් ඇතිරීම ( 2019 පලමු අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ හල්වතුර කසල බැහැරලන ස්ථානයේ කසළ වැසීම සඳහා පස් ඇතිරීම ( 2019 පලමු අදියර ) කර්මාන්තය සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.13** **අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ වෙළඳසැල් හිමියන් සඳහා යතුරුපැදි නතර කර තැබිම සඳහා රථගාලක් ඉදිකිරිම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ වෙළඳසැල් හිමියන් සඳහා යතුරුපැදි නතර කර තැබිම සඳහා රථගාලක් ඉදිකිරිමට යෝජනා කර සිටිනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ වෙළඳසැල් හිමියන් සඳහා යතුරුපැදි නතර කර තැබිම සඳහා රථගාලක් ඉදිකිරිම සඳහා සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.14** **අම්බලන්ගොඩ නගර සභාවේ අපදා කළමනාකරණ සැලැස්මේ සමස්ථ ක්‍රියාවලිය සහා අරමුදලින් සිදු කිරිම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවේ අපදා කළමනාකරණ සැලැස්මේ සමස්ථ ක්‍රියාවලිය සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බව යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපදා කළමනාකරණ සැලැස්මක් නගර සභාවට ඉදිරිපත් කරනවා.ඒ සැලැස්ම සභාවට ඉදිරිපත් කර ඇත. මෙහිදි අපි විස්තර කළ අකාරයට සභාවක් විදියට යම්කිසි අපදා අවස්ථාවකදි ගත යුතු පියවර සම්බන්ධයෙන් දළ වාර්තාවකි.මේ වාර්තාවට සභාවෙන් එකතු කළ යුතු කරුණු මොනවාද කියා අපගේ ගරු මන්ත්‍රිවරු අදහස් දක්වා ඒ වෙනුවෙන් කළ යුතු ආකාරය. යම් හෙයකින් අපදා තත්වයක් ඇති වුවහොත් ඉක්මනින් රැස්වෙලා තිරණ තින්දු ගැනිම, ශබ්ද විකාශන යන්ත්‍ර වැනි පහසුකම් ,ඒ සියල්ලම යොදා ගෙන තිබිම . මේ සම්බන්ධව කලින් අපි වෙළඳ සංගමයක් සමඟ එක් වි වැඩසටහනක් කළා.ඒ  වෙළඳ සංගමයට අපි ඉල්ලිමක් කළා අම්බලන්ගොඩ නගරය තුළ උදේ සවස පිරිත් දේශනා පැවැත්විමට ශබ්ද විකාශන යන්ත්‍ර මාලාවක් සවිකරන ලෙස නගරය තුලම.ඒ අනුව ඔවුන් එය සවි කළා. එය කාලයක්ම පවිච්චි කළා. අපට අවශ්‍ය වුයේ  අපදාවක් කියා දැනුම් දිමට තිබුණේ සුනාමි අනතුර.ඒ සුනාමි අනතුර දැනුම් දිමට අවශ්‍ය පහසුකම් අපි සලසා ගනු ලැබුවා . නමුත් දැන් ඒ තිබෙන වයර් ටික හා හොන්ටික සියල්ලම සොරකම් කර ඇත. ඒ සම්බන්ධව අපට එවැනිම වැඩපිළිවළක් යෙදවිය යුතුයි.වෙළඳ සංගමයේත් ක්‍රියාත්මක විමක් නැහැ. ඒ අනුව කරන්න ඔන වැඩසටහන් පිළිබඳව, කළ යුතු වැඩ සටහන් උදාහරණයක් ලෙස අපි හිතමු යම් සුළි සුළඟක් ඇති වුවහොත් මිනිසුන් කොහොමද යොදවන්නේ,ජනතාව වෙනුවෙන් අප කටයුතු කරන්නේ කොහොමද කියන එක. අපේ සේවකයන් එක දිගට රඳවාගෙන එක දිගට වැඩ කළ යුතුයි.එවැනි අපදා අවස්ථාවක සභාවකට අවශ්‍ය වන භාණ්ඩ මොනවාද ? ඒ භාණ්ඩ ටික ක්‍රමයෙන් සභාව තුළ අපි රැස්කර තබා ගත යුතුයි. අපි මේ වාර්තාව ඔබතුමාලාට ලබා දෙනවා. නිවසට ගිහින් හොඳට කියවා අධ්‍යනය කර මෙයට එකතු විය යුතු කරුණු හා මේ ඇස්තමේන්තුත් අනුමත කිරිමට. යම් අපදාවකදි උදාහරණයක් ලෙස මේ 21 දා සිද්ධිය. මෙවැනි සිද්ධියක් වු විට ඒ සිද්ධියේදි සභාවක් රැස්කරනවාට වැඩිය සභාව විසින් කලින් තිරණය කරනවා මෙවැනි දෙයක් සිදුවුවහොත් සභාව කළ යුතු දේවල් මොනවාද කියා. මොන විදියේ දේවල් වලටද මුදල් වියදම් කළ යුත්තේ කියා.මොන විදියේ දේවල්ද සභාවෙන් ජනතාවට දිය යුතු දේවල් කියා.කලින්ම දැනුම් දි නිලධාරින්ට බලතල ලබා දිය යුතුයි. එයයි මින් බලාපොරෝත්තු වන්නේ.මේ සැලැස්ම තුල හොඳ වැඩපිළිවළක් , ප්‍රාදේශිය වශයෙනුත් තම කොට්ඨාශය කරන ලෙස ඉල්ලා සිටිනවා. එසේම මා ඉල්ලිමක් අකර සිටිනවා. අද අඟහරුවාදා. ලබන සඳුදා දිනයේ පෙර පාසල් පටන් ගන්නවා.ඒ අදාල කොට්ඨාශයේ සියළුම මන්ත්‍රිවරු එම පෙර පාසලේ සියළුම දෙමාපියන් සමඟ සාකච්ඡාවකට ගිහින් ඒ පෙරපාසල් වල ආරක්ෂිත තත්වය හා අනාරක්ෂිත තත්වයකට යොමු වුවහොත් මොනවාද කරන්නේ කියා ඒ අදාල පෙර පාසලේ ගුරුවරියත්, දෙමාපියනුත් . අදාල කොට්ඨාශය භාර ගරු මන්ත්‍රිවරයාත් එකතු වි ඒ සැලසුම් ඔබලා විසින්ම නිර්මාණය කර ගන්නා ලෙස ඉල්ලිමක් කර සිටිනවා.පාසල් ගැන කතා කළා. නමුත් මතක තබා ගන්න පෙර පාසල් 8ක් අප යටතේ තිබෙනවා. ඒ යටතේ තිබෙන මේ පෙර පාසල් වල මොනවා හරි මේ පුංචි දරුවන්ට අනතුරක් සිදු වුවහොත් කෙසේද අපි කටයුතු කළ යුත්තේ. ඒ පිළිබඳව සොයා බැලිමක් අවශ්‍යද ? කටයුතු කිරිමක් අවශ්‍යද ? ඒ දෙමාපියන්ගෙන්ම විමසා බලා දෙමාපියන් මඟින්ම ආරක්ෂණ වැඩ පිළිවළක් සකසා ගන්න.මේ සම්බන්ධව අදාල දෙමාපියන් සමඟ එකතු වි ඔබතුමාලාගේ කාලය පැයක් පමණ කැප කර රැස්විම් පවත්වා සාකච්ඡා කර තීරණය කර ගන්න. මේ සකච්ජා කර පෙර පාසල මඟින් ගන්නා ලද තිරණ පිළිබඳව සභාව දැනුවත් කළ යුතුයි. ඒ ගන්නා ලද තින්දු හා තිරණ පිළිබඳව ලබන සභාවට වාර්තාවක් ලබා දෙන්න. එවිට සැහිමකට පත්වෙනවා අවශ්‍ය දේවල්. අද තින්දුවක් ගත්තානම් හොඳයි මේ ගරු නගර

සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා පෙන්වන ලද උපකරණය පිළිබඳ. සභාවට අඩුම ගණනේ එයින් 4ක් 5ක් ගත්තානම් හොඳයි. පෙර පාසල් වලට නෙමේ. සභාවට , බස්නැවතුම්පොළේ ආරක්ෂක අංශයට. ප්‍රජාපතිය වගේ පාසලකට මෙය ගන්න විදියක් නැහැ. එවැනි අවස්ථාවල අපේ ගාව තිබුණොත් මෙය භාවිතා කර ලබා ගැනීමට පුළුවනි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කවුරුහරි ගරු මන්ත්‍රීවරයෙක් ඒ අවශ්‍ය ප්‍රමාණය කොපමණද කියා යෝජනා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ කතා කරමින්</u>

මා ඉතා සතුටු වෙනවා ගරු සභාපතිතුමා විසින් අපදා කළමනාකරණ සැලැස්මක් ඉතා කෙටි කලකින් ඉදිරිපත් කිරිම සම්බන්ධව. මෙය ලැබුණු විගස මා කියවාගෙන ගියා.හදිස්සියක් වු විට අපි කොහොමද ක්‍රියාත්මක කළ යුත්තේ කියා අපි ළඟ සැලැස්මක් තිබිය යුතුයි. මෙවැනි තත්වයකදි නගර සභාව මූලික වී හදිස්සියකදි කොහොමද ක්‍රියාත්මක විය යුත්තේ කියා සැලැස්මක් තිබිය යුතුයි. මෙහි ජල ටැංකි , උපකරණ ආදි සියල්ලම මෙහි තිබෙනවා. මෙහිදි පාසල් කාලය තුලදි පිපිරිමක් සිදු වුවහොත් ඒ ළමුන් කොහොමද මුදා ගන්නේ. එම දරුවා කොහොමද ආරක්ෂා සහිතව යම් තැනකට ගෙන යනු ලබන්නේ. මේ සැලැස්මේ සියළුම දේවල් ඇතුළත් වෙනවා.මේ දිනවල මා කාර්ය බහුලයි. එම නිසා බූස්ස යුද හමුදා කඳවුරේ නිලධාරියෙක් දමා සහාය ලබා දිය හැකියි. මේ පිළිබඳව පොලිසිය සමඟ සාකච්ජා කර නගරයට අවශ්‍ය පරිදි මෙය සකස් කර ගත හැකිය. පාසල් වලට අනුව කොට්ඨාශ 13ටම මේ පිළිබඳව දැනුවත් කර මෙය සකස් කළ යුතුයි .එම නිසා ගම දැනුවත් වෙනවා මෙන්න මේ විදියට තමයි මොනවා හරි දෙයක් වුවහොත් ක්‍රියා කළ යුතු ආකාරය. සුනාමි තත්වයක් පැමිණියහොත් ඒ අය මේ පැත්තට යනවා ඒ අයගේ සහායෝගය ලබා දෙනවා.වෙනත් අපදා තත්වයක් හෝ දැන් මේ රටේ පවතින දරුණුම මුස්ලිම් අන්ත්‍රවාදි තත්වය. එමනිසා අපි මෙතුමිය සාදා ඇති සියළු දේවලුත් එකතු කරගෙන මෙම අපදා කළමනාකරණ කමිටුව සකස් කර ගන්නා ලෙස යෝජනා කර සිටිනවා. මෙය කවදත් අම්බලන්ගොඩ නගරයට වැදගත් වෙයි ඉදිරියේදි.ඔබතුමා ප්‍රකාශ කල පරිදි බස්නැවතුම්පොළට මෙවැනි යන්ත්‍රයක් වැඩියේ අවශ්‍ය නැහැ. නමුත් එහි යම් සැකකටයුතු පුද්ගලයකු හෝ දෙයක් පරික්ෂා කරිමට අවශ්‍ය වේ.එවැනි කෙනෙකු දුටුවිට ඔහු පැත්තකට ගෙන පරික්ෂා කළ හැක.පොලිසියට භාර දිය හැක. පොලිස් මුරපලක් ඉදිකරනවා නම් මාංජු 4ක්වත් තිබිය යුතුයි. යම් පුද්ගලයෙකු යම් දෙයක් සිදු කිරිමට සැරසෙන විට මාංජු දමා ඔහු මෙල්ල කළ හැකිය. හොඳම උදාහරණය කටුවාපිටිය පල්ලියේ සිදුවු බෝම්බ ප්‍රහාරය. එම පුද්ගලයා එම පිපිරිම සිදු කරනු ලබන්නේ එම පල්ලියේ මැදට පැමිණයි. එයත් හිටගෙන තමයි එය සිදු කර ගනු ලැබුවේ. එම නිසා එහි විහිදෙන පරාසය වැඩියි.මේ උපකරණය සීමිතයි. මා මෙහි සිටින විට දුරකථන ඇමතුම් සියයක් විතර පැමිණියා. නගර සභාවට වුණත් අපි දන්නා හඳුනන අය මිසක් පිටස්තර පුද්ගලයන්ට පැමිණිමට ඉඩ දෙන්න එපා.පැමිණෙන අය පරික්ෂා කර ඇතුල් කර ගන්න. මෙය බෞද්ධ නගරයකි. අම්බලන්ගොඩ එකම බෞද්ධ නගරයයි. මේ නිසා ගරු මන්ත්‍රිවරු වන අපිට වගකිම තිබිය යුතුයි. කිසිදු මුස්ලිම් හෝ අන්‍ය අගමික දේවාස්ථානයක් නැහැ.එවැනි නගරයක වටිනාකම පෞද්ගලිකව අපිට තිබෙනවා. අපි එය ආරක්ෂා කර ගත යුතුයි. අපි එම සහායෝගය ලබා දිය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ධර්මාශෝක විද්‍යාලයට හා දේවානන්ද විද්‍යාලයට මෙය ලබා ගත හැකියි. මෙය ප්‍රජාපති විද්‍යාලයට , කුලරත්න විද්‍යාලයට හා පොල්වත්ත රෝහලටත් අම්බලන්ගොඩ නගර සභාවටත් මෙය ලබා දෙන ලෙස යෝජනා කර සිටිනවා.

**තිරණය :-**

අම්බලන්ගොඩ නගර සභාවේ අපදා කළමනාකරණ සැලැස්මේ සමස්ථ ක්‍රියාවලිය සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත්, මේ සඳහා ලබන සභාවට ගරු මන්ත්‍රිවරුන්ට යම් යෝජනා ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේ නම් එය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

<u>ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

**05.01.15** **නගර සභා බැඩ්මින්ටන් ක්‍රිඩා පිටියේ තීන්ත පිරියම් කිරීම සහා අලුත්වැඩියහා කිරීමේ කර්මාන්තය ( දෙවන අදියර ) සහා අරමුදලින් සිදු කිරිමේ යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නගර සභා බැඩ්මින්ටන් ක්‍රිඩා පිටියේ තීන්ත පිරියම් කිරීම සහා අලුත්වැඩියහා කිරීමේ කර්මාන්තය ( දෙවන අදියර ) සහා අරමුදලින් සිදු කිරිම සුදුසු බව යෝජනා කර සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තිරණය :-**

නගර සභා බැඩ්මින්ටන් ක්‍රිඩා පිටියේ තීන්ත පිරියම් කිරීම සහා අලුත්වැඩියහා කිරීමේ කර්මාන්තය(දෙවන අදියර) සහා අරමුදලින් සිදු කිරීම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.

06. කාරක සභා වාර්තා

06.01 2019.04.23 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව සහා ගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2019.04.23 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව යෝජනා කරනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**

2019.04.23 දින පැවැති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

06.02 2019.04.26. දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව සහා ගත කරන ලදි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

2019.04.26. දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

තීරණය-
2019.04.26 දින පැවැති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

06.03 2019.04.29 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.04.29 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාව යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙම ටෙන්ඩර් කමිටු වාර්තාවේ ඇතුළත් වි ඇති හිරේවත්ත පෙර පාසලේ වතුර ටැංකිය කඩා ඉවත් කිරිම සම්බන්ධ වයි. එම්.ඩබ්. සුරේෂ් ප්‍රියංකර කියන පුද්ගලයා පැමිණියා මා මුණ ගැසිමට. ඔහු මෙයට ටෙන්ඩරයක් දැම්මේ නැහැ කිව්වා. නරග සභාවෙන් දන්වා සිටියා ටෙන්ඩරයක් දමා ඇති බවත් පවසා සිටියා. ඔහු මා මුණ ගැසිමට පැමිණියේ මා ටෙන්ඩර් කමිටුවේ සිටින නිසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාත් මේ ටෙන්ඩර් කමිටුවේ ඉදලා තිබෙනවා. මා හිතුවේ නැතිව ඉදලා කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා සිටිය නිසා තමයි කතා කරන්නේ. අපි වැරදි දෙයට ඉඩ දෙන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් වෙනත් පුද්ගලයෙකු දැමු විට වෙනත් නමක් පුරවා දමන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මෙය අවලංගු කර නැවත ටෙන්ඩර් කරන ලෙස තමයි මා ප්‍රකාශ කරන්නේ. මොහු මෙය දැම්මේ නැතිනම් මෙතැනට යන්න විදියක් නැහැනේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා මේ ගැන මොකද කියන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මෙය කඩා ඉවත් කළ යුතුයි. කලින් නම් රු.28000/= ක මුදලකි. කවුරුත් භාර ගනු ලැබුවේ නැහැනේ. මෙය අයින් කළ යුතුයි. මෙහි මුදලනේ ප්‍රශ්නය වී ඇත්තේ. මෙහි පෙර පාසල් දරුවන් ඉගෙනුම ලබන ස්ථානයකි. මොනවා හරි සිද්ධියක් වුවහොත් අපි වගකිව යුතු වෙනවා. කොහොම හරි වැඩය කෙරෙන්න ඕන.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ අපේ ගරු මන්ත්‍රීතුමිය දන්නේ නැහැ මේ සඳහා යන මුදල් පිළිබඳව. මෙහි හැමර් එක ගැනිමට දිනකට රු.7000/= ක් රු.8000/= ක මුදලක් යනවා. හැමර් එකෙන් නේ කඩන්නේ. මෙය රු.20000/= ක

මුදලකට කඩා ඉවත් කළ නොහැකිය. මා දන්නේ නැහැ කවුරු මෙය දමා ඇතිද කියා. නමුත් රු20000/= කට මෙය කඩා ඉවත් කරන්න බැහැ. ටික ටික උඩ සිට හැමර් එකෙන් ගසා තමයි මෙය ඉවත් කළ යුත්තේ. මේ සඳහා පලංචි භාවිතා කළ යුතුයි. මෙය රු.20000/= ක මුදලකට කළ හැකිද කියා මා තාක්ෂණසේවා නිලධාරි මහත්මාගෙන් විමසා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මෙහි ගැටළුව වි ඇත්තේ මුදල පිළිබඳ නෙමේ. ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා මෙය ඉදිරිපත් කරනු ලැබුවේ එම්.ඩබ්.සුරේෂ් කියන පුද්ගලයා මෙය දමා නැති බවයි. අපිට මේ නගර සභාවේ යම්කිසි කොන්ත්‍රාත් දෙන විට ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා නමින් හා මාගේ නමිනුත් කොන්ත්‍රාත් දැමිය හැකිය. මේ විදියට බලාගෙන ගියාම ඔබතුමා නමිනුත් දැමිය හැකියි. සභාවක් විදියට අපි නොමග යවනවා. මා යෝජනා කර සිටිනවා නගර සභාවේ යම් කොන්ත්‍රාත්වකට ඉල්ලුම් කරනවා නම් ඔහුගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක සහතික කර මා විසින් මෙම කොන්ත්‍රාතුව භාරගත් බවට අත්සන් යොදා භාර දිය යුතු බවට. මේ විදියට අපිට හැඟියන්නේ වෙනත් පුද්ගලයන්ගේ නම් යොදා මෙවැනි දේ සිදු කරන බවයි. අර පුස්තකාලයේ පිටුපස රු.400000/= ගණනක් ගත් ඇස් නොපෙනෙන අන්ධයින් සාදන ලද වැසිකිළිය වගේ. එවැනි නොමඟ යැවීම් කරන්න ඉඩ දෙන්නේ නැහැ. අපි මෝඩයෝ නෙමේ. අපිත් අම්බලන්ගොඩ ඉපදුන පුද්ගලයෝ. මෙය වංචාවකි. මෙය කරුණාකර නැවත වරක් ටෙන්ඩර් කරන්න. ටෙන්ඩර් කරන විට මෙවැනි ටෙන්ඩර් වලදී එම ටෙන්ඩරය ඉදිරිපත් කරන පුද්ලයාගේ හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඔහු විසින් මෙම ටෙන්ඩරය ඉදිරිපත් කරන බවට සහතික කර ඉදිරිපත් කළ යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

සැපයුම් නිලධාරි මහත්මිය මේ ටෙන්ඩරය ගනු ලැබුවේ කොහොමද?

<u>ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපිට තිබෙන ප්‍රශ්නය මේ ටෙන්ඩර ලැබි ඇති පුද්ගලයා ප්‍රකාශ කරනවා නම් මේ ටෙන්ඩරය ලැබුණේ නැහැ කියා . මේ ටෙන්ඩරය ලැබුණේ කොහොමද කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නැහැ එය ප්‍රකාශ කරන්නේ නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතානේ . තවම අපිට එම පුද්ගලයා පැමිණ කියා නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නැහැ මට පැමිණ කියන ලද දෙය තමයි මා ප්‍රකාශ කර සිටියේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එතුමා සැමදාම වැඩය කරන පැත්තට නෙමේ නොකර පැත්තට තමයි කතා කරන්නේ. එම නිසා ඔබතුමා ගැන කතා කිරිමේදි සැහෙන අවිශ්වාසයක් තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඔබතුමා අපිට දොස් කියන්න එපා. අපිත් අත්සන් කර තිබෙනවා ඔය ටෙන්ඩරයට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඔයත් අත්සන් කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඕව් නිත්‍යානුකුලව ටෙන්ඩර් 3 ලැබී තිබෙනවා. ඒ පුද්ගලයා අපිට ඇවිත් ප්‍රකාශ කරනවා නම් මෙය දැම්මේ නැහැ කියා. එම නිසා තමයි මා ප්‍රකාශ කලේ එය. මට කියන්න අවශ්‍යතාවයක් නැහැ මා ප්‍රකාශ කළා නගර සභාවට ගොස් කියන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

අපි කවුරුත් මෙයට සම්බන්ධ වන්නේ නැහැ. මීට පසු ඔවැනි දෙවල් සිදු නොවෙන්න ටෙන්ඩර් නිකුත් කරන ඔබතුමිය හෝ ඔබතුමියගේ යටතේ සිටින කෙනෙක් යම්කිසි පුද්ගලයෙකු කඅමන හෝ කෙනෙක් කුමන මුදලට ටෙන්ඩර් ඉදිරිපත් කිරිමේදි එය ගෙන යාමට පැමිණෙන පුද්ගලයාගේ හැඳුනුම්පත ගෙන එම හැඳුනුම්පතේ විස්තරය පොතේ ලියා ටෙන්ඩර් පත භාර දිය යුත්තේ. එවිට මෙවැනි දේවල් සිදු වන්නේ නැහැ.මේ ටෙන්ඩර් කමිටුවේ සිටින සභාපතිතුමාත් නගර සභා මන්ත්‍රිවරුත් අප සියළු දෙනාම අපහසුතාවයට පත්වේ. මෙවැනි දේවල් වලින්. එම නිසා මෙවැනි දේවල් සිදු නොවිය යුතුයි. අපි කවුරුත් මෙයට ගැවි නැහැ. ඔබතුමියගේ අතේ ප්‍රශ්නය තිබෙන්නේ. කිසි කෙනෙක් විශ්වාස කරන්න එපා . එම ටෙන්ඩර්පත දෙනු ලබන පුද්ගලයාගේ හැඳුනුම්පතේ සඳහන් නමට ටෙන්ඩර්පත නිකුත් කරන්න. යම් ප්‍රශ්නයක් සිදු වු විට අපි ඔබතුමියට ප්‍රකාශ කරනවා ටෙන්ඩර් ඉදිරිපත් කළ පොත ඉදිරිපත් කරන්න කියා. එවිට ඔබතුමියට පුළුවන් විය යුතුයි අදාළ පුද්ගලයාට මෙය නිකුත් කළා කියා අදාල පොතා , ජාතික හැඳුනුම්පත හා විස්තර ඉදිරිපත් කිරිමට.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මේ ටෙන්ඩරය ගිය පුද්ගලයා තමයි ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට මෙය ප්‍රකාශ කර සිටින්නේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ ටෙන්ඩරය ඉදිරිපත්කළ පුද්ගලයා ඔබතුමාගේ හොඳ හිතවත් පුද්ගලයෙකි. දෙවැනියාට ඉදිරිපත් කළ පුද්ගලයාත් හිතවතෙකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙතැන තිබෙන ගැටළුව එය දිම නෙමේ. එතුමාම පැමිණ කියනවා නම් ටෙන්ඩර් කමිටුව අත්සන් කර තිබෙනවා නම් මා කිව්වා නගර සභාවට ගිහින් කියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ කිසි ප්‍රශ්නයක් නැහැ . මෙය අවලංගු කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා ප්‍රකාශ කර සිටින්නේ මේ විෂයභාර එතුමියට අවශ්‍යතාවයක් නැහැනේ මෙය බොරුවක් දමා ගැනිමට. ඩබ්.එස්.සුරේෂ්, නො 06, පොල්වත්ත පාර , පොල්වත්ත, අම්බලන්ගොඩ. මෙය අද්භූත කතාවකි.

- මධ්‍යහාන 12.00 ට ටෙන්ඩර් විවෘත කරන ලදී.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

පලමුව සොයා බැලිය යුතුයි. මෙය අවලංගු කරන එකනෙමේ කළ යුත්තේ. මෙහුට ලිඛිතව දෙන්න කියන්න මෙයා භාර ගත්තේ නැහැ කියා. ඔබතුමිය ලිඛිතව දැනුම් දෙන්න. ඔබතුමාට මේ ටෙන්ඩරය ලැබි තිබෙනවා. මෙහි වැඩ අරම්භ කරන ලෙසට දන්වා යවන්න. එසේ නැතිනම් ලිඛිතව ලබා ගන්න මට මේ ටෙන්ඩරය ලබා නොගත් බවට. ඒ අනුව කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මේ ටෙන්ඩර් කරන විට කොළඹ නගර සභා වගේ තැන්වල රු.100/= වගේ මුදලක් ගන්නවා. අපි එහෙම ගන්නේ නැද්ද ? මා ප්‍රකාශ කරන්නේ මෙයට මුදලකුත් අය කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා දැන් මට දෝෂාරෝපණය කළා. මා දැන් මුල්‍යා කමිටුවේ සහ ටෙන්ඩර් කමිටුවේන් අයින් වෙනවා. ඔබතුමාට වැරද්ද පෙන්වා දුන් විට ඔබතුමා අපේ ඇඟට එනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි වරදක් කර නැහැ . කොහෙත්ම.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මාත් ඒ ටෙන්ඩර් කමිටුවට සහභාගි වුවා.ගරු මන්ත්‍රීවරයෙක් විදියට ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා සිටින මතයට මටත් යාමට සිදු වෙනවා. එය අන්තිම ස්වාධින දෙයකි. මොකද ඒ ගරු මන්ත්‍රීවරයා විශ්වාස කිරීම අපේ යුතුකමකි.මෙහු පෙන්වා දෙන්නේ එතුමාට නිවසට පැමිණ කියන ලද දෙයයි. බොරුවක් කියනවා නෙමේ. එය පිළිගන්න වෙනවා. එතුමාගේ ප්‍රකාශය මත සිට තමයි අපිට කටයුතු කරන්න වෙන්නේ.මෙහි අවශ්‍යතාවය දැඩි නම් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා එකඟත්වයට එනවා නම් මේ නිලධාරිතුමියගෙන් වංචාවක් අකටයුත්තක් සිදු වී නැතිනම් මේ ටෙන්ඩරය එතුමා පිළිගන්නේ නැතිනම් ඊළඟ එක්කෙනාට දෙන්න වෙන්නේ.නැවත ටෙන්ඩර් කිරීමක් කරන්න උවමනා නැහැ. ඊළඟට රු.95000/= මුදලකට ටෙන්ඩරය දමා ඇත්තේ. ඔබතුමාට මේ කටයුත්ත ඉක්මනින් කර ගන්න අවශ්‍යයිනේ. කොහොමත් ටෙන්ඩර් කරන්න. තවත් එක් ප්‍රශ්නයක් තිබෙනවා. මා එය ඉදිරිපත් කරන්නම් සභාවට . මෙවැනි කරුණු වලදී තාවකාලික රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු වෙනවා තුන්වෙනි පාර්ශවයෙන්. නැතිනම් මෙය විශාල ප්‍රශ්නයකි. මෙවැනි කාර්යයක් කිරීමේදි මොනවා හරි වෙලා කවුරුහරි මියගියහොත් එහෙම පහළ සිට මෙය සිදි කරන පුද්ගලයාගෙන් අයකර ගන්නත් බැහැ. මේ සඳහා නගර සභාව වගකිව යුතු වෙනවා . එවිට එම ආවරණය එම පුද්ගලයා හෝ අප විසින් ගත යුතුයි.  මා දන්නේ නැහැ මෙය සභාව ගත යුතුද ? ඉහත කොන්ත්‍රාත්කරු ගත යුතු ද කියා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

කොන්ත්‍රාත්කරුට ගන්න කියන්න. එකත් එක්ක ගෙවීම කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

කොන්ත්‍රාත්කරුට ගන්න කියන්න. ඒම මුදලටත් එක්ක ගෙවීම් කරන්න. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතාණෙනි අපි දන්නේ නැහැනේ සිද්ධ වෙන දේවල්.උඩ සිට කඩන්නේ පහළට හැමර් ගහලා කඩන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය යලිත් ටෙන්ඩර් කළ යුතු වෙනවා. මෙහි තිබෙන ලොකුම ගැටළුව මේ පුද්ගලයාම මේ ටෙන්ඩර් දෙකම දමා රු.95000/= ගැනීමට හදනවා ද දන්නේ නැහැ. ලිඛිතව හරි කියන්න පුළුවන් මම කළේ නැහැ කියා. එයාගේ මිතුරාට රු.95000/= මෙය ලබා දිය හැකිය.මෙය ටෙන්ඩර් කළ යුතු වෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.**

ටෙන්ඩර් කළහොත් මේ සම්බන්ධව මා නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතාගෙන් විමසා සිටියේ මේ සම්බන්ධව ඒ අදාල කොට්ඨාශය භාර මන්ත්‍රීවරයා නිසා. මෙහි ප්‍රශ්නය තිබෙන්නේ ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතාට වත් අපිටවත් කාටවත් නෙමේ. මෙහි පවත්වනවා පෙර පාසලක්. මේ පෙර පාසලේ දරුවන්ට තිබෙන ඉතාම අනතුරුදායක තත්වය නිසා තමයි මෙය ඉවත් කරන්න කිව්වේ.මෙය කඩා ඉවත් කරන ලෙස මා හට මේ අය ප්‍රකාශ කරනු ලැබුවේ ජනවාරි මාසයේ.මේ සඳහා අපි ටෙන්ඩර් කළා කිහිප වතාවක්ම . දැන් මේ පස්වෙනි මාසයයි. ටෙන්ඩරය ලබා දෙන්න තින්දු වුණා. මෙහි අවධානම ඉතාමත්ම වැඩියි. එම නිසා ඒ තත්වය අපි වග බලා ගත යුතුයි. එම නිසා තමයි මා ඔබතුමාගෙන් විමසා සිටියේ මේ ගැන ඔබතුමා මොකද කියන්නේ කියා. මේ පිළිබඳ අපේ සභාවේ කිසිම සම්බන්ධයක් නැහැ. මේ කරුණු සලකා බලා නැවත ටෙන්ඩරයක් කැඳවන්න.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

මට මේ හැගෙන දෙයකි මා ප්‍රකාශ කර සිටින්නේ. සමහර විට මේ ටෙන්ඩර්කරුට කිව හැකියි මා එම ටෙන්ඩරය දැම්මේ නැහැ. මා එය ඉදිරිපත් කළේ නැහැ කියා පවසන්න. නමුත් දෙවැනි ටෙන්ඩර්කරු ඊළඟ අවස්ථාව ලබා ගැනිමට . එහෙම වෙලා තිබුණොත් එහෙම මේ නගර සභාවේ මින් ඉදිරියට ටෙන්ඩර් ලබා දිය නොහැකිය. ටෙන්ඩරය අවලංගු කරන්න. ටෙන්ඩර් කරන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ. ඊට කලින් අර තත්වය සොයා බලන්න.

**තීරණය-**

2019.04.29 දින පැවැති ටෙන්ඩර් කමිටු වාර්තාවේ හිරේවත්ත පෙර පාසල් ජලටැංකිය රඳවා ඇති කොන්ක්‍රිට් කුලුණ කඩා ඉවත් කිරීමේ ටෙන්ඩරය සඳහා නැවත මිළ ගණන් කැඳවිය යුතු බවත් , මීට පසු සිදු කරන්නා වු ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කිරිමේදි ඔහුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනිම සඳහා ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ලබා ගැනීම සුදුසු බවටත්, ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2019.04.25. දින පැවැති ක්‍රිඩා කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.**</u>

මිළඟට ක්‍රිඩා කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ජී.සරත් ශ්‍රි ලාල් මහතා කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය-**

2019.04.25 දින පැවැති ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.04.25 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභා ගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.**</u>

මිළඟට ක්‍රිඩා කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ජී.සරත් ශ්‍රි ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය කමිටුව යටතේ දෙයක් ප්‍රකාශ කිරිමට කැමතියි. මේ සභාවේ ට්‍රැක්ටර් හා ට්‍රේලර් ගැන කතා කරන විට ඒ අය ප්‍රකාශ කර සිටියා මේ සභාවේ සාදා ගත හැකි බව. නමුත් මේ සිටින ස්වල්ප කාර්මික නිලධාරින් දෙදෙනාට මේ සියළු බර අදින්න බැහැ. මා ගිය සභාවේත් මෙය ප්‍රකාශ කළා. ඔබතුමාම දන්නා පරිදි සුසාන භුමියේ ගේට්ටු දෙක වසර දෙකකට වැඩියි. කඩන් වැටි එය වසා ඇත. ගරු සභාවට එන ප්‍රධාන ගේට්ටු දෙක දෙකට නැමී තිබෙනවා. එය සාදා ගත යුතු වෙනවා. ඊළඟ වැටවල් ගණනාවක් සැදිමට තිබෙනවා. මේ සියළු දේ කරනු ලබන්නේ මේ සුළු සේවකයා තමයි මේ සියළු වැඩ කටයුතු සිදු කරන්නේ. මේ ට්‍රේලර් ගැනිම එන්ජිම් අලුත්වැඩියා කිරිම ආදි දේවල් එකම ආයතනයකින්

ටෙන්ඩර් කර ලබා ගන්නවා මිස  අපේ සිටින මේ සුළු සේවක දෙන්නා තුන්දෙනා ලවා කරවා ගන්න හදන්න එපා . ඒවා ටෙන්ඩර් කර ට්‍රේලර් පිටින්ම ගන්න. ට්‍රේලරයක් මෙහි හදනවා කියන්නේ මාස 2ක තුනකට වඩා කාලයක් ගත වෙනවා. එවිට ඒ සිටින පොඩි නිලධාරියා පයිප්පයක් පාස්ස ගන්න වත් ගැනිමට නොහැකි වෙනවා. වැඩේ වෙන්නෙත් නැහැ. මින් ඉදිරියට ඒ කාර්මික නිලධාරින් පැමිණෙන තුරු මේවා ටෙන්ඩර් කර ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. මේ අපගේ පැස්සුම් කටයුතු කරන නිලධාරින් දෙන්නා තුන්දෙනා මේ අවශ්‍ය කටයුතු සිදු කරිමට තබා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.</u>**

ඩෙංගු අවධානම් කලාපයක් ලෙස අම්බලන්ගොඩ නගරය නම් කර තිබෙනවා.මේ සඳහා ඩෙංගු උවදුර මර්ධනය කළ හැක්කේ මේ ඩෙංගු වර්ධනය කිරිමට දායක වන පුද්ගලයින් සොයා උසාවියට ඉදිරිපත් කර දඩුවම් කරන්න. පළමු වාරයේ අවවාද කරන්න. දෙවැනි වාර ඒය අස්කර නැතිනම්  දඩ ගසන්න. අපෙන් අසන්න එපා නඩු දමන්නද කියා. දැන් ඔබතුමාට බලය දී තිබෙනවා. බලතල මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට පවරා තිබෙනවා. අපේ ගාව නිතිය බුරුලක් වශයෙන් පැවතුන හොත් එය අනිත් පැත්තට පාවිච්චි කරනවා. ඩෙංගු මැඩ පවත්වා ගැනිමට සම්පුර්ණ වැඩ සටහන ක්‍රියාත්මක කර වන්න. ඒ සම්බන්ධව බාධාවක් තිබේ නම් අපට කියන්න. සභාවෙන් මොනවා ද කෙරෙන්න ඕන. මේ දිනවල මදුරු සනත්වය වැඩි වි තිබෙනවා. අපේ කොට්ඨාශයට තවමත් දූමාරන ක්‍රියා වලිය සිදු වුයේ නැහැ. අම්බලන්ගොඩ නගරයේ වෙසෙන සියළු වැසියන්ට සෞඛ්‍ය ආරක්ෂිතව සිටිමේ අවශ්‍යතාවය තිබෙනවා. එ සඳහා ඕනැම පහසුකමක් මේ සභාව විසින් සපයා දෙනවා. මේ දූමාරන ක්‍රියාවලිය සඳහා මහජන සෞඛ්‍ය මහතාට සභාව මඟින් ලබා දෙනු ලබන්නේ ඩිසල් ලීටර් 40,පෙට්‍රල් ලිටර් 10 ක් හා බැටරි කැලි 01 ක් පමණයි. එයට දමන බෙහෙත් ටික තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දෙනු ලබන්නේ. එම බෙහෙතක් තිබෙනවා නම් අපි මෙය ගසනවා. මුළු අම්බලන්ගොඩ නගරයටම. එම බෙහෙත අපි ළඟ නැති නිසා එය මහජන සෞඛ්‍ය කාර්යාලයෙන් තමයි නිකුත් කරනු ලබන්නේ. එම නිසා ජනතාව ගැන සිතා සම්පුර්ණ වැඩ කටයුතු සිදු කරන්න. අපි සහාය ලබා දෙන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපගේ ප්‍රදේශයේත් ඩෙංගු රෝගින් කිහිප දෙනෙකු වාර්තා වුණා. ජනතාවගේ එකම ඉල්ලිම මෙන්න මේ දුම. අපට මේ සඳහා ප්‍රමාණවත් යන්ත්‍ර නොමැතිනම් අපට අවස්ථාව තිබෙනවා ද ආසන්න නගරයෙන් මේ යන්ත්‍ර ලබා ගැනිමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.</u>**

දැනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ තිබෙන්නේ යන්ත්‍ර 2ක් පමණි. අපි ළඟ එකක් තිබෙනවා. එවිට යන්ත්‍ර 3 ක් තිනෙවා. මේ සඳහා යන්ත්‍ර මදිනම් අපි මුදල් දී ලබා දෙන්නම්. ඩෙංගු රෝගින් කෙරමිණිය ප්‍රදේශයෙන් වාර්තා වී තිබෙනවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඩෙංගු උවදුර ගැන කතා කරන විට මට මතකයි එක සභා රැස්විමකදි ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළා මේ අපේ කාණු පද්ධතිය වසර 75 කට 50 කට පෙර නිර්මාණය කරන ලද ඒවා. ඒ වායේ කාණු පතුල් ඔක්කොම දියවෙලා තිබෙන්නේ. ඒවායේ සිමෙන්ති ටිකක් දමා නැවත පිළිසකර කළ යුතු බවට යෝජනා කළා. එහෙම කළාද ? නැද්ද කියා මා දන්නේ නැහැ. මා නගරයේ ගමන් කරන විට මාගේ හිතවතුන් පවසනවා මාර්ගයේ කසළ තිබෙනවා නම් එය කාණුවට දමා යන තත්වයක් තිබෙනවා කියා. මා සෞඛ්‍ය සේවකයින්ට චෝදනා කරන්නේ නැහැ. මා හිතුවා මට එන චෝදනාව බැහැර කරන්නත් බැහැ. මදුරු හැදෙනවා නම් දුම ගසනවා. එය මදුරුවාටත් අහිතකරයි. අපිටත් අහිතකරයි. මේ

දෙය හැමදාම කරන්න බැහැ. කාණු පතුල් ටික සකසා ජලය ගලා බසින ක්‍රමයක් හදනවා නම් මේ උවදුර යම් ප්‍රමාණයකින් අඩුවෙයි කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.</u>**

මෙහිදි මා මතක් කළ යුතු වෙනවා කාණු වල සමහර කාණු තිබෙන්නේ මධ්‍යම රජය යටතේ තිබෙන කාණු . ගාලුපාර , පරණ පාරේ තිබෙන ඒවා සම්පූර්ණ තිබෙන්නේ මධ්‍යම රජයේ. දුම්රියපොළ පාර මධ්‍යම රජයේ.පළාත් සභාව යටතේ තිබෙන කාණු පද්ධතිය තමයි පරණ සිංගර් ගොඩනැගිල්ල සිට වතුගෙදර මාර්ගයදක්වා තිබෙන කාණු පද්ධතිය. වික්‍රමසූරිය පාරේ සිට බටපොළ පාර දක්වා තිබෙන කාණු පද්ධතිය පළාත් සභා යටතේ තිබෙන්නේ. එම කාණු පද්ධති අලුත් වැඩියා කිරිමේ හැකියාවක් නැහැ. ප්‍රශ්න තිබෙන්නේ ඔය අතර තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ බරවා මදුරුවා දන්නේ නැහැ මෙය පලාත් සභාවේද ? මධ්‍යම රජයේ ද කියා මදුරුවා දන්නේ නැහැ. එහි විනාශය සිදු වන්නේ ජනතාවට

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.</u>**

එය ඇත්ත . එයට මුදල් වියදම් කිරිමේ බලය තිබෙන්නේ එම ආයතන වලට පමණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එසේ නම් මේ ඩෙංගු උවදුර ගැන කතා කර වැඩක් නැහැ මේ සභාවේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒපි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රිතුමා ප්‍රකාශ කළ ආකාරයට අපට බලය නැති දෙයක් කළ නොහැක. තවදුරටත් කතා නොකර ඉන්න බැහැනේ. එය කතා කළ යුතුයි. මෙය උවදුරක්නේ. මේ සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂක මහතාට උපදෙස් ලබා දෙන්න නිවෙස් වල තිබෙනවා නේ ඔය ප්‍රශ්නය. පොදු කාණු නෙමේ. එවායේ ප්‍රශ්නය තිබෙන්නේ මධ්‍යම රජයද පළාත් සභාද කියන එක. සාමාන්‍ය ගෙවල් වලත් ඔය ප්‍රශ්නය තිබෙනවා. දැන් උසාවියේ වෙනදා නඩු දැම්මා. අධිකරණයට වෙනදා සතියකට නඩු දෙක තුනක් පැමිණෙනවා. අනිවාර්යෙන්ම නිවෙස් වල කාණු පද්ධති වල ජලය රැදෙනවා නම් මහජන සෞඛ්‍ය පරික්ෂක තුමනි, අනිවාර්යෙන්ම අධිකරණයට ඉදිරිපත් කරන්න. නැතිනම් මෙය අවසානයක් වෙන්නේ නැහැ. මේ සඳහා ජනතාව තර්ක විතර්ක ගෙනෙනවා. මේ ජනතාව එක්කෙනෙකුට දෙදෙනෙකුට පාඩමක් ඉගැන්නුවා නම් අනික් අය ඒ පාඩම ඉගෙන ගන්නවා. ඔය පොදු කාණු ගැන මා මෙතැන සාකච්ඡා කරන්නේ නැහැ. මොකද මත ගැටුම් ඇති කර ගන්න මේ සභාවේ කිසිම ගරු මන්ත්‍රිවරයෙක් මන්ත්‍රිවරියක් සමඟ. මා පවසන්නේ නිවෙස් වල ජලය බස්සන ස්ථාන වල ජලය එක්රැස් වී පල් වෙවී තිබෙනවා. අප ප්‍ර දේශයේ එක් පුද්ගලයෙකු සත්භවයෙන් කරනලද දෙයට වතුර පොල්කටුවක් තිබුණා කියා නඩු දැම්මා. කුරුල්ලන්ට වතුර දමන පොල්කටුවක ඩෙංගු මදුරුවෙකු සිටියා කියා. නිවෙස් වල කාණු වලට ජලය බස්සන ස්ථාන තිබෙනවා.ඩෙංගු උවදුර මැඩලිම සඳහා අප සියළු දෙනාම එක්ව නැඟී සිටින ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඔබතුමාට මොනවා හරි සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඩෙංගු උවදුර මැඩලිමට අවශ්‍ය යම් අවශ්‍යතාවයක් තිබේනම් එය ඉදිරිපත් කරන්න. එය ලබා දෙන්නම්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මේ කසළ එකතු කිරීම මනාව ඔවුන්ට තිබෙන පහසුකම් අනුව සිදු කරනවා. නමුත් මේ කසළ ගෙන ගොස් දමන ස්ථානය. මොන්ට්‍රිරියා වත්තේ තිබෙනවා කසළ කොම්පොස්ට් කරන ස්ථානයක් සකසා තිබෙනවා. දැන් මෙයට වැඩපිළිවළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න. දැන් අප සභාවට තේරී පත්වී වසරකුත් ගෙවී අවසන්.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.**</u>

දැනට මොන්ට්‍රිරියා වත්තට භාර ගන්නේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

දැන් භාර ගන්නවා. මා මෙය ඊයේ දිනයේදි අසුවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.**</u>

කවදා සිටද ? භාර ගන්නේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

හල්වත්රේ ජනතාවට ආහාර ගැනිමට බැහැ. මැස්සෝ වහනවා. මා හිතන්නේ දුක් ගැනවිලි පැමිණෙනවා ඇති. අපි හරි වියදම් කර කොම්පොස්ට් පොහොර සෑදීම සිදු කරන්න. කලින් තල්ගස්ගොඩ කොම්පෝස්ට් පොහොර හදන ස්ථානයක් තිබුණා. නැතිනම් එය හරි ක්‍රියාත්මක කරන්න. මොකද දැන් මෙහි කසළ එකතු කර දමන එක නෙමේ වැඩේ. මේ කසළ දමන ස්ථානයට පස් දමනවා. වියදම් කරනවා. ඒ වැයකරන මුදලින් පුළුවන් කොම්පොස්ට් පොහොර හදන ස්ථානයක් සාදා ගන්න. දැන් ප්ලාස්ටික් විකිණීමට පුළුවනි, විදුරු විකිණීමට පුළුවනි. පොලිතින් වර්ග විකිණීමට පුළුවනි. ඒ සඳහා සේවකයන් හරි යොදවන්න. දැන් මේ කසළ එකතු කිරීමට කොපමණ මුදලක් වියදම් වෙනවාද? මේ හල්වතුරේ මහජනතාවට විශාල පරිසර ගැටළුවක් ඇතිවන ස්ථානයකි. එසේම ඇළ බැලුවාම ජලය කළු පාටයි. පසුගිය දිනක ඇවිදින මංතිරු විවෘත කිරීමට ගිය අවස්ථාවේ ජලය කළුපාට ඇයි කියා විමසා සිටියා. එයට මොකද හේතුව. මේවා සොයා බලා විසඳුම් දිය යුතුයි. මහජනතාවට සෞඛ්‍ය ගැටළු එන ස්ථාන අඩුකිරීම අපගේ වගකීම හා යුතුකම වේ. මේ සඳහා විශාල මුදලක් වැය වු වත් මේ කොම්පොස්ට් පොහොර හදන ස්ථානයක් සාදන්න. ඩෙංගු හෝ බරවා හෝ බෝවන්නේ මදුරුවෙකුගෙන්. මදුරුවන් බෝවිය හැකි ස්ථාන මේවා. මේ මුදල් වියදම් කළත් එහි ප්‍රතිඵලයක් තිබෙනවා. අප නගර සභාවට. ඒ වැයකරන මුදල් විශාල ප්‍රමාණයක් ඉතිරි වෙනවා. තල්ගස්ගොඩ කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය නැවත ඇති කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අර ඇළ ගැන ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා ප්‍රකාශ කළ ආකාරයට අපේ සම්බන්ධිකරණ කමිටු රැස්වීමේදි මා පොරොක් ඇළ ගැන කතා කළා. ඒ වෙලාවේ සභාපතිත්වය දැරුවේ විපක්ෂ නායකතුමා . එතුමාත් දැඩිව ප්‍රකාශ කළා පළාත් වාරිමාර්ගයට මෙයට වහාම ක්‍රියාත්මක වන ලෙස. එදිනම ඔවුන් මෙහි පැමිණ බැලුවා.

- ගරු සභාපතිතුමා පස්වරු 12.15 ට සභාවෙන් නික්ම ගිය බැවින් මුලාසනයට ගරු උප සභාපතිතුමා පැමිණියහ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**</u>

මා ඔවුන්ට මගේ පුද්ගලික වියදමින් ඔරුවක් ගෙනත් දී සංග්‍රහ කර පොරොක් ඇළේ මට්ටම් ගැනිමට උපකාර කළා. මේ සඳහා ඉංජිනේරුවරු නිලධාරින් දෙතුන් වතාවක් පැමිණියා. එය බැලුවා අපි මුදල් වියදම් කර සංග්‍රහ කළා. එතැනින් පසු සම්බන්ධිකරණ කමිටු රැස්වීම් වලට අපට ආරධනා කළේ නැහැ.

එතැනින් එහාට කිසිම දෙයක් සිදු වුයේ නැහැ. අද වනවිට පොරොක් ඇළට එදාට වඩා දරුණු තත්වයක් ඇති වී තිබෙනවා. කළුපාටට ජලය පැමිණෙනවා. මා මහජන සෞඛ්‍ය මහතාට පෙන්නුවා. එතුමාටත් කරන්න දෙයක් නැහැ. අපිත් බලනවා මේ කළු වතුර ටික වැටෙන්නේ කොහෙන්ද කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

මෙය මහ පුදුම කතාවකි. ඔබතුමා වැසිකිළි වලවල් චෙක් කළාද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

ගරු උපසභාපතිතුමනි, මේ පෝරඹ ඇළ හා දැන් කුණු දමන්නේත් එම ස්ථානයේ නිසා ලොකු පාරිසරික ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මෙතුමා නැගුවා ප්‍රශ්නයක් . දැන් මෙතුමා නැගුවා ප්‍රශ්නයක්. මා මෙය වාර්තා කරන ලෙස මධ්‍ය වාර්තාකාර කටයුතු කරන මහත්මාගෙන් මා ඉල්ලා සිටිනවා මෙය වාර්තා කරන ලෙස. මොකද මෙය දැනගත යුතුයි වගකිව යුතු සියළු දෙනා. ඇත්තටම දැන් 2018 ඔක්තෝම්බර් මාසයේ සිට සංවර්ධන කමිටු ක්‍රියාත්මක නැහැ.මේ කමිටුව මඟින් අම්බලන්ගොඩ නගරයේ යම් යම් තින්දු තීරණ ගනු ලැබුවා . අද එය ක්‍රියාත්මක වී තිබෙනවා. මේ පිළිබඳව මට ඉහළ පුළුවන් අයට දැනුවත් කරනවා. දැන් මෙතුමා නැගු ප්‍රශ්නය. එදින ගරු ප්‍රධාන අමාත්‍යතුමා හිටියේ නැහැ. මෙතුමා එම ප්‍රශ්නය නැගු විට වාරිමාර්ගයේ ඒ නිලධාරියා නැගිට්ටමවා මා එය එතුමාට කරන්න කිව්වා. හැබැයි එතුමා ඒ එක්කම ක්‍රියාත්මක වුණා. දැන් අද මේ ප්‍රශ්නය වෙන්නේ නැහැ සංවර්ධන කමිටුව තිබුණානම්.එසේ නම් එදා ඒ බැලුවා සමානව මේ කටයුත්ත සිදු කරනවා.

- ගරු සභාපතිතුමා පස්වරු 12.20 ට පමණ නැවත මුලාසනයට පැමිණියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>

එහෙනම් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන්න තිබුණා. අද ඒ තත්වය නැති වුණා. කුමන හේතුවක්ද එයට පාදක වුණේ කියා ගැටළුවකි.සංවර්ධන කමිටු බලපා ඇත්තේ ප්‍රදේශ කිහිපයකට පමණි. සංවර්ධන කමිටු හරහා වගකිව යුතු ගරු සභාපතිතුමා ගරු මන්ත්‍රීවරු ආදී වගකිව යුතු සියළු දෙනා වාඩි වෙනවා. තම තමන්ගේ කොට්ඨාශ වල තිබෙන යම් ගැටළු සාකච්ඡා වෙනවා. ඒවාට පිළියම් ගන්නවා. ඒවා අඩපණ වුණාම ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට අම්බලන්ගොඩ නගරය අවදානම් නගරයක් වී තිබෙනවා ඩෙංගු වලින්. 2017 වසරේ දකුණු පළාතේ වැඩිම ඩෙංගු මරණ ප්‍රමාණයක් සිදු වුයේ අම්බලන්ගොඩ නගරයේ. අපි කියන්න ලැජ්ජා විය යුතුයි. මෙච්චර බුද්ධිමතුන් සිටිනා නගරයකි. එම නිසා එය පරිපාලනය කර ගැනීමට නොහැකි වීම අපේ දුර්වලතාවයකි. අපි ඒ ගැන කනගාටු වෙනවා. ඔය පෝරඹ ඇළේ අපි පුංචි කාලයේ දැක්කේ හොඳ පිරිසිදු ජලය. දැන් ඇයි මෙසේ සිදු වුයේ ඇයිද කියා සොයා බැලිය යුතුයි. ඒවා ඇත්තටම නිවැරදි විය යුතුයි.මේවා වගකිව යුතු නිලධාරින් විසින් විසඳිය යුතුයි. සමහර දේවල් නගර සභාවටම විසඳිය නොහැක. ඒවාට පළාත් සභාවේත් මධ්‍යම රජයේත් මැදිහත් වීම් අවශ්‍යයි. අදාල බලධාරින් ඒ පිළිබඳව අවධානය යොමුකර මේ පිළිබඳව සොයා බැලිය යුතුයි. මේ තත්වය මග හරවා ගැනීමට අදාල ආයතන සියල්ලගේම සහාය ලබා ගැනීමට මේ පිළිබඳව ලිඛිතව දැනුම් දෙන ලෙස ඉල්ලා සිටිනවා.2017 වසර වගේ 2019 වසරේ එම මළ ගෙවල් වලට සහභාගි වීමට නොවේවා කියා ප්‍රර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ මෙයට මුලික ප්‍රශ්නය වී ඇත්තේ මාදම්පා ගඟේ රොන්මඩ තැන්පත් වීම.නිසායි. මෙය කලාන්තරයක් තිස්සේ කලානුරූපිකව සිද්ධ වෙන දෙයකි. පසුගිය කාලයේත් මෙවැනි තත්වයක් ඇති වු මෝය ප්‍රදේශය වාරිමාර්ග නිලධාරින් ලවා පරික්ෂා කරවනු ලැබුවා. දෙල්දුව පාර හදද්දී එම ප්‍රදේශය සුද්ද කරනු ලැබුවා.ඒ කාල වකවනුව තුල මෙය ඉතා පිරිසිදුව තිබුණා. මුහුදට ගලා බැස්සා. සමහර ස්ථානවල ගඟේ අඩියකට 1 ½ වැඩිය රොන්මඩ එකතු වී තිබෙනවා.මේ හරියේ ජලය ඉන් එහාට බසින්නේ නැහැ. හල්වතුරේ මැද හරියත් දෙල්දුවේ පාලම හරියේත් ගඟේ ජලය බැස යන්නේ නැහැ.ඒ හරියේ අඩි 1 ½ විතර රෝන්මඩ. එමනිසා මෙය දෝලනය වී තිබෙනවා. එම ජලය පල් වෙනවා. මේ ජලයේ මදුරු වසන්නේ නැතිව තිබෙන්නේ කරදිය මිශ්‍ර වීම නිසා. නැතිනම් මේ ඇළේ ජලයේත් මදුරුවෝ බෝ වෙනවා. එතරම් ජලය පල් වෙනවා. එයට වාරිමාර්ග සමඟ සකච්ජා කර රෝන්මඩ සම්පුර්ණ ඉවත් වන විදියේ ක්‍රමවේදයක් සැදිය යුතු වෙනවා. දෙල්දුවේ අලුත් පාලමයි හල්වතුරයි අතරේ ඇති ප්‍රදේශයයි. ගඟේ තිබෙන රොන්මඩ ප්‍රමාණය වැඩියිනේ . එම නසා තමයි එය අතහැර දමා තිබෙන්නේ. එතැන සුද්ද කළ යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එය මේ වනවිට ක්‍රියාත්මක වුණා. ඒ අයට ඔරුවක් ගන්න බැහැ කියා තිබුණා. මේ කෙළවරේ සිට ගඟට යනකම්ම මට්ටම ගනු ලැබුවා. එතැනින් පසු කිසිම ක්‍රියාත්මක වීමක් සිදු වුයේ නැහැ. ඉංජිනේරුතුමා ඇවිත් ගියා. ඒ අයට

ප්‍රතිපාදන නැහැ කිව්වාම අපි ප්‍රතිපාදන සැපයුවා පුද්ගලිකව. ඔරුවක් ගෙනත් දුන්නා . මිනිසුනි දුන්නා. සියල්ලම කළා.ඉංජිනේරු මහතාත් ගෙන්වුවා. ප්‍රවාහන පහසුකමුත් ලබා දුන්නා. මට්ටම ගත් තැනින් නතර වුණා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.**

මා හිතන්නේ මෙය වාරිමාර්ග විශේෂඥයන් ලවා කළ යුතුයි. අපි සැමදාම කළේ ඇළවල් ටික සුද්ද කරනවා . ගඟ සුද්ද කරලා නැහැ.මෙහි කලින් දැක්ක බාධකයක් තමයි මහ අම්බලන්ගොඩ සිට ගොඩහේන පැත්තට වෙන්න වෙනදා තිබිලා තියෙනවා ලී පාලමක්. එම ලී පාලමේ කණු ගඟ මැද්දේ තිබුණා. ඒ ටික අපි අයින් කළා. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු මහත්වරු ප්‍රකාශ කරන්නේ දැනට ගඟේ වතුර මට්ටමත් මුහුදේ ඇති වතුර මට්ටමත් අතර ඇත්තේ අඟල් 6ක පමණ වෙනසකි. අපි වැඩියේ හැරුවොත් සිදු වන්නේ මුහුදේ තිබෙන වතුර ගොඩබිමට පැමිණ නිසරුභාවයට පත් වේ යන සැකය ඒ අය ළඟ තිබෙනවා. මෙය හරියටම ඉවත් වන්නේ විශාල ගං වතුරකින් තමයි මෙවා සුද්ද වෙන්නේ.ලොකු ගංවතුරකින් තිබෙන මඩ ටික සෝදාගෙන යාම තමයි සිදු වන්නේ. ස්වභාවික ක්‍රමයකට මෙය සිදු විය යුතුයි. වෙන ක්‍රම වේදයක් නැහැ. මා මේ තත්වය දුටු නිසා මා යෝජනා කළා ප්‍රාදේශිය ලේකම්ට ගඟේ වැලි හැරීමට බලපත්‍රයක් නිකුත් කරන ලෙස. වැලි ගොඩ දැමීමේ රක්ෂාව කරන අයට බලපත්‍ර නිකුත් කරන ලෙස. මෙයින් රජයටත් යම් ආදායමක් ලැබෙනවා. මේ කොටස හැරීමෙන් රෝන්මඩ ඉවත් වන නිසා. එම කාර්යය තවමත් සිද්ධ වුයේ නැහැ. ඉදිරියට කළ යුතු වැඩකි. ස්වාභාවිකම ඉවත් වීමේ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුයි.

**තීරණය-**

2019.04.25 දින පැවැති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 06.06 2019.04.04 දින පැවති විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධ කමිටු වාර්තාව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.**

2019.04.04 දින පැවති විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධ කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී පී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිර කර සිටිනවා. එහි තිබෙනවා රු.1000ට වැඩි ප්‍රවේශ පත්‍ර සඳහා 15%කුත් රු.3000ට වැඩිනම් 25%කුත් කියන ඒ කොටස විතරක් සංශෝධනය කරන්න කියා මා ප්‍රකාශ කරනවා.රු.1000/= දක්වා 10%කුත් රු.1000 ට වැඩිනම් 15% යන පොදු ප්‍රතිශතයකට යන්න කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්.**

ඒ කියන්නේ රු.1000/= ට වැඩි ප්‍රවේශ පත්‍ර සඳහා 15%කුත් අයකරීමට . කමිටු තීන්දුව ගෙන ඇත්තේ මෙයයි. ගරු මන්ත්‍රීවරුන්ට දැන ගැනිමට ප්‍රකාශ කරන්නේ.රු.1000 ප ප්‍රවේශ පත්‍ර සඳහා 10%කුත් රු.1000 සිට 3000 දක්වා ප්‍රවේශ පත්‍ර සඳහා 15%කුත් රු.3000ට වැඩ ඒවාට 25% ක ප්‍රමාණයකතුත් අයකිරීමට තීරණය කර ඇත. මේ කමිටුව සඳහා පාදක කරනු ලබන කරුණු තිබෙනවා. එම කරුණු මා දක්වන්නම්.මේ සම්බන්ධව 1946 විනෝද බදු ආඥා පණත අනුව සභාව ගැසට් කර තිබෙනවා 1947.05.30 දින 97.08 කියන ගැසට් පත්‍රය මඟින් මිළ ගණන් තින්දු කර තිබෙනවා. ඒ අනුව සභාව විසින් අයකිරීම සිදු කර තිබෙන්නේ ශත19 - සිට ශත 50 දක්වා ශත 5 ක් අයකිරීමටත් ශත 50 සිට රු.1.00 දක්වා ශත 10ක් අයකිරීමටත් රු.1.00ට වැඩිනම් රු.2.50 දක්වා ශත25.00 ක් අයකිරීමටත් රු 2.50 සිට රු.3.50 දක්වා ශත 50ක් අයකිරීමටත් රු.3.50 සිටරු.4.50 දක්වා රු.1.00 දක්වා අයකිරීමටත් රු.5.00 ට වැඩි වන

ඒවාට 25% ක මුදලක් අයකිරීමටත් තින්දු කර තිබෙනවා.ඒ අනුව මේ අවට තිබෙන පළාත් සභා ආයතන වල විනෝද බදු අයකිරීම පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කර අත. ජාඇල නගර සභාව 25% කුත්, බදුල්ල මහ නගර සභාව,දඹුල්ල මහ නගර සභාව , කෑගල්ල නගර සභාව, මොරටුව මහ නගර සභාව ආදිය 25% ක මුදලකුත් මේ වනවිට ගෝමරන්කඩවල ප්‍රාදේශිය සභාව , මහර ප්‍රාදේශිය සභාව, තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව, වත්තේගම ප්‍රාදේශිය සභාව 20% ක් අයකරිමයි. වැලිමඩ ප්‍රාදේශිය සභාව 15% මුදලක් අයකරනු ලබයි. පස්සර ප්‍රාදේශිය සභාව 12% ක් අයකරනවා. බලපිටිය, අකුරැස්ස , ප්‍රාදේශිය සභා, හම්බන්තොට මහ නගර සභා , වැලිවිටිය දිවිතුර ප්‍රාදේශිය සභාව,හික්කඩුව නගර සභාව , අක්මීමන ප්‍රාදේශිය සභාව 10% ක මුදලක් අයකරනවා.අත්තනගල්ල ප්‍රාදේශිය සභාව රු.100 නොයික්මවන ඒවාට 15% ක මුදලකුත් රු.100-5000 අතර නම් 25% ක මුදලකුත් වැලිගම නගර සභාව 7.5% ක මුදලකුත් අයකරනවා. ඒ අනුව තමයි මේ ගැන සලකා බලා මේ මුදල තින්දුකරනු ලැබුවේ.අපේ නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතාගේ යෝජනාවට යම් සැලකිල්ලක් කිරිමට_ සිදු වෙනවා.එතුමා ප්‍රකාශ කර සිටින්නේ මේ රු.3000 ප්‍රවේශ පත්‍ර 50 ක් වගේ විකිණේන්නේ. එම නිසා මෙවැනි පාසලක් කරන අයට තිබෙන වාසියක් ඒ ගැන සලකා බලා යම් සාධාරණයක් බලා 15% ක් කරන්න ඕන.රු.1000/= ට දක්වා 10% කුත් රු1000/= වැඩි වන ඒවාට 15%කුත් අයකරන ලෙසයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතුතුමනි, එදා කමිටුවේදි මේ ගැන සලකා බලා තමයි තීරණය ගනු ලැබුවේ. ඇයි නැවතත් මේ කමිටුව ගනු ලැබු තීරණය වෙනස් කරන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.</u>

ගරු මන්ත්‍රිතුමනි, සරත් ශ්‍රී ලාල් මහතා මේ කමිටුවේ හිටිය කෙනෙක් නෙමේ. එවිට එතුමාටත් යම් චෝදනාවක් , අදහසක් තිබේනම් ඉදිරිපත් කරන්න.අයිතියක් තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

මම නම් කමිටුවේ හිටියා. මා එතුමාගේ අදහස ප්‍රතික්ෂේප කරනවා නෙමේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්.</u>

එතුමා පැවසුවේ සමානොයයෙන් රු.5000/= ටිකට් මුද්‍රණය කරනු ලබන්නේ 50ක් විතර තමයි. බොහෝ වේලාවට පාසල් වල එම මුදල පියවා ගනු ලබන්නේ එම ටිකට් පත් වලිනි. මෙය නිදහස් කරනවාට වඩා ඒ වාසිය ඒ අයට ලබා දෙන ලෙසයි ඉල්ලා සිටින්නේ. මෙහිදි අප බැලිය යුතුයි අපි අයකරනවාට වඩා පාසල් වල මෙම කටයුතු සංවිධානය කිරිමේදි ප්‍රායෝගික අත්දැකිම එතුමාට තිබෙනවා. එතුමා ඒ මත තමයි මේ යෝජනාව කරනු ලැබුවේ. එය පිළිගන්නවාද නැද්ද කියන එක සභාවේ තින්දුවකි.

<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

අපි කමිටුවක් විදියට රැස්වෙලා ඒ ඒ මුදල් වල බර බලලා සාකච්ඡා කර තමයි මේ තින්දුවට පැමිණියේ.ඔබතුමලා කමිටුවේ තීරණය නොසලකා මෙය වෙනස් කරනවා නම් අපි නිහඩව ඉන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු නගර සභා මන්ත්‍රි සරත් චන්ද්‍ර මහතාණෙනි ඔබතුමා වැරදි අකල්පයට යන්නේ. මේ කමිටුවල ගනු ලබන තින්දු සභාවට දමා තමයි අනුමත වෙන්නේ. එතැනදි තින්දු ගන්න බැහැ. කමිටු වලදි කරනු ලබන්නේ යෝජනා කරන එකයි. ඕනැම කමිටුවක් ත්‍රිරෝද රථ කමිටුව , සේඛා කමිටුව වේවා යෝජනා කරන එකයි සිද්ධ වෙන්නේ. කමිටු විසින් තමයි මෙය තීරණය කරනු ලබන්නේ. එම කමිටු යෝජනාව

12කු කැමති විය යුතුයි එය සම්මත වීමට.මෙහිදි මා ප්‍රකාශ කරනු ලැබුවේ මෙයට එකඟවීමක් නෙමේ. මේ පිළිබඳව සංශෝධනයකි. නැතිව විරුද්ධ වීමක් නෙමේ. ඉන් අදහස් වන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි මේ කමිටුව ගන්නා ලද තින්දුව ඒ ආකරයෙන්ම අනුමත වෙනවා කියා. මොනම කමිටු වාර්තාවක් වත් එහෙම අනුමත විය යුතු නැහැ. ඔබතුමාටත් අයිතිය තිබෙනවා. මටත් අයිතිය තිබෙනවා. ඔබතුමා මේ කමිටුවට සහභාගි වුවත් ඔබතුමාට අයිතිය තිබෙනවා මේ කමිටුවට නැවත සංශෝධන ගෙන එමට. ඒ අයිතිය ප්‍රකාර දෙයකි මේ සිදු වන්නේ. එහෙම නැතුව ඔබතුමාලා ගන්නා ලද තින්දුව වෙනස් කිරිමද් කියන මතයට යන්න එපා. එකනෙමේ මෙතැනදි සිදු වන්නේ. මා මේ කමිටුව නියෝජනය කළේ නැහැ. එතකොට මට අවස්ථාවක් නැහැ මේ ගැන අදහසක් දැක්විමට. මට තියෙන අවස්ථාව තමයි මේ. මෙහිදි මා ප්‍රකාශ කරනු ලැබුවේ මට තිබෙන අත්දැකිම අනුව දැනුම අනුව මෙන්න මේ ප්‍රශ්නය පැන නැගෙනවා  මෙය මෙන්න මේ ආකාරයෙන් නිවැරදි කිරිමට මේ ආකරයෙන් සංශෝධනය කිරිමට හැකි නම් හොඳයි කියා. එතැනදි ගරු මන්ත්‍රීවරු විරුද්ධනම් එය ඉවත් වෙනවා. නිවැරදි නම් එකඟ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

සභාව තින්දු කරනවා නම් මා එයට එකඟ වෙනවා. /ගැටළුවක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා කිවු පරිදි ඇත්තටම ප්‍රධාන පාසල් ටිකේ හෝ තුමන පාසලක රු.3000/=,රු.5000/= ප්‍රවේශපත්‍ර ඉතාම සිමිත සංඛ්‍යාවකි. එයින් තමයි ඔය කරන මොකක්හරි එකක ලාභය තිබෙන්නේ. ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා ප්‍රකාශ කළ පරිදි මෙය අපි රු.1000/= සිට රු.3000 දක්වා  15% ක් කර තිබෙනවා. එක්කෝ රු.1000 සිට ඉහළට යන ඕනෑම ප්‍රවේශපත්‍රයකට 15% වගේ ගණනක්. එක ගණනක්. ඒ විදියට ලබා දුන්නාට නගර සභාවට අහිතක් වන එකක් නැහැ. හැබැයි මෙච්චර සහන ලබා දුන් පසු විනෝද බඳ නිදහස් කිරිමට බැහැ. විනෝද බද්ද නිදහස් කරනු ලැබුවොත් අපට නගර සභාවට තිබෙන ආදායමක් නැති වෙනවා. ඒ වගේ සුවිශේෂිතාවයකදි ගරු සභාවේ එකඟතාවය මත නිදහස් කරනවා මිසක් එහෙම නැතුව නිදහස් නොකරයි. මේ සංශෝධනයට කවුරුත් විරුද්ධ වන එකක් නැහැ. මෙය නිදහස් කිරිමේන් නගර සභාවට ලැබෙන ආදායමක් නැති කර ගැනිමට සිදු වන නිසා එයට එකඟ විමට බැරිය.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මට යෝජනා කිරිමට සිදුවෙනවා එක පාසලකට විතරක් විශේෂ කරන්න එපා විනෝද බදු නිදහස් කිරිම. එහෙම නිදහස් කරනවා නම් හැම පොදු පාසලකටම හැම පුණ්‍ය ආයතනයකටම නිදහස් කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ මේ සභාව විසින් එහෙම කර තිබෙනවා. එහෙම නොකර නැහැ. දැන් ඔය දේ අපි සිරස කඩ මණ්ඩිය කරන විට දේවානන්ද විද්‍යාලයට නිදහස් කළා. ප්‍රජාපති විද්‍යාලයට කළා. ගා/පී ද එස් කුලරත්න විද්‍යාලයට කළා. එහෙම හැම පාසලකටම කළා.ඔය විද්‍යාල වලට ඉල්ලීම පරිදි සිදු කරනවා.

**ගරුඋප  සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා එදත් මෙයට මගේ විරෝධතාවය කමිටුවේදි ප්‍රකාශ කළා. මාත් එම කමිටුවට සහභාගි වුණා. දැන් අපි විනෝද බද්ද 5% දක්වා අඩුකරත් ඔය පාසල් වලට විනෝද බද්ද නිදහස් කරනවා. පාසල් වලින් ඉල්ලිම කළ විට මේ ගරු සභාවේ සැම ගරු මන්ත්‍රීවරයෙක්ම පැහැර හරින්නේ නැහැ. එය නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා. මා එදත් ප්‍රකාශ කරනු ලැබුවේ මෙය පොදු කටයුතු වලට නිදහස්

කරන බව. හැබැයි සභාවට ආදායමක් ලැබෙන්නේ කවුරුහරි පෞද්ගලික කෙනෙක් මෙය සිදු කළහොත් පමණි. මා ප්‍රකාශ කරන්නේ මෙය තිබෙන තත්වයේම තබන ලෙසයි. කමිටුව ගත් තීරණයට මා එකගතාවය ප්‍රකාශ කර මා නිහඩ වුණා. අපි මෙය 5% නෙමේ 1% ගෙනාවත් එම 1% ගාස්තු මුදලත් නිදහස් කරනු ලබනවා. මොන පාසල ගෙනාවත් මොන පුණ්‍ය ආයතනය ගෙනාවත් නිදහස් කරනවා. හැබැයි කවුරුහරි ව්‍යාපාරිකයෝ කරනවා නම් තමයි ඔය 25%ක මුදල ලැබෙන්නේ. එයත් කවුරුහරි මොනවහරි දෙයක් ඉදිරිපත් කළ විට නිදහස් කරනවා. මා එදත් මේ මුදල අඩුකිරිම සම්බන්ධව විරුද්ධ වුවා. මෙය තිබු ආකාරයට තබන්න. ඒ මගේ මතයයි. සභාව ගන්නා ලද තින්දුවට එකඟයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ සඳහා ඡන්ද විමසිමක් අවශ්‍යද ?

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ඔයට ක්‍රමවේදයක් අනුගමනය කළානේ . එම ක්‍රමවේදය අනුගමනය කළානම් ඉවරයි. සියළු දේ නිදහස් කර බැහැ. නගර සභාවටත් යම් ආදායම් මුදලක් ලැබිය යුතුයි. මේ වෙලාවේ ඕනැම දෙයකට 10% ක් අයකළ යුතු යන මතයේ මා ද සිටිනවා.මෙය නිදහස් කළත් අභයක් නැහැ. කොහෙන්හරි ලිපියක් ගෙනවිත් නිදහස් කරනවා. එම නිසා 10% වගේ පොඩි ගණනක් අයකිරිම වඩාත් හොඳයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එම නිසා තමයි මා ගියවර අයවැය යෝජනා ලෙස ප්‍රකාශ කරනු ලැබුවේ ප්‍රතිපත්තියක් වශයෙන් සභාව පිළිගන්න නිදහස් කිරිමේදි අවම 10%ක්වත් අයකරන බව. එය පිළිගත්තා. පිළිගත්තා වුණාට සභාවේදි සම්පුර්ණ නිදහස් කරන ලෙස ඉල්ලා අත ඔසවනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සම්පුර්ණ නිදහස් කිරිමට නෙමේ . ස්ථාවර තින්දුවක් ගත යුතුයි. දැන් පාසල වුණත් මොනවා වුණත් මුදල් අයකර තමයි මෙය සිදු කරන්නේ. ඒ අයට පාඩු සිදු වි ඇත්නම් නැවත ඒ මුදල ලබා දිය හැකිනම් කමක් නැහැ.මා නම් පවසන්නේ 10% මුදල තිබ්බානම් හොඳයි. නැත්නම් දැන් නගර සභාව දේවාලයක් වගේ වෙලානේ. එයයි සිදු වි ඇත්තේ. සැම දෙයටම මුදල් වැයවෙනවා. අපි මොනවා කරන්න ගියත් නගර සභාවට විශාල මුදලක් වැයවෙනවා. ඒ වැයවන මුදල් ලැබෙන මාර්ග වන්නේ ඔකයි. වරිපණම් . එත් වරිපණම් මුදල් වල හිඟ පවතිනවා. ගෙවන්නේ නැහැනේ ගොඩක් කට්ටිය. ගරු මන්ත්‍රිවරුන්ගේ අදහසට අනුව තින්දුවක් ගන්න. එයට අපි එකඟයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

25% තින්දුව අයින් කරනවාද?

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගත්ත කමිටුවේ තින්දුව ක්‍රියාත්මක විය යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගත්ත කමිටුවේ තමයි. රු.1000 ප්‍රවේශ පත්‍ර සඳහා 10%කුත් රු.1000 සිට 3000 දක්වා ප්‍රවේශ පත්‍ර සඳහා 15%කුත් රු.3000ට වැඩ ඒවාට 25% ක ප්‍රමාණයකතුත් අයකිරිමට තීරණය කර ඇත. .ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා ප්‍රකාශ කර සිටින්නේ රු.1000/= දක්වා 10%කුත් රු.1000 ට වැඩිනම් 15% මුදලකුත් අය කර ගැනිමයි. 25% සිමාව ඉවත් කර එය 15% තබන ලෙසයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

එහෙම නෙමේ දැන් අපි අනිවාර්ය විනෝද බද්දක් අය කිරිමට තින්දු කළානේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

දැන් 10% ක මුදලක්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

10% කියන්නේ අවම 10% ක මුදලක් අයකර ගත යුතුයි. පොදුවේ. එම මුදලත් නිදහස් කරනවාද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

නැහැ. එය අවසථානුකුලව ඔබතුමාලා අවශ්‍ය පරිදි වෙනස් කර තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

දැන් මේ අනුමත වි ඇත්තේ නගර සභාවේ කුමන පුද්ගලයකු , කුමන ආයතනයක් කළත් විනෝද බදු 10% ක් අයකරනවා. රු.1000 ප්‍රවේශ පත්‍ර සඳහා 10%කුත් රු.1000 සිට 3000 දක්වා ප්‍රවේශ පත්‍ර සඳහා 15%කුත් රු.3000ට වැඩ ඒවාට 25% ක ප්‍රමාණයකතුත් අයකරනවා. මෙහි රු.1000 සිට 3000 දක්වා ප්‍රවේශ පත්‍ර සඳහා 15%කුත් රු.3000ට වැඩ ඒවාට 25% ක ප්‍රමාණයකතුත් අයකර නිසා එය විතරක් සංශෝධනය කරන ලෙසයි කියා සිටියේ.ඊට අමතරව විනෝද බදු නිදහස් කිරිම ගරු සභාවට යොමු කරන ලිපි අනුව ගරු මන්ත්‍රිවරුන් විසින් එය තීරණය කරනු ලබයි. එය තමයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ ඔබතුමාලා එය නිදහස් කරන නිසා ප්‍රතිපත්තියක් විදියට සිටිය නොහැකි බව.දැන් මේ සංශෝධනය එය නෙමේ. නිදහස් කිරිම සම්බන්ධව නෙමේ. මේ සංශෝධනය වි ඇත්තේ. මා සංශෝධනය කිරිමට ප්‍රකාශ කරනු ලැබුවේ රු.1000/= ට වැඩි සැම ප්‍රවේශපත්‍රයකටම 15% ක් අයකරන ලෙසයි. මෙය මහ පොඩි කරුණකි. මහ විශාල දෙයක් නෙමේ. නිදහස් කරනවා කියන එක වෙන මාතෘකාවකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ඔබතුමා ගහගන්න හැදුවාට මේ සඳහා මා එකඟ වුවා. මා නිහඬ වෙනවා. මාගේ ගැටළුව වී තිබෙන්නේ විනෝද බදු නිදහස් කරනවා කියන විට අවම 10%ක මුදලක් රඳවා ගෙනද නිදහස් කරනවා ද කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

එය සභාව තින්දු කරයි. දැන් මීට ඉහත ධර්මාශෝක විදුහල ගැන තීන්දුවක් ගනු ලැබුවා නිදහස් කරන්න.එහිදී ඔබතුමලා ප්‍රකාශ කර තිබුණා නම් 10% ක්වත් තබා ගන්නා ලෙස. එම මුදල තියා ගන්න තිබුණා. අදාල අවස්ථාව අනුවයි එය සිදු වන්නේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කරමින්**</u>

මා නම් ප්‍රකාශ කරන්නේ 25% තින්දුව හොඳයි . ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතණෙනි මා ප්‍රකාශ කරන්නේ . දැන් මෙහෙත් රු.5000/= ප්‍රවේශ පත්‍ර යනවා අඩුයි

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කරමින්**</u>

දැන් මේ පණත අනුව ගරු සභාපතිතුමාට හෝ අපට බලයක් නැහැ මෙය 10%,15%,5%,කිරිමට. එතකොට 47 පණත අනුව මේ කමිටුවක් දමා මෙම මුදල සංශෝධනයක් කිරිමයි සිදු කරනු ලැබුවේ. මේ

සංශෝධනයේ දි රු.1000/= ප්‍රවේශපත්‍ර 10% කිරිමටත් රු3000/= , ප්‍රවේශපත්‍ර 15% කිරිමටත් රු.5000/= ප්‍රවේශපත්‍ර 25% අයකිරිමටයි . එතකොට රු.1000/= ප්‍රවේශපත්‍ර 10% තැබිමට එකඟයි.රු.3000/= රු.5000/= ප්‍රවේශපත්‍ර එකට. එය 15% ක් කිරිමට. රු.5000/= ප්‍රවේශපත්‍ර 50 ක් විකිණෙන්නේ නැහැ. එහි 10% ක මේ අඩුකරන්න කියන්නේ. නමුත් මේ පටලවා ගෙන ඇත්තේ විනෝද බදු නිදහස් කිරිම. ඊළඟ සභාවේ ඉදලා කවුරුහරි විනෝද බදු නිදහස් කිරිමට ඉල්ලිමක් කළහොත් එම තින්දුව ගන්න වෙනවා සභාවේ.10%,15% අයකරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කරමින්</u>

මා ප්‍රකාශ කරන්නේ අපි ගත්ත තින්දුව ක්‍රියාත්මක කරන්න.රු.5000/= ප්‍රවේශපත්‍ර සඳහා 25% ප්‍රමාණය අය කරන්න කියා. මොකද නගර සභාව පැත්තෙන් බැලුවිට මෙය අඩුකරලා අඩුකරලා ගැටළුවකි. මා දන්නේ නැහැ අනිත් අයගේ මතය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කමිටුව ගත් තින්දුව ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රි ලාල් මහතා යෝජනා කරනවා ඉන් 3 වෙනි එකේ ඇති 25% ඉවත්කරලා එය 15% දක්වා අඩු කරන ලෙස. ඒ ගැන මොකද කියන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කරමින්</u>

ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ ආකරයට එය 15% දක්වා අඩු කරන එක හොඳයි. මොකද ඔබතුමා ප්‍රකාශ කර තිබෙනවා නේ අනිවාර්යෙන්ම 10% ක මුදලක් අයකරනවා කියා. මොකද විශාල ප්‍රවේශපත්‍ර ප්‍රමාණයක් විකිණෙන්නේ නැහැ රු.5000/= න්

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එසේ නම් අපි ගත් කමිටුව අනුව රු.1000/= දක්වා 10% කුත් ඊට වැඩිවන ප්‍රවේශපත්‍ර සඳහා 15% ප්‍රමාණයක් අයකිරිමට සභාව තිරණය කරනවා. හැබැයි මෙය අද තිරණය කළාට මෙය ක්‍රියාත්මක වන්නේ ගැසට් මඟින් පල කළාට පසුවයි. ඒ අනුව අපි ගැසට් එකට යවනවා. එතකන් දැනට ක්‍රියාත්මක වන්නේ දැනට තිබෙන නිතිය. 25% නිතිය ගැසට් එකට ගියාට පසුවයි එම ප්‍රමාණය අයකරන්නේ.

තීරණය-

2019.04.04 දින පැවැති විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධ කමිටු වාර්තාවට අනුව රු.1000/= දක්වා ප්‍රවේශ පත්‍ර සඳහා 10% ක මුදලකුත් රු.1000ට වැඩි සියළුම ප්‍රවේශ පත්‍ර සඳහා 15% ක මුදලක් අයකිරිමටත් මෙම බදු මුදල ක්‍රියාත්මක වන්නේ ගැසට් පත්‍රයේ පළවිමෙන් පසු බවත් එතෙක් ක්‍රියාත්මක වනුයේ දැනට පවතින නිතිය බවත් , විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධ කමිටු වාර්තාව පිළිගත යුතු බවටත්, ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.07 2019.04.24 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

2019.04.24 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය-**
2019.04.24 දින පැවැති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව පිළිගත යුතු බවටත්, ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.08 2019.04.11 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.04.11 දින පැවති කළමනාකරණ කමිටු වාර්තාව යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි මේ කළමනාකරණ රැස්විමේදි ඉදිරිපත් කර තිබෙනවා සභා රැස්විමට යම් යම් කරුණු ඉදිරිපත් කරන බවට. ඒවා ඉදිරිපත් කර තිබෙනවාද? පරිපාලක මහතාගේ හා සෞඛ්‍ය පරිපාලක මහතාගේ පොළොවේ කුට්ටිගල් ඇතිරිම . යම් යම් ප්‍රශ්න මේ සභාවට ඉදිරිපත් කරනවා කියා තිබෙනවා.ඒවා ඉදිරිපත් කර නැහැ. ඒවාට අනුමතිය දෙන්න විදියක් නැහැ.ඒවාට අනුමතිය ලබා ගත්තානම් ඉදිරියට යා හැකියි. මෙහි තිබෙනවා බස්නැවතුම්පොළ සුමිතිපාල මහතාට දෙන්න විදියක් නැහැ. එය ටෙන්ඩර්කර දිය යුතුයි. එහි අනුමතිය මේ සභාවට ඉදිරිපත් කරනවා කියා තිබෙනවා.ඒටික මේ සභාවට ඉදිරිපත් කළානම් අනුමතිය ලබා දිය හැකියි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒවා අනුමත වුණාම ඇස්තමෙන්තු සභාවට ඉදිරිපත් කරයි.

**තීරණය-**
2019.04.11 දින පැවැති කළමණාකරණ කමිටු වාර්තාව පිළිගත යුතු බවටත්, ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිෂාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ කමිටු ගැන කතා කිරිමේදි රථ වාහන හා ත්‍රි රෝද රථ කමිටුව පෙබරවාරි මාසයේ පැවැත්වූවාට පසු මේ දක්වා පවත්වා නැහැ. මා හිතන්නේ රථ වාහන හා ත්‍රි රෝද රථ කමිටුව මගින් ගනු ලබන කිසිම තීරණයක් අද වනතුරු මේ නිලධාරින් ක්‍රියාත්මක කර නැහැ. කිසිම දෙයක් ක්‍රියාත්මක වි නැහැ. එය අයාලේ යන විදියටයි තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපේ ගරු උප සභාපතිතුමාගේ නායකත්වයෙන් තමයි රථ වාහන කමිටුව තිරණය කරනු ලබන්නේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ කමිටුවේ අපගේ විපක්ෂ නායකතුමාත් සිටිනවා. මේ කමිටුවෙන් යෝජනා කර යම්කිසි වැඩ පිළිවළක් ක්‍රියාත්මක කිරිමට හැදුවා. මෙතෙක් කල් ඒවා ක්‍රියාත්මක කෙරි නැහැ.මේ වන විට ත්‍රි රෝද රථ සඳහා බලපත්‍ර 160 ක් පමණ ලබා දි තිබෙනවා. ඒ අය අපට පැමිණ පවසා සිටිනවා බලපත්‍ර ලබාගෙන තිබුණට ත්‍රිරෝද රථ

ගාල් කිරිමට තැනක් නැහැ කියා. අපි එදා ස්ථාන ලබාගෙන මේ විදියට ක්‍රියාත්මක කරන්න කියා. හැබැයි ඒ එක වැඩක් වත් මේ වන විට ක්‍රියාත්මක වන්නේ නැහැ. මේවා සිදුවන්නේ නැතිනම් මේ කමිටුවක් තබාගෙන කිසිම වැඩක් නැහැ. ඒ කමිටුවේ දේවල් ක්‍රියාත්මක වන්නේ නැතිනම් අපට ඒ කමිටුවේ ඉඳලා වැඩක් නැහැ.මේ කමිටුවේ ගන්න ක්‍රියා මාර්ග කොපමණ උපදෙස් ලබා දුන්නාත් කෙරේන්නේ නැහැ.දැන් ඒ ලිපිලේඛණ භාරගත් නිලධාරිණියගෙන් වැඩක් කෙරෙන පාට පෙනෙනවා. ඒ පසුගිය කාලයේ භාරගත් කිසිම නිලධාරියෙකුගේ කිසිම වැඩක් කෙරි නැහැ.අපි මේ කමිටුවේ තිරණයක් ගනු ලැබුවා දින 14ක් ඇතුළත බලපත්‍රය ලබා නොගත්තේ නම් බලපත්‍රය අහෝසි කරන බව. කලින් විෂයභාර නිලධාරිණියගෙන් ඒ එක වැඩක් වත් කෙරි නැහැ.මේ ක්‍රියා මාර්ග ගන්නේ නැතිනම් මේ කමිටුව පවත්වා වැඩක් නැහැ.අපිට බලපත්‍ර ලබා දි ජනතාවගේන් බැනුම් අහන්න බැහැ.මා ගරු මන්ත්‍රිතුමාටත් ප්‍රකාශ කළා මේ දේවල් ක්‍රියාත්මක වි නැහැ. ඒවා ක්‍රියාත්මක වුවාට පසු කමිටුව තබන බවට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ලේකම්තුමියණනි , මේ ගැන සොයා බලන්න

<u>ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දූවගේ</u>

ගරු සභාපතිතුමනි , මේ ගරු උප සභාපතිතුමා අපි ගරු මන්ත්‍රිවරු කිහිප දෙනෙක් සිටින ඉතා වැදගත් කමිටුවකි මෙය. මෙය වසර ගණනාවක් තිස්සේ සාකච්ඡා වු දෙයකි. ගරු උප සභාපතිතුමා අපි යම් යම් තින්දු ගනු ලැබුවා. අපි පැය ගණන් සාකච්ඡා කර පැරණි ලිපි ගොනු ගෙනවිත් පරික්ෂා කර අත්සන් කර බොහොම වගකිමෙන් මේ කමිටුව ක්‍රියාත්මක කළා. කනගාටු වෙනවා ඒ නිලධාරින් එය ක්‍රියාත්මක නොකිරිම ගැන.ඒ සමඟ මා ඉල්ලා සිටිනවා. මේ කමිටුව යට කරන්න බැහැ. නගරයේ අවලස්සන ගතිය , ක්‍රමවත් නැති බව ,හිතුමනාපෙට වැඩ කිරිම , චණ්ඩි පට් මේ ඔක්කොම අයිතියි මේ කමිටුවට. ඒ නිසා මේ එකකටවත් අපි යටත් නැහැ. මේ ගරු උප සභාපතිතුමා සමඟ දමන ලද ඒ කමිටුවට මාත් බොහොම කැමැත්තෙන් වාඩි වුණේ. මොකද සභායෝගයෙන් හා මේ නගරයේ තිබෙන වැඩපිළිවළ ගැන තින්දුවක් ගත යුතු නිසා. මෙහි කිසි කෙනෙකුගේ බලයකට හෝ චණ්ඩිකමකට අපි යටත් වෙන්නේ නැහැ. මේ කමිටුව ගරු උප සභාපතිතුමාත් මාත් ඊළඟ දවසක මේ කමිටුව පවත්වනවා. හැබැයි මේ නිලධාරින් මේවාට ක්‍රියාත්මක නොකලහොත් එම නිලධාරියා ගෙන්වා ප්‍රශ්න ඇසිය යුතුයි. එම නිලධාරියා පසුව පිළිතුරු සපයා බැහැ. ඒ මොහොතේ පිළිතුරු සැපයිය යුතුයි. මෙය නගරය පිළිබඳ ගැටළුවකි. මේ කමිටුව ක්‍රියාත්මක කරන්න . ඒ දිපු අය හැර අනෙක් අය ගන්නේ නැතිනම් අපි ඔවුන්ට දැන් දින ගණනාවක් ලබා දුන්නා. ඒ අය පොලිසියට දැනුම් දි ඔවුන් වහාම රථ ගාල් වලින් අයින් විය යුතුයි. කිසිදු ගරු මන්ත්‍රිවරයෙකුගේ ඇඟි හොඳයිකම් වලට කිසිදු ඉඩක් දෙන්න බැහැ. එහෙම ඉඩක් ලබා දුන්නොත් අපි ඒ නිතිය කඩන්න ක්‍රියාත්මක කරවනවා. නිතිය නිතිය විදියට ක්‍රියාත්මක කරන්න. ගරු උප සභාපතිතුමනි , මා ඔබතුමාට බොහොම හයියට ඉන්නවා. අපි මේ කමිටුව පිළිබඳ තිරණය ගෙන මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නම්.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ලේකම්තුමියණනි, මේ පිළිබඳව සොයා බලා අදාල නිලධාරින් කැඳවා ගතයුතු ක්‍රියාමාර්ග ගන්න. ඒ අඩුපාඩු ටික සකසා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි දිනයාදූර ධර්මදාස මහතාකතා කරමින්</u>

ගරු සභාපතිතුමනි. මේ මාසයේ වත් මේ කමිටුව රැස්කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතාකතා කරමින්</u>

ගරු සභාපතිතුමනි. මා දන්නා ආකාරයට තාක්ෂණසේවා නිලධාරින් 3, 4කු හිටියා. වැඩ අධිකාරින් හිටියා. දැන් මේ සියල්ලටම සිටින්නේ සඳුන් මහතා අනෙක් තාක්ෂණසේවා නිලධාරි මහතා හා මේ ක්ෂේත්‍රයට අලුතින් පැමිණි කෙනෙකුත් පමණි. එතකොට මොවුන් දෙදෙනා මේ අයවැය යෝජනා වලන ඇස්තමේන්තු දිවා රෑ වනතුරු සැදිය යුතුයි. සභාවේ යෝජනා වන සියළුම දේවල් වල ඇස්තමේන්තු සැදිය යුත්තේ මොවුන් දෙදෙනායි. මේ සියළු දේවල් සේම මේ ව්‍යාපෘති වල ඉංජිනේරු මහතුන් සමඟ වැඩ බැලිමට යන්න වෙන්නෙත් මේ නිලධාරින් දෙදෙනාටයි.උප පරිපාලකවරු දෙදෙනා සමාන්‍ය වැඩ අංශයේ වැඩ කරවනවා. මා විමසා සිටින්නේ මේ අම්බලන්ගොඩ නගර සභාවට අනුමත නිලධාරි මණ්ඩලය මෙයද? එහෙම නැතිනම් එම නිලධාරින් ගෙන්වා ගැනිමේ ක්‍රමයක් නැතිද ? එහෙමත් නැතිනම් මේ අපගේ නගර සභාවට අනුමත නිලධාරින් තව දෙතුන් දෙනෙකු ගෙන්වා ගන්නා ලෙස ගරු ලේකම්තුමියණනි මා ඉල්ලා සිටිනවා. මොකද මෙය නගර සභාවක්නේ. අම්බලන්ගොඩ නගර සභාව මහ නගර සභාවකට ගාලු දිස්ත්‍රික්කයේ තිබෙන එකම නගර සභාව අම්බලන්ගොඩ නගර සභාවයි. ඔබතුමියට තෙරෙන්නෙ ඕන මෙහි විශාල වපසරියක් නැති වුණාට පහසුකම් වලින් පිරුනු

නගරයකි. වියදමට දැඩි පහසුකමක් ලැබෙන නගරයකි. පාසල් තිබෙනවා, වානිජ්‍ය බැංකු තිබෙනවා. ඒ අනුව මෙහි මිළ වැඩි වී තිබෙනවා. එම නිසා මෙහි ඉදිකිරීම් වැඩියි. එදිනෙදා පැමිණෙන ප්‍රශ්න වැඩියි. එවිට මේ නිලධාරින් දෙදෙනෙකුගේ බෙල්ල මත මෙය තබා අපිත් මෙහි පැමිණ කැගසනවා. අපිට කරන්න දෙයක් නැහැ. අපි ඉල්ලිම කරනු ලබන්නේ සභාවට. එවිට අදාළ නිලධාරින් නැතිනම් වැඩ පරික්ෂක මහතුනුත් නැතිනම් උප වැඩ පරිපාලකගේ අඩුවකුත් තිබෙනවා. ඒ අනුව අපි සෞඛ්‍ය අංශයට , කර්මාන්ත අංශයට තාවකාලිකව සේවකයන් ලබා ගත්තාත් ඒ සියළු දෙනාම කම්කරුවන් ගෙන තිබෙන්නේ. නමුත් මේ තාක්ෂණසේවා නිලධාරි මහතාගේ වැඩය තාවකාලික කෙනෙකු ගෙන කිරිමට බැහැ. එයට රජයේ නිලධාරින් අත්‍ය අවශ්‍යයි පැමිණිම. එම නිසා ඔබතුමිය ලේකම්තුමිය වශයෙන් කොමසාරිස්තුමා සමඟ සාකච්ජා කර අපට අවශ්‍ය නිලධාරි මණ්ඩලය සාදා ගන්න. නැතිනම් මේ ප්‍රශ්නය සැමදාම තිබේවි. ඇස්තමේන්තු හදනවාට වඩා තව වේලාවක් ඒ අයට තිබේ කියා මා හිතනනේ නැහැ. මේ සභාවේ ගරු මන්ත්‍රිවරු 21කු යෝජනා කරන ලද යෝජනා. අඩුම වශයෙන් එක සභාවකට යෝජනා 5ක් 6ක් වත් එනවා ඇස්තමේන්තු හදන. දැන් මේ වගේ රටේ පවතින උද්ගත වන ප්‍රශ්න . මේ සියල්ලටම කටයුතු කිරිමට සිදුවන්නේ මොවුන්ටයි. තාවකාලික සේවකයන්ගේ පුරප්පාඩු පුරවා ගත හැකි වුවත් නිලධාරින්ගේ පුරප්පාඩ සම්පුර්ණ කර ගන්න. ඊළඟ සභාව වන විට මෙන්න මෙයයි අපගේ අනුමත නිලධාරින් ගණන , මෙන්න මේ අඩුපාඩු අපට තිබෙනනවා. මෙන්න මේදේවල් ලබා ගන්න අපි කතා කර තිබෙනවා කියා අපට ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය-**

2019.04.04 දින පැවැති විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධ  කමිටු වාර්තාවට අනුව රු.1000/= දක්වා ප්‍රවේශ පත්‍ර සඳහා 10% ක මුදලකුත් රු.1000ට වැඩි සියළුම ප්‍රවේශ පත්‍ර සඳහා 15% ක මුදලක් අයකිරිමටත් මෙම බදු මුදල ක්‍රියාත්මක වන්නේ ගැසට් පත්‍රයේ පළවිමෙන් පසු බවත් එතෙක් ක්‍රියාත්මක වනුයේ  දැනට පවතින නිතිය බවත් ,  විනෝද බදු ප්‍රතිශතය සංශෝධනය සම්බන්ධ  කමිටු වාර්තාව  පිළිගත යුතු බවටත්,  ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**( 07 )** **ටෙන්ඩර් හා මිළ ගණන්**

**07.01 ටෙන්ඩර් :-**

**07:02 මිළ ගණන් :-**

07.02.01 අම්බලන්ගොඩ නගර සභාවට  තීන්ත මිලදී ගැනීම සඳහා මිළ ගණන්

| ආයතනයේ නම | ඇන්ටිකොරෝසිව් තීන්ත ලිටර් 1 | එනමල් තින්ත කොළපාට ලිටර් 1 |
|---|---|---|
| B.k.S.කම්පැණි සමාගම | රු.697 | රු.1265 |
| ස්ටාර්ලයින් හාඩ්වෙයාර් | රු.750 | රු.1050 |
| පුර්ණා වෙළඳසැල | රු.739 | රු.986 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය තීන්ත මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් ඇන්ටි කොරෝසිව් තීන්ත සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති B.K.S. කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනීමටත් , එනමල් තීන්ත සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පුර්ණා වෙළඳසැල මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

07.02.02 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය GI පයිප්ප හා පැස්සුම් සඳහා ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | වර්ගය | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් | B.k.S.කම්පැණි සමාගම | පූර්ණා වෙළඳසැල |
|---|---|---|---|---|---|
| 01 | GI පයිප්ප(අගල් 1 ½ විශ්කම්භය හා ඝනකම 2.00mm) | පකිස්ථාන් | රු.4700/= | රු.4650/= | රු.4600/= |
| 02 | ඇණ (අගල් 2 ¼ විශ්කම්භය 10mm) | | රු.40/= (එකක් ) | රු.425/= ( කිලෝ 1ක් ) | රු.10/= (එකක් ) |
| 03 | වොෂර් ( අගල් 2 ¼ හාපින්10mm සහිත ඇණ | | රු.5/= (එකක් ) | රු.425/= ( කිලෝ 1ක් ) | රු.2.00 (එකක් ) |
| 04 | GI පයිප්ප(අගල් 2 විශ්කම්භය හා ඝනකම 2.00mm) | පකිස්ථාන් | රු.6500/= | රු.6175/= | රු.6500/= |
| 05 | GI පයිප්ප(අගල් 1 විශ්කම්භය හා ඝනකම 4.00mm) | පකිස්ථාන් | රු.2850/= | රු.2900/= | රු.2800/= |
| 06 | Flat Iron Bar ( අගල් ¾ හා ඝනකම 6.00mm | | රු.750/= | රු.775/= | රු.860/= |
| 07 | නො12 වෙල්ඩින් කූරු පැකට් | | රු.750/= | රු.675/= | රු.680/= |
| 08 | අගල්2විෂ්කම්භය සහිත End Cap | | - | රු.125/= | රු.120/= |
| 09 | P.V.C Wire cord | | රු.650/= | රු.425/= | රු.450/= |
| 10 | 50*50PVC Coated 5 අගල් - අගල් 11 height wire mesh (gage 10) | | රු.25300/= | රු.20000/= | රු.17000/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය GI පයිප්ප හා පැස්සුම් සඳහා ද්‍රව්‍ය මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණා වෙළඳසැල මගින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

07.02.03 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය දඟර වානේ යකඩ ඇණ මිළදි ගැනිම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ | ප්‍රමාණය | B.k.S.කම්පැණි සමාගම | පූර්ණා වෙළඳසැල | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|
| 1 | සංස්ථා කම්බි දඟර වානේ 10mm | | රු.575/= | රු.585/= | රු.585/= |
| 2 | 1 ½ "1 ½ "Box Bar (6.6mm) | | රු.2200/= | රු.2000/= | රු.2600/= |
| 3 | ¾ "*¾ ""Box Bar (6.6mm) | | රු.1050/= | රු.950/= | රු.1050/= |
| 4 | ගුලු ඇණ 3" | | රු.200/= | රු.270/= | රු.950/= |
| 5 | 1" යකඩ ඇණ | 1kg | | රු.210/= | රු.210/= |
| 6 | 1 ½ " යකඩ ඇණ | 1kg | රු.200/= | රු.210/= | රු.210/= |
| 7 | 2 " යකඩ ඇණ | 1kg | රු.200/= | රු.210/= | රු.210/= |
| 8 | 2 ½ " යකඩ ඇණ | 1kg | රු.200/= | රු.210/= | රු.210/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය දඟර වානේ කම්බි හා බොක්ස් බාර් , ඇණ වර්ග මිලදී ගැනිම සඳහා ඉදිරිපත් වී ඇති මිළ ගණන් අතුරින් 10mm සංස්ථා දඟර කම්බි හා 1" යකඩ ඇණ , 1 ½" යකඩ ඇණ , 2 "යකඩ ඇණ , 1 ½" යකඩ ඇණ මිලදි ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති B.K.S කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ මිළ ගණන් ද 1 ½" *1 ½ ", ¾ "* ¾ "බොක්ස් බාර් හා 3"ගුලු ඇණ මිලදි ගැනීම සඳහා පූර්ණා වෙළඳසැල මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

07.02.04 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපාංග මිලදි ගැනිම සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ | වර්ගය | චානක එන්ටප්‍රයිසස් | දිනේෂ් ටෙක්නොලජි | ප්‍රසන්න ඉලෙක්ට්‍රිකල් | එෂියන් ඉලෙක්ට්‍රිකල් |
|---|---|---|---|---|---|---|
| 1 | මර්කරි බල්බ් 125w | ඔස්රම් | රු.695/= | රු.710/= | රු.690/= | රු.690/= |
| 2 | මර්කරි චෝක් (125w) | මෙගර් | රු.2150/= | රු.2200/= | රු.1950/= | රු.1950/= |
| 3 | ටෙප් රෝල් ( වයරින් ) P.V.C ඉලෙක්ට්‍රිකල් ඉන්සියුලේෂන් ටේප් රෝල් | ACL | 65/= | 70/= | රු.60/= | රු.60/= |
| 4 | CG හෝල්ඩර් | කැලණි | රු100/= | රු.110/= | රු.95/= | රු.94/= |
| 5 | T Off කනෙක්ටර් | 1kg | රු.150/=<br>රු.220/= | රු.180/=<br>රු.225/= | රු.130/=<br>රු.200/= | රු.130/=<br>රු.200/= |
| 6 | ආම් හෙවි සියුටි පයිප්ප ආධාරකය | 1kg | රු500/= | රු.525/= | රු.200/= | රු.375/= |
| 7 | ෂේඩ් වාත්තු ඇලුමිනයම් ආවරණය | 1kg | රු.450/= | රු.475/= | රු.295/= | රු.295/= |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපාංග මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති එෂියන් ඉලෙක්ට්‍රිකල් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

07.02.05 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ෂැටලින් ලෑලි මිලදී ගැනිම සඳහා සඳහා මිළ ගණන්

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | අදීෂ ලී වෙළසැල | මේනක ලී වෙළඳසැල | හංස එන්ටර්ප්‍රයිසස් |
|---|---|---|---|---|---|
| 01 | 10"පලල ෂැටලින් ලෑලි | දික් අඩි | අඹ<br>රු.70/= | - | ඇල්බිසියා<br>රු.65/= |
| 02 | 1"හෝ ¾ ඝණකම ෂැටලිල් ලෑලි පළල 8" හෝ 9" | දික් අඩි | අඹ<br>රු120/= | - | ඇල්බිසියා<br>රු.52/= |
| 01 | 10"පලල ෂැටලින් ලෑලි | දික් අඩි | රබර්<br>රු.50/= | රබර්<br>රු.70/= | |
| 02 | ලෑලි පළල 8"*හෝ9" | දික් අඩි | රබර්<br>රු.90/= | රබර්<br>රු.60/= | |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ෂැටලින් ලෑලි මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති හංස එන්ටර්ප්‍රයිසස් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බවටත් ගරු සභාව තීරණය කරන ලදී.

08. **ගෙවීම්**

08.01 නගර සභා පෙර පාසල් දරු දැරියන් 150කු වෙනුවෙන් පෙර පාසල් නිල ඇඳුම් මැසිම වෙනුවෙන් පී.එච්.ප්‍රියංකා චාන්දනි මහත්මිය වෙත රු.37500/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් . නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේහි පෙර පාසල් නිල අඳුම් මැසිම සඳහා ටෙන්ඩර් කිරිමෙන්ද ලබා දී තිබෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මැහුම්කුලි සඳහා ඇස්තමේන්තුවක් ගිය සභාවක ඉදිරිපත් කර තිබෙනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් . නිලානි මෙනවිය කතා කරමින්</u>

ටෙන්ඩර්පත් කියක් ලැබි තිබුණද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මේ කටයුත්ත සිදු කරනු ලැබු ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය ස්ථාන මාරු ලබා ගොස් ඇත . එම කටයුත්ත සිදු කරනු ලැබුවේ ඇය විසිනි. මෙය ටෙන්ඩර් කර තමයි ලබා දි ඇත්තේ . සභාවේ අනුමතිය ලබා ගෙන තමයි දි ඇත්තේ. ඒ ගැන ගැටළුවක් තිබෙන්නේ ඇයි?

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් . නිලානි මෙනවිය කතා කරමින්</u>
ටෙන්ඩර් කර ලබා දුන්නානම් කිසි ප්‍රශ්නයක් නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙය එක් දරුවෙකුගේ නිල ඇඳුමක් මැසිමට රු.250ක මුදලක් තමයි අයකරනු ලබන්නේ. මෙය ටෙන්ඩර් කර ලබා දුන්නේ.

08.02 අම්බලන්ගොඩ පටබැඳිමුල්ල ආදාහනාගාරය වෙන්කිරීමේ ගාස්තු ලෙස තැන්පත් කර ඇති මුදලින් සමෘද්ධි ප්‍රතිලාභියෙකුට හිමි සහනාධාරය වන රු.2000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ආර්.එම් ඥානවති මහත්මිය වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.03 2019.03.01 සිට 2019.03.31 දක්වා ආරක්ෂක සේවාව සැපයිම වෙනුවෙන් රු.268899.90ක මුදලක් LRDC SERVICES (PVT) LTD ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.04 2019 වර්ෂයේ පෙර පාසල් වැඩපොත් වෙනුවෙන් රු.200000/= ක මුදලක් සිඟිති ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් ආයතනයට ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමතියට යටත්ව ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.05 උස්වැල්ලවත්ත පැති කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු.1,295,346.35 ක මුදලක් පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියට දිස්ත්‍රික් ඉංජිනේරු මහතාගේ හෝ ප්‍රධාන ඉංජිනේරු මහතාගේ අනුමැතියෙන් පසු ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.06 උස්වැල්ලවත්ත කොන්ක්‍රීට් කැපීම සඳහා රු.247,680/= ක මුදලක් පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.07 රණසූරිය පාරේ පෙට්ටි බොක්කු ඉදිකිරීම සම්බන්ධයෙන් රැඳවුම් මුදල වන රු94005.45 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි පෝරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.08 පටබැඳිමුල්ල ආදාහනාගාරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රැඳවුම් මුදල වන රු103,030.61 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත ගෙවිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.09 අම්බලන්ගොඩ මාදම්පා ගඟ අසළ පිහිනුම් තටාකය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.560,754.35 ක මුදලක් දිස්ත්‍රික් ඉංජිනේරු මහතාගේ හෝ ප්‍රධාන ඉංජිනේරු මහතාගේ අනුමැතියෙන් පසු පෝරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.10 අම්බලන්ගොඩ නගර සභාවේ ගරු නගර සභා මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රු.177,000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

08.11 අම්බලන්ගොඩ නගර සභාවේ 2019 අප්‍රේල් මස (2019.03.22-2019.04.25) කාර්යාලය ජලබිල්පත වෙනුවෙන් රු.11032.33 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, මේ සභාවේ ජලබිල්පත් , දුරකථන බිල්පත් ගෙවා ගන්න බැහැ. මේ සභාවේ මේ ළඟදි දිනයක දුරකථන බිල්පත් විසන්ධි කර තිබුණා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඒ මොනවාද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
බිල ගෙවන්නේ නැතිව ඉඳලා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
එහෙම වුණාද ? ඇයි එහෙම වුනේ. මුදල් නැති නිසා නෙමේනේ. ඔගොල්ලන්ගේ නොසලකිල්ල නිසා තමයි එහෙම සිදු වන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
එතරම් කාර්යක්ෂමයි මේ සභාව.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මතක තබා ගන්න. සභාවේ මේ සඳහා මුදල් තිබෙනවා ගෙවීමට.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
මා ඒ මොහොතේම ප්‍රධාන කළමනාකරණිය ගෙන්වා පැවසුවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
සභාවේ ලංකාබෙල් දුරකථනය ඉතාම අඩුවෙන් තමයි මා පවච්චි කරන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
මා පාවිච්චි කරන්නේත් නැහැ. ඒ වුණාට ගත්තානම් එය ගෙවිය යුතුයි. මා හිතන්නේ ගත්ත පලමු ගෙවීම වෙන්නැති ගෙවා නැත්තේ. මා දන්නේ නැහැ ගරු සභාපතිතුමනි . අත මුදල් මේ සභාවේ ඔබතුමා තීරණයක් ගත්තාද රු.5000/= දක්වා අඩු කිරීමට. රු.25000/= දක්වා තිබූ අත මුදල් ප්‍රමාණය රු.5000/= දක්වා අඩුකර තිබෙනවා. රම නිසා ගරු සභාපතිතුමනි මේ සභාව ගෙන යා නොහැකියි රු.5000/= අත ඉතිරි මුදල් වලින්.වාහන දෙක තුනක කැලි

ගත්ත විට රු.5000/= ඉවරයි. අනෙක් එක අපේ ගබඩාවේ කලින් බඩු තිබුණා. ඇණ තිබුණා. ඔනදෙයක් තිබුණා. දැන් ඇණය පවා එම මුදල් වලින් ගෙන ආ යුතුයි. එවැනි තත්වයකි සභාවේ උදා වි ඇත්තේ. කනගාටුදායක තත්වයකි ඇති වි තිබෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
ගරු උප සභාපතිතුමනි , රු.25000/= ක මුදලක් අත මුදල් සඳහා දිම වරදක් තිබෙනවා. ගරු සභාපතිතුමාට සභාවේ වියදම් කිරිමට තිබෙන්නේ පණත අනුව රඅ.10000/= ක මුදලකි. ඊටපසු රු.10000/= ට වැඩිවන විට මා ඔබතුමාලාගෙන් විමසනවා මෙය රු.10000/= ව වැඩියි. කැමති ද කියා. ඉතිං නිලධාරියෙකුට රු.25000/= ක මුදලක් ලබා දෙනවා කියන්නේ ප්‍රශ්නයක් ඇතිවිය හැකියි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
අඩුම ගානේ රු.10000/=ක් හරි. රු.25000/= පැත්තකට දමන්න

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
සභාවට තින්දු කළ හැකියි අත මුදල් දෙන ප්‍රමාණය.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
මේ සිද්ධිය මා මෙතැන කියන්නේ නැහැ. කිව්වොත් එහෙම ගරු සභාවට කෙරෙන අවනම්බුවකි. මධ්‍යවේදියෙක් මෙතැන ඉන්නවා. ඔක දමනවා පත්තරයේ අනිවාර්යෙන්ම. එම නිසා මා මෙය කියන්නේ නැහැ. ඒ වෙලාවේ ගරු නගර සභා මන්ත්‍රි නිලානි මෙනවියත් හිටියා. මා මේ සිද්ධිය කියන්නේ නැහැ. අපි නිලධාරින්ට සභාවේ හොරකමක් කරන්න නෙමෙනේ. ගරු සභාවේ නිලධාරින්ට යම් සභාවට අවශ්‍ය දෙයක් ගැනිමට අත මුදල් තිබිය යුතුයි. මේ එම මුදල් භාරයේ ඇති නිලධාරින් තිදෙනා ළඟම අත මුදල් තිබුණේ නැහැ. එම මුදල් ගන්න තිදෙනා ළඟම මුදල් සතයක්වත් තිබුණේ නැහැ.ඒ අවශ්‍යතාවයක් තිබුණා කරගන්නම බැරි . එය විසඳුවා. ගරු සභාපතිතුමා ඒ වෙලාවේ සභාවේ හිටියේ නැහැ. මා ඉල්ලා සිටිනවා රු.5000/= .රු.10000/= දක්වා ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.එහෙම නැතිනම් මේ සභාවේ ගරු සභාපතිතුමා , අපි නැතිවෙන වෙලාවල් තිබෙනවා. සභාවේ වාහන තිබෙනවා 25ක් 30 ක් විතර .එහි හුළං ගිය අවස්ථාවක සභාවේ මුදල් තිබිය යුතුයි එය දමා ගැනිමට.. එම නිසා එය රු.10000/= දක්වා වැඩි කරන ලෙස මා යෝජනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , මෙය ප්‍රතිපූර්ණ කිරිමක් කරගත යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත් වික්‍රම මහතා කතා කරමින්</u>
නෑ නෑ. රු.10000/= වැඩි කිරිමේ ගැටළුවක් නැහැ. මෙයින් පෙනි යන්නේ ඔබතුමා මේ ගබඩාවට මාසයකට දවසක්වත් ගිහින් බලනවාද මෙහි අත්‍ය අවශ්‍ය බඩු තිබෙනවාද කියා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ගරු මන්ත්‍රිතුමනි , මා බලනවා. මොකද පසුගිය කාලයේ තිබුණා ට්‍රැක්ටර් ටයර් නැහැ. නමුත් එක ජාතියක් තිබෙනවා ටයර් 12ක් විතර . අවශ්‍ය කරන ඒවා නැහැ. ඒ මොහොතේ මා ගරු සභාපතිතුමාට කතා කර තාක්ෂණසේවා නිලධාරි මහතාට කියා ඇණවුමට නිර්දේශයක් දමා එම ට්‍රැක්ටර් ටයර් ගෙන්වා තිබෙනවා. ඒ වගේ පොඩි පොඩි දෙවල් තිබෙනවා. නැති. මේ ආයතනයක් වුණාම අත මුදල් තිබිය යුතුයි. රු.5000/= අතමුදල් වලින් මේ සභාව ගෙන යන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>
මේ සඳහා රු.25000/= අනුමත කර ලේකම්තුමියට ලබා දෙන්න. ප්‍රශ්නයක් නැහැනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>
මෙය රු.4500/= ක් වන විට ප්‍රතිපූර්ණය කළ යුතුයි. එත කරන්නේ නැති එකනේ වේලා තිබෙන්නේ. ආයතනයක එම මුදල් අවසන් විමට කලින් ප්‍රතිපූරණය කළ යුතුයි.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ඇත්ත කතාන්දරය මෙයනේ. මේ නිලධාරින් සියළු දෙනාම හයයි මුදල් තබා ගෙන සිටින්න. හැම කෙනෙක්ටම එය තමයි වෙලා තිබෙන්නේ. එසේ සිදු වීමෙන් මේ ආයතනය ගෙන යා නොහැකියි. එහෙම නම් කවුරුහරි වගකිව යුතු පුද්ගලයෙකු ළඟ අත මුදල් තැබිය යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මකතා කරමින්</u>
එම රු.25000/= තබන්න සෙප්පුවේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
මේ සම්බන්ධව මා ලේකම්තුමියට උපදෙස් දෙනවා මේ අත මුදල් ලඟ දී තිබෙන නිලධාරින් සමඟ සාකච්ඡා නර එම අවශ්‍ය ප්‍රමාණය සඳහා සභාවෙන් අනුමතිය ඉල්ලා සිටිමට.. මේ සඳහා සභාව අනුමතිය ලබා දෙන්නේ අතමුදල් කියක් ලබා දිමටද?

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් කතා කරමින්</u>
රු.25000/= මුදල ලබා දීමට

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
රු.25000/= මුදල ලබා දීමට

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
මේ සඳහා සභාව එකගතාවය පල කරනවාද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මකතා කරමින්</u>
එම මුදල ලබා දෙන්න. සභාව එකඟතාවය පල කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
කලින් ඔය රු.25000/= මුදල තිබුණා. අපගේ වාහන විෂයභාරව කටයුතු කළ නිලධාරි මහත්මිය ළඟ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මකතා කරමින්</u>
අත මුදල් කියන්නේ ටෙන්ඩර් කිරිමෙන්තොරව ඕනතරම් ඇණවුම් කර ලබා ගත හැකියි. ඒ විදියේ අවස්ථානුකුලවයි කරන්නේ. රු.25000/= ක වගේ මුදලකින් බඩුවක් ගත්විට බිල ගෙවන විට එතැනින් අර ගැනිම ගැටළුවක් වෙනවා. පොඩි වියදම් තිබෙන්නේ. නැ රු.25000/= ලබා දෙන්න කිව්වානේ . එය ලබා දෙන්නම් එවිට ඉවරයිනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මකතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, මේ සිමෙන්ති කොට්ටයකට බයිසිකල් ටියුබ් එකකට වෙළඳසැල් වලට ණය වෙනවා නගර සභාව. ඒ නගර සභාව හැල්ලුවට ලක් කිරිමටනේ. සමහර වෙළඳසැල් වලින් දෙන්නෙත් නැහැ.අම්බලන්ගොඩ නගර සභාව කිව්වාම ටෙන්ඩර් එකක්වත් දෙන්නේ නැහැ. මුදල් ලබා ගන්න බැහැ කියා. ඒ මත වල සිටිනවා. මේ ැු.25000/= ක මුදල අනුමත කළා කියා අගතියක් වෙන්නේ නැහැ. මේය සිදු කරනු ලබන්නේ නිලධාරින්ගේ පහසුවට.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
මේ සම්බන්ධව අත මුදල් නිකුත් කරන නිලධාරින් සමග ලේකම්තුමියට ඒ අදාල නිලධාරින් සමඟ සකච්ඡා කර විනිවිද භාවයෙන් අවශ්‍ය කටයුත්තක් කිරිමට අවසරය ලබා දෙනවා. එම අත මුදල් ලඟ තබා ගන්නා නිළධාරියා ට රු.5000/= ක මුදලක් ලබා දුන්විට එහි රු.4900/= ක මුදලක් වනතුරු සිටින්නේ නැතිව රු2500/= වගේ වන විට

ප්‍රතිපූර්නය කරන්න.රු.25000/= ක මුදලක් ලබා දුන්නාම ඒ අදාල නිලධාරියාගේ අතේ එම මුදල මාසයක් දෙකක් වුණත් තිබිය හැකියි. එතකොට අපට වද වීම පිළිබඳව යම්කිසි ගැටළුවක් තිබෙනවා.

**(09)** ගිණුම්

**09.01** 2019 මාර්තු මාසයට අදාළ පොදු ගිණුම් - වියදම් විශ්ලේෂණය හා 2019 මාර්තු මාස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය

**(10)** ඇස්තමේන්තු

**10.01 අම්බලන්ගොඩ නගර සභාවේ පුස්තකාල කමිටුවේ උපදෙස් හා නිර්දේශයන් සැලකිල්ලට ගනිමින් 2019 ජාතික කියවීමේ මාසය සඳහා වූ වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා රු.3,75000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ පුස්තකාල කමිටුවේ උපදෙස් හා නිර්දේශයන් සැලකිල්ලට ගනිමින් 2019 ජාතික කියවීමේ මාසය සඳහා වූ වැඩසටහන ක්‍රියාත්මක කිරිම සඳහා රු.3,75000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.02 අම්බලන්ගොඩ පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමට අදාලව ගෙවතු වගා ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා 2019.04.02 දින ඉදිරිපත් කරන ලද සභා තීරණ අංක 03.04 ව්‍යාපෘති වාර්තා වැඩසටහන ( සංශෝධන පත්‍රිකාව ) ක්‍රියාත්මක කිරිම සඳහා රු.66,610/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමට අදාලව ගෙවතු වගා ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා 2019.04.02 දින ඉදිරිපත් කරන ලද සභා තීරණ අංක 03.04 ව්‍යාපෘති වාර්තා වැඩසටහන ( සංශෝධන පත්‍රිකාව ) ක්‍රියාත්මක කිරීම සඳහා රු.66,610/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.03 අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගණයේ බෝගස අසළ ආරක්ෂිත වැට ඉදිකිරිම සඳහා රු.760,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රිඩාංගණයේ බෝගස අසළ ආරක්ෂිත වැට ඉදිකිරිම සඳහා රු.760,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.04 අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රිඩාංගණයේ ලංකා බැංකුව අසළ වැට ඉදිකිරිම සඳහා රු.650,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රිඩාංගණයේ ලංකා බැංකුව අසළ වැට ඉදිකිරිම සඳහා රු.650,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.05 අම්බලන්ගොඩ හෙප්පුමුල්ල හෙප්පුවා හන්දි වත්ත පාර කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා රු.1,350,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ හෙප්පුමුල්ල හෙප්පුවා හන්දි වත්ත පාර කාණු පද්ධතිය ඉදිකිරිම සඳහා රු.1,350,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනායාදුර ධර්මදාස මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.06 අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ පොදු නාන තොටුපල අලුත්වැඩියා කිරිමේ කර්මාන්තය සඳහා රු.1,600,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ පොදු නාන තොටුපල අලුත්වැඩියා කිරිමේ කර්මාන්තය සඳහා රු.1,600,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි දිනායාදුර ධර්මදාස මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.07 අම්බලන්ගොඩ, නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩා පිටියේ තීන්ත පිරියම් කිරීම සහ අලුත්වැඩියා කිරිම සඳහා රු.500,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, නගර සභා බැඩ්මින්ටන් ක්‍රීඩා පිටියේ තීන්ත පිරියම් කිරීම සහ අලුත්වැඩියා කිරිම සඳහා රු.500,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.08 අම්බලන්ගොඩ, බස්නැවතුම්පල පිටුපස කොටස ආරක්ෂිත වැට ඉදිකිරිම සඳහා රු.400,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළ ආරක්ෂිත වැට ඉදිකිරිම සම්බන්ධව නෙමේ. වෙනත් ප්‍රශ්නයක් මා කතා කරන්නේ. අමතර පංති සඳහා සහභාගි වන 2000 ක 3000ක ළමුන් පිරිසක් සහ මුළු විලේගොඩ ප්‍රදේශයම ඔතන පිවිසුම් මාර්ගයක් ලෙස භාවිතා කරනවා. මෙය නිති විරෝධියි. එයට මාත් එකඟයි. දුම්රිය ප්‍රවේශ මාර්ගයෙන් තමයි ඔවුන් පිවිසිය යුත්තේ. ප්‍රවේශපත්‍ර චෙක් කිරිම නිසා තමයි බස්වලට දුවගෙන එතැනින් පැමිණෙන්නේ. මෙය භාවිතා කරනවා. අපිට බැරිවෙනවාද බස්නැවතුම්පොළෙන් මේ සඳහා ගේට්ටුවක් දමා දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැනට පවතින ආරක්ෂිත තත්වය නිසා ආරක්ෂක අංශය විසින් තමයි ඔය ඉල්ලිම කරනු ලැබුවේ.ඉදිරිපසින් ආරක්ෂා කළාට වැඩක් නැහැ පිටු පසින් පැමිණ ඕනා දෙයක් කළ හැකි බව. එම නිසා වහාම එය සිල් කරන ලෙස දන්වා සිටියා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

හරස් පාලමක් දමා දුන්නානම් හරි දෙපැත්ත සම්බන්ධ වීමට.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

දැනට අද පවතින තත්වය අනුව තමයි වසා දමා තබන්න වෙනවා. පොලිසිය විසින් කිහිප වතාවක් මෙය ඉල්ලා සිටියා.

**තීරණය**

අම්බලන්ගොඩ, බස්නැවතුම්පල පිටුපස කොටස ආරක්ෂිත වැට ඉදිකිරිම සඳහා රු.400,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.09 අම්බලන්ගොඩ, මානාන ක්‍රීඩාංගණය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහා ( පලමු අදියර) රු.500,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, මානාන ක්‍රීඩාංගණය පස් අතුරා සංවර්ධනය කිරීම සඳහා ( පලමු අදියර) රු.500,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.10 අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට ඉදිකිරිම සඳහා ( දෙවන අදියර) රු.350,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, කලුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට ඉදිකිරීම සඳහා ( දෙවන අදියර) රු.350,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.11 අම්බලන්ගොඩ, හල්වතුර කසළ බැහැරලන ස්ථානයේ කසළ වැසීම සඳහා පස් ඇතිරීම සඳහා (2019 පලමු අදියර) රු.500,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, හල්වතුර කසළ බැහැරලන ස්ථානයේ කසළ වැසීම සඳහා පස් ඇතිරීම සඳහා (2019 පලමු අදියර) රු.500,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.12 අම්බලන්ගොඩ, බස්නැවතුම්පොළ වෙළඳසැල් හිමියන් සඳහා යතුරුපැදි නතර කර තැබීම සඳහා රථගාලක් ඉදිකිරීම සඳහා රු.130,000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, බස්නැවතුම්පොළ වෙළඳසැල් හිමියන් සඳහා යතුරුපැදි නතර කර තැබීම සඳහා රථගාලක් ඉදිකිරීම සඳහා රු.130,000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මෙම මුදල සභා අරමුදලින් ගෙවීමට සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

**10.13 අම්බලන්ගොඩ, නගර සභා ආපදා කළමනාකරණ සැලැස්මේ සමස්ථ ක්‍රියාවලිය සඳහා රු.2,008,500/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය**

අම්බලන්ගොඩ, නගර සභා ආපදා කළමනාකරණ සැලැස්මේ සමස්ථ ක්‍රියාවලිය සඳහා රු.2,008,500/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත් , මේ සඳහා ගරු මන්ත්‍රිවරුන්ට ලබන සභාවට යෝජනා ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සභාවේ අනුමතිය ලබා දෙන ලදි.

## (11) වෙනත් කරුණු

11.01 **නිදහස් ආයුර්වෙදයේ බෙහෙත් වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2019 මාර්තු මස නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ මාසික වාර්තාව . ආයතනය පවත්වන ලද දින ගණන20 ½ , පැමිණි රෝගීන් සංඛ්‍යාව 182කි . රෝගීන් පැමිණි දෛනික සාමාන්‍ය ගණන 9 කි. මාසය සඳහා වැයවූ ඖෂධ සඳහා ගිය වියදමරු.18357.09 එක් රෝගියකු සඳහා ගිය මුදල රු.100.87 ක් වශයෙන් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**තීරණය**

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2019 මාර්තු මස සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි**

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

### 12.01 ගම්පෙරළිය වේගවත් කිරිමේ වැඩ සටහන යටතේ 2019 අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සභා ගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගම්පෙරළිය වේගවත් කිරිමේ වැඩ සටහන යටතේ 2019 අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල පහත සඳහන් සංවර්ධන යෝජනා කිරිමට ඉදිරිපත් කර ඇත. ගරු මනිෂ නානායක්කාර මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේයි. ග්‍රාම නිලධාරි වසම විලේගොඩ කොට්ඨාශය . විලේගොඩ ධම්මයුක්තිකාරාම පාර සංවර්ධනය කිරිම රු.200000/= කි. පොල්වත්ත පරණ පාරේ සිට හීන් ඇළ දක්වා කොටසේ කොන්ක්‍රිට් හෝ සපත්තු කාණුවක් ඉදිකිරිම රු.200000/= ක් වශයෙන් රු.400000/= ක මුදලකි. අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එය ඉටු කිරිමට අපගේ අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් මෙම කාර්යය ඉටු කළාට අපගේ නිලධාරින්ගේ අධික්ෂණ කටයුතු සිදු කළ යුතුයි.මෙය නගර සභාවේ කාර්යයක් නිසා එය සිදු කළ යුතුයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට දැනුම් දෙන්න. මේ සඳහා අනුමතිය ලබා දෙන බවත් නගර සභාවේ කාර්මික නිලධාරි මහතුන්ගේ අධික්ෂණය යටතේ සිදු කළ යුතු බවත් අදාල ඇස්තමේන්තුව සභාවට එවන ලෙසත් දන්වා යවන්න.

**තීරණය**

ගම්පෙරළිය / වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2019 අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ සංවර්ධනය කිරිමට යෝජනා කර න ලද විලේගොඩ ධම්මයුක්තිකාරාම පාර සංවර්ධනය කිරිම හා පොල්වත්ත පරණ පාරේ සිට හීන් ඇළ දක්වා කොටසේ කොන්ක්‍රිට් හෝ සපත්තු කාණුවක් සාදා ගැනීම සඳහා අනුමතිය ලබා දෙන බවත් , නගර සභාවේ තාක්ෂණසේවා නිලධාරීන්ගේ අධික්ෂණ කටයුතු සිදු කළ යුතු බවත් , මේ සඳහා වියදම් ඇස්තමේන්තුව ගරු සභාවට යොමු කිරිම සුදුසු බවත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රි ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

### 12.02 පින්නදූව , තොටුපළ පාර සංවර්ධනය කිරිම සම්බන්ධව ගරු නගර සභා මන්ත්‍රි චම්පා සුමුදු කුමාරි මහත්මිය හා එම මාර්ගය භාවිතා කරන නිවෙස්හිමයන් 7කු විසින් අත්සන් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපගේ ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා.පින්නඳුව තොටුපොළ පාර අත්පත් කර ගැනිම සම්බන්ධයෙනි.පින්නඳුව තොටුපොළ පාර පුළුල් කිරිම හා නගර සභාවට අත්පත් කරදිම සම්බන්ධයෙන් එම මාර්ගයේ ඉඩම් හිමියන් වන නන්දනි මහත්මිය , සෝනාලි මහත්මිය , නිලූකා සංජිවනි මහත්මිය , රෝහණ ප්‍රියන්ති මහතා,ගුණපාල මහතා,මහින්ද මහතා,පේමසිලි මහත්මිය යන අය විසින් සිය කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර ඔහුගේ ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.කේ රමණී මහත්මිය සමඟ සාකච්ජා කළ නමුත් කැමැත්ත හෝ අකමැත්ත ප්‍රකාශ නෙකළ නමුත් ඔබතුමා මුණ ගැසි සාකච්ඡා කරන බවට දැනුම් දෙන ලදි.මෙම මාර්ගය පුළුල් කර ගැනිමට ගම්වැසියන්ට දැඩි අවශ්‍යතාවයක් ඇත. මේ සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටි.

**ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙන්න මේ පින්නඳුව තොටුපොළ මාර්ගය පුළුල් කිරිම සම්බන්ධව මේ ක්‍රියාවලිය මේවිදියට මේ දිනවල යනවා.එම නිසා මේ නිවෙස් හිමියන් ඉල්ලා සිටිනවා මේ මාර්ගය පුළුල් කර දෙනලෙස. මෙහිදි කේ.ඩබ්. රමණී මහත්මිය පමණක් මෙයට කැමැත්ත අකමැත්ත ප්‍රකාශ නැහැ. නමුත් අනෙක් සියළුදෙනාම මේ සඳහා කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඔවුන් පවසා සිටින්නේ මේ මාර්ගය අඩි 10 ක ප්‍රමාණයකට පුළුල් කර යුතු බවට.ඒ සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය ඔවුන්ගේ ඉඩම් වලින් ලබාදිමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ සඳහා ඔවුන් විසින් ලිඛිත ප්‍රකාශයක් කර තිබෙනවා.කේ.ඩබ්.රමණී මහත්මියගේ අදහස් කිසිම දෙයක් දැන ගන්න ලැබුණේ නැහැ. විෂයට අදාලව නෙමේ ඇය කතා කරනු ලබන්නේ. වෙනත් වෙනත් කරුණු කතා කරනවා. එමනිසා මා ඒ පිළිබඳවත් ඔබතුමාටත් දැනුම් දුන්නා. මේ පළාත් සභා ආඥා පණත යටතේ නැවත ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කර ලිපියක් ලබා ගන්නා ලෙස ඉල්ලිමක් කර තිබෙනවා. අදින් පසු ඔවුන් මුණ ගැසි මෙය ඉදිරිපත් කරනවා.මෙහි සඳහන්ව ඇත්තේ නොමිලේ පරිත්‍යාග කිරිමට කැමැත්ත ප්‍රකාශ කරන අතර ඔවුන්ගේ මායිම් දන්වා සිටින ලෙස ඉල්ලා ඇත. විශේෂයෙන් මා ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතාගෙන් හා අනෙකුත් සියළු දෙනාගෙන් ඉල්ලා සිටිනවා මේ සඳහා සහායෝගය ලබා දෙන ලෙස. මේ මාර්ගය ඇත්තටම පයින්වත් ගමන් කිරිමට නොහැකි මාර්ගයකි. එමනිසා මෙය පුළුල් කිරිමේ අවශ්‍යතාවය දැඩිව පවතිනවා. දැන් සියළුම මාර්ග සංවර්ධනය කර දි තිබියදි මේ මාර්ගය පමණයි සංවර්ධනය කර දි නැත්තේ.ඔබ සියළු දෙනාගේ අවධානය යොමුකර මේ සඳහා සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මාත් මේ මෑතකදි මේ මාර්ගයේ ගමන් කළා. එම මාර්ගයේ කාණුවක ගමන් කරන ආකාරයට තමයි ගමන් කළ යුත්තේ. එතරම් පොඩි මාර්ගයකි.අපේ නගර සභාවේ කිසිම මාර්ගයක් මේ තත්වයේ නැහැ. එතරමට ගමන් කිරිමට නොහැකියි.මෙහි එක තැනැත්තියක් සිටිනවා විරුද්ධ.ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් මහතාත් දැඩි උත්සාහයක් ගනු ලැබුවා මෙය සැදිමට. මෙම මාර්ගය සාකච්ඡා කර ඉතා ඉක්මනින් සැදිය යුතු බවට මාත් යෝජනා කරනවා. හරි අමාරුයි. නගර සභාවේ කියා කියන්නවත් බැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

දිර්ඝ කාලිනව කතිකා වු එම මාර්ගය ගැන දැන් ගරු නගර සභා මන්ත්‍රී චම්පා සුමුදු කුමාරි මහත්මිය ඉතා උනන්දුවෙන් කටයුතු කරනවා. ඒ සමඟම මේ මාර්ගයට එක්කෙනෙකු පමණයි විරුද්ධව ඇත්තේ. ඇය එම මාවතේ නෙමේ පදිංචි. දැනට අම්බලන්ගොඩ දේවානන්ද විදුහල ඉදිරිපිටයි පදිංචිව සිටින්නේ. එම නිසා ඇයට අවශ්‍යතාවය නැතිව ඇති. අනෙක් සෙසු සියළුදෙනාම කියා සිටින්නේ මේ සඳහා අත්පත්කරගෙන මෙම ක්‍රියාවලිය සිදු කරන ලෙසයි. අඩි 10යකදි අත්පත් කරගැනිමක් නොවන බවයි අපි දැනගෙන සිටින්නේ. එය අඩි 16 හෝ 12 ක ප්‍රමාණයක් විය යුතුයි. මේ තත්වයට අපිට ප්‍රායෝගිකව මේ පිළබඳව සොයා බලා ජනතාවට පහසු වන සේ මේ මාර්ගය සාදා දෙන ලෙස ඉල්ලා සිටිනවා. අර තැනැත්තියත් කැමති වෙනවා යම් මුදලක් සහ තාප්පය ඒ විදියට ඉදිකරන ලෙස තමයි ඇය ඉල්ලිම් කරනු ලබන්නේ. ඉතිං අපට මුදල් ලබා දිමේ හැකියාවක් නැහැ.දැඩිව දුෂ්කරව ගමන් කරන මේ මාර්ගය සකසා දෙන ලෙස දැඩිව ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මුලින් මේ කැමති අයගේ පැවරුම් නියෝග ටික ඉදිරිපත් කරන්න. ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතාගේ හා ඔබතුමියගේ සාක්ෂි ඇතිව එම පැවරුම් නියෝග ඉදිරිපත් කරන්න. එවිට අපිට ඒ අත්පත් කරන කොටස අත්පත් කරගැනිමටත් අනෙක් කොටස සංවර්ධනය කිරිමටත් පුළුවනි. අපි අත්දැකිමෙන් දැක තිබෙනවා ඒ කොටස අතහැර දමා සංවර්ධන කටයුතු සිදු කරන විට ඒ පුද්ගලයා නිකම්ම ලබා දෙනවා. අපි එහෙම මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ පාරක් අතහැර දමා සංවර්ධනය කරන විට ඒ අදාල ඉඩම සංවර්ධනය කරන විට ඒ තැනැත්තාම පස්සට ගනු ලැබුවා. මේ සම්බන්ධව මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියට ඒ අත්දැකිම ඇති. මේ සිද්ධිය සම්බන්ධව පෙත්සම් කාරක සභාවකට දෙපාරක් ම සහභාගි වුවා.පෙත්සම් කාරක සභාවට කැඳවා තිබුණට මේ පිරිස් අතර තිබෙන එකමුතුකම නැති කම නිසා තමයි මෙය කර දීමට නොහැකි වුයේ. නැතිනම් මෙය කර දී අවසන්. අපිට මේ කරන දෙය මහා දෙයක් නෙමේ. අපි කරන ලද වැඩ වල හැටියට. මේ එක්කෙනා කැමති වන විට අනෙක් කෙනා කැමති නැහැ.එම නිසා මෙය කරන්න බැරි වි තිබෙනවා. එම නිසා මේ සඳහා ගරු මන්ත්‍රීතුමිය හා මන්ත්‍රීතුමා දෙන්නා එකතු වි මෙය කරන්න.

## 12.03 අම්බලන්ගොඩ , ඩීපෝව . ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළමණාකාරතුමා විසින් අමබලන්ගොඩ බස්ගාලේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඉහත කරුණ සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ඩිපෝ බස්රථ ගාලේ ආරක්ෂාව සම්බන්ධයෙනි. ඒ අනුව බස්රථ ගාල හා දුම්රිය මාර්ගය අසළ අනවසර මාර්ගයක් පවතින අතර එමඟින් බස්රථ ගාලේ ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිසිය ආරක්ෂාව තහවුරු කර ඇති අතර බස්රථ ගලේ පොලිස් මුරපොල අතර බස්නැවතුම්පොළ ආසන්නයේ තිබූ ගස සහ ආවරණය පිළිබඳ අවධානය යොමුකළ අතර මේ සම්බන්ධව පොලිසියට නගර සභාවට ලිඛිතව දැනුම් දි ඇති බවත් ප්‍රකාශ විය.රටතුළ පවතින අවධානම සැලකිල්ලට ගනිමින් මේ අනවසර දුම්රිය මාර්ගය හරහා ඇති මාර්ගයේ වැට සකස් කර දෙන ලෙස ඩිපෝ කළමනාකාරතුමා විසින් කාරුණිකව ඉල්ලා ඇත. මේ කාර්ය දැනට කර අවසන් . සභාවේ දැන ගැනිම සඳහා මෙය ඉදිරිපත් කරනවා.

**තීරණය**

අම්බලන්ගොඩ ඩීපෝ කළමණාකාරතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව ප්‍රධාන බස්ගාල හා දුම්රිය මාර්ගය හරහා අනවසර ගමන් මාර්ගය සඳහා, මේ වන විටත් වැට සකස් දී ඇති බැවින් එය සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 12.04 2019 අප්‍රේල් මස 17,18,19 තෙදින තුළ දළදා මාලිගය හා නුවරඑළිය ප්‍රදේශයේ හි සිදුවූ සමුහ චාරිකාව පිළිබඳව අයවැය ලේඛනය සභාගත කරන ලදි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

2019 අප්‍රේල් මස 17,18,19 තෙදින තුළ දළදා මාලිගය හා නුවරඑළිය ප්‍රදේශයේ හි සිදුවූ සමුහ චාරිකාව පිළිබඳව අයවැය ලේඛනය ඉදිරිපත් කර ඇත. බිල් අංක සහිතව ඉදිරිපත් කර ඇත. නුවරඑළියේ පෙඩ්‍රුස් රෙසෝස් නවාතැනේ කාමර 14ක් සඳහා දින දෙකක ගාස්තුව රු.14000/= ක මුදලකි.ආසන 53ක අර්ධ සුපෝගභෝගි බස්රථයේ දින තුනක ගාස්තුව රු.60000/= කි. අධිවේගි මාර්ග ගාස්තුව රු.1050කි. පින්නවල බස්රථ නැවතුම් ගාස්තු රු.100 කි.චාරිකාවේ මුළු වියදම 2.1150/= කි.අත ඉතිරිමුදල වූ රු8150/= ක මුදල නැවත ප්‍රජා මණ්ඩල ගිණුමට බැර කර ඇති බවට ගිණුම් වාර්තාව ඉදිරිපත් කර ඇත. මා ප්‍රකාශ කර සිටින්නේ කරුණාකර සිටින්නේ තම කොට්ඨාශයේ ප්‍රජා මණ්ඩල නොමැති අය ප්‍රජා මණ්ඩල පිහිටුවා ගන්න. මෙවැනි තත්වයන් ඒ වැසියනට ලබා දිය හැකියි.

**තීරණය**

අම්බලන්ගොඩ කරිත්තකන්ද ප්‍රජා මණ්ඩලය මගින් 2019 අප්‍රේල් මස 17,18,19 තෙදින තුළ දළදා මාලිගය, නුවරඑළිය ප්‍රදේශවල සිදුවූ සමූහ චාරිකාවේ අයවැය වාර්තාව සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 12.05 පළාත් පාලනදෙපාර්තමේන්තුව ( දකුණු පළාත ) 2019 වර්ෂය සඳහා දක්ෂිණ යොවුන් පළාත් සභාවට නවකයින් තෝරා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන්පළාත් පාලන කොමසාරිස්තුමා ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. 2019 වර්ෂය සඳහා දක්ෂිණ යොවුන් පළාත් සභාවට නවකයින් තෝරා ගැනීම. උක්ත මැයෙන් පළාත් ක්‍රිඩා කටයුතු යෞවන කටයුතු , පරිවාස අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක දපස/ක්‍රීග්‍රා/සං/5/1 2019.0412 දිනැති ලිපිය හා බැඳේ. ශ්‍රී ලංකා ජාතික මෙන්ම ජාත්‍යාන්තර තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා සමගාමී වෙමින් මෙරට සමාජ , ආර්ථික , පාරිසරික සංස්කෘතික හා දේශපාලන විෂමතා අවම කර ගැනීම රටට සෞභාග්‍ය හා සංවර්ධනය ළඟා කරවීම උදෙසා තරුණයින් අන්තර්ගත වූ ඒකාබද්ධ ප්‍රවේශයක අවශ්‍යතාවය ප්‍රබලව දැනී ඇති සමයක එකී ගමනට පෙරගමන් කරුවෙකු ලෙස දකුණු පළාත් සභා තරුණ කටයුතු අමාත්‍යාංශය 2015 වර්ෂයේදී යොවුන් පළාත් සභාව පිහිටුවා ඇති බව සඳහන් කර ඇත. ඒ අනුව ධනාත්මක ආකල්ප සංවර්ධනයක් තුළින් නවෝත්පාදක සංවර්ධන ප්‍රවේශයකට තරුණ සහභාගීත්වය ප්‍රබලව ගොඩ නැගීම මෙහි අපේක්ෂිත පරමාර්ථය වී ඇති අතර එහිදි අවිධිමත්ව සමාජගත වි සිටින තරුණ ප්‍රජවේ අභිවෘද්ධියට සඵලදායී එළඹුමක් සැපයිය යුතුය.වයස අවුරුදු 16-30ත් අතර තරුණ ප්‍රජාව දැනුවත් කර සම්බන්ධ කරන ලෙස කාරුණිකව දන්වා ඇත. මෙය ඉතා දිර්ඝ ලිපියකි. ඒ සඳහා යොවුන් පළාත් සභාවට දත්ත ඇතුළත් ලිපියක් හා අයදුම්පතක් මේ සමඟ අමුණා එවා ඇති අතර සියළුම අයදුම්පත් මැයි මස 10 වන දිනට ප්‍රථම මෙම ආයතනයට ආවරණ ලිපියේ පිටපතක් සහිතව ලේකම් , ක්‍රිඩා යෞවන කටයුතු , සමාජ සුභසාධක හා පරිවාස අමාත්‍යාංශය , 03වන මහල , දක්ෂිණපාය අමාත්‍යාංශ සංකීර්ණය , ලබුදුව , ගාල්ල යන ලිපිනයට යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධයෙන් තරුණ අය සිටිනවා නම් ඉදිරිපත් කරන්න. මෙහි ඡායා පිටපතක් බැගින් සියළුම ගරු මන්ත්‍රිවරුන්ට ලබා දෙන්න.

**තීරණය**

පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එවන ලද 2019 දක්ෂිණ යොවුන් පළාත් සභාවට නවකයින් තෝරා ගැනීම සම්බන්ධ ලිපිය ගරු සභාවේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 12.06 රියෝ ක්‍රිඩා සමාජය මගින් පැති විකට්ටු දෙක නවිකරණය කිරිම සම්බන්ධව කරණ ලද තාක්ෂණසේවා නිලධාරි මහතා විසින් ඉදිරිපත් කරන ලද පරීක්ෂණ වාර්තාව සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

රියෝ ක්‍රිඩා සමාජයෙන් පැති විකටුව නවිකරණය කරන ලෙස ඉල්ලා ඇත. අප ක්‍රිඩා සමාජය සතු පැති විකටු දෙක නවිකරණය කරන ලෙස ඉල්ලා සිටි. මෙහිදි එක විකටුවක් බෝලින් මැෂින් සවිකිරිමට සුදුසු ආකාරයට නවිකරණය කළ යුතුය. ඒ අනුව එක විකටුවක් ආවරණය දිර්ඝ කරන ලෙස ඉල්ලා සිටිනවා.එක විකටුවක් 45*15 ප්‍රමාණයේ කොන්ක්‍රිට් දමා අතුරා සකස් කිරිම පමණක් සිදු කරනු ලැබේ.එම ක්‍රිඩා සමාජයේ සභාපති ජයන්ත ජයවීර මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. මේ සම්බන්ධව තාක්ෂණසේවා නිලධාරිගේ වාර්තාවක් සමඟ මෙය ඉදිරිපත් කරනවා. ඒ අනුව ස්ථානිය පරික්ෂාවක් කරන ලදී.රියෝ ක්‍රිඩා සමාජය විසින් ඉල්ලිම් කර පරිදි පවතින පැති විකටු දෙකෙන් එක්

පැත්තකට වෙන්න නගර සභා ක්‍රිඩාංගණයට අඩි 10 යක පමණක් කොටසක් එක් කිරිමට ගැටළු සහගත තත්වයක් එකතු කිරිම සුදුසු බැවින් එම කොටස එකතු කිරිම සුදුසු බවට යෝජනා කර සිටි. තවද විකටුවේ ගාලු කොළඹ මාර්ගයට අඩි 5ක ප්‍රමාණයක් දික් කිරිමට ඉල්ලීම් කර ඇත. එය අඩි 5 5ක් දික් කිරිමට අනුමතිය ලබා දිය නොහැකිය. එම දිර්ඝ කිරිම සිදු කිරිම සඳහා අම්බලන්ගොඩ නගර සභාවේ ඇති පැරණි වැට දික් කිරිම සුදුසු බැවින් නගර සභා පැරණි මායිම් වැඩ දක්වා දිගු කිරිම සුදුසු බවට වාර්තා කර ඇත. ඉදිරිපත් කර ඇති වාර්තා වලට අනුව ජී.අයි බට වැර ගන්වන ලෙසත් ඊට අමතරව කිසිදු ඉදිකිරිමක් සිදු නොකරන ලෙසද මේ යටතේ ඉදිකිරිම් කටයුතු සිදු කළ යුතුබවට තාක්ෂණසේවා නිලධාරින් විසින් වාර්තාවක් ලබා දි ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

තාක්ෂණසේවා නිලධාරිගේ වාර්තාව අනුව ඉදිකිරිම් කටයුතු කරන්න ඉඩ දෙන්න.

**තීරණය**

RIO ක්‍රීඩා සමාජය මඟින් පුහුණු පැති විකට්ටු දෙක නවීකරණය කිරිම සම්බන්ධ ලිපියට අනුව තාක්ෂණසේවා නිලධාරි වාර්තාව අනුව කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඊ.ඉන්දා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමතිය ලබා දෙන ලදී.

**12.07 අම්බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත අංශය සඳහා උපකරණ ලබා ගැනිම් සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත අංශයේ සේවකයන් සඳහා පවතින තාච්චි , විසිකැති, විල්බැරෝ ඉතා අබලන් තත්වයේ පවති. තාච්චි 10, විසිකැති 10, විල්බැරෝ 03 ක් ඉල්ලා ඇත. එය ලබා ගැනිමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ කර්මාන්ත අංශය සඳහා තාච්චි 10, විසිකැති 10, විල්බැරෝ 03 ක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම් .ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමතිය ලබා දෙන ලදී.

**12.08** අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මගින් අම්බලන්ගොඩ සඳහම් වෙසක් කලාපය 2019 වර්ෂයේ රටේ පැවතී අර්බුදකාරි , අනාරක්ෂිත තත්ත්වය හේතු කොට ගෙන ජනතාව එකරාශිවන සියළු උත්සව හා ක්‍රියාවන් පැවැත්විය නොහැකි නිසා උතුම් වෙසක් සතිය පුරාවට අම්බලන්ගොඩ නගරයේ වෙසක් පිංකම සිදු කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ සඳහම් වෙසක් කලාපය 2019උක්ත කරුණ වෙනුවෙන් නගර සභාව විසින් ලබා දීමට තීරණය කරන ලද දායකත්වය වෙනුවෙන් ඔබතුමා ප්‍රමුඛ ගරු නගර සභා මන්ත්‍රිවරුන්ට ස්තුතිය පුද කර සිටිනවා. එනමුදු රටේ පැවතී අර්බුදකාරි , අනාරක්ෂිත තත්ත්වය හේතු කොට ගෙන ජනතාව එකරාශිවන සියළු උත්සව හා ක්‍රියාවන් සිදු නොකිරිමට සංගමය විසින් තින්දු කරන ලදී. එහෙත් අම්බලන්ගොඩ නගරයේ උතුම් වෙසක් සතිය පුරාවේ අඳුරේ තැබිමට ඔබ අප සියළු දෙනා අකමැති නිසා අම්බලන්ගොඩ නගරයේ වෙසක් පිංකම වෙනුවෙන් ගාළු කොළඹප්‍රධාන මාර්ගයේ හිරේවත්ත බුදු පිළිමය අසල සිට පටබැදිමුල්ල වටරවුම දක්වා විදුලි ආලෝක වලින් අලංකාර කීරිමටත් , ධජ මඟින් අලංකාර කිරිමත් හා සෙත්පිරිත් පිංකම පැවැත්විමටත් , මෙම ආලෝක පුජාව සඳහා

එක් විදුලි මල්ගසක් සඳහා රු 1700/= ක මුදලක් වැයවන බැවින් රු2,40,000/= ක මුදලක් විදුලි සමාගමේ මීටර් යොදා ලබා ගැනිම වෙනුවෙන් රු207500ක් සමඟ සම්පූර්ණ මුදල රු447500/= ක මුදලක් වැය වන බවට බලාපොරොත්තු වේ.2019 මේතරම් මුදලක් වැය කිරීමට ව්‍යාපාරිකයන්ට සිදුකර ගත නොහැකි නිසා ඉතා අපහසු තත්වයක පවතින බැවින් නගර සභාව විසින් යෝජනා කරගත් පරිදි සදහම් බැති ගී ප්‍රසංගය සඳහා වේදිකාව , සංගිත භාණ්ඩ හා ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා ලබා දෙන මුදල විදුලි ආලෝක පූජාවට ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. මේ සඳහා සභා අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය</u>

ගරු සභාපතිතුමනි, මා මෙය බෞද්ධ නගරයකි.මේ නගරය කිසිදු පල්ලියක් කෝවිලක් නැති බෞද්ධ නගරයකි. මෙහි බෞද්ධකම රැක ගැනිම සඳහා මෙය ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව ගරු පළාත් පාලන කොමසාරිස්තුමා සභාව ගත් කින්දුව පරිදි අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මගින් අම්බලන්ගොඩ සඳහම් වෙසක් කලාපය 2019 වර්ෂයේ සඳහම් වෙසක් කළාපය වෙනුවෙන් රු140000/= ක මුදලක් ලබා දි ඇත. එම මුදල ලබා දිමට ගරු සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.අපි ලබා දෙන්නේ විදුලි ආලෝකය සඳහා නිසා මෙහි කරණාව වෙනස් නිසා මෙහි අනුමතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ තරුණ බෞද්ධ සමිතියෙන් මේ මාර්ග සලසනු ලබන්නේ හිරේවත්ත පාලම ළග සිට පටබැඳිමුල්ල වටරවුම දක්වා පමණි. මා හිතන්නේ අම්බලන්ගොඩට පොලිසය අසළට හා ඒ අවටත් අයිතිවෙනවා. ඒ ප්‍රදේශයත් මේ සැරසිල්ලට ගියානම් හොඳ බවට මා යෝජනා කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එය තරුණ බෞද්ධ සංගමයෙන් ගන්නා ලද තින්දුවකි. එය අපි දැනුම් දෙන්නම්. ගරු නගර සභා මන්ත්‍රී ධර්මාදාස මහතාගේ ඉල්ලිම සාධරණයි. මා දන්නේ නැහැ.එය බෞද්ධ සමිතියෙන් ගනු ලැබු තින්දුවකි. ඒ අනුව එය අපි දන්වන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේ තරුණ බෞද්ධ සමිතියෙන් මේ මාර්ග සලසනු ලබන්නේ හිරේවත්ත පාලම ළග සිට පටබැඳිමුල්ල වටරවුම දක්වා පමණි. මා හිතන්නේ අම්බලන්ගොඩට පොලිසය අසළට හා ඒ අවටත් අයිතිවෙනවා. ඒ ප්‍රදේශයත් මේ සැරසිල්ලට ගියානම් හොඳ බවට මා යෝජනා කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එය තරුණ බෞද්ධ සංගමයෙන් ගන්නා ලද තින්දුවකි. එය අපි දැනුම් දෙන්නම්. ගරු නගර සභා මන්ත්‍රී ධර්මාදාස මහතාගේ ඉල්ලිම සාධරණයි. මා දන්නේ නැහැ.එය බෞද්ධ සමිතියෙන් ගනු ලැබු තින්දුවකි. ඒ අනුව එය අපි දන්වන්නම්.

**තීරණය**

අම්බලන්ගොඩ තරුණ බෞද්ධ සංගමය මගින් අම්බලන්ගොඩ සඳහම් වෙසක් කලාපය 2019 වර්ෂයේ රටේ පැවති අර්බුදකාරි , අනාරක්ෂිත තත්ත්වය හේතු කොට ගෙන ජනතාව එකරාශිවන සියළු උත්සව හා ක්‍රියාවන් පැවැත්විය නොහැකි නිසා උතුම් වෙසක් සතිය පුරාවට අම්බලන්ගොඩ නගරයේ වෙසක් පිංකම වෙනුවෙන් ගාළු කොළඹ මාර්ගය හිරේවත්ත බුදු පිළිමය අසල සිට පටබැඳිමුල්ල වටරවුම දක්වා විදුලි ආලෝක වලින් අලංකාර කිරීම සඳහා රු.140000/= ක මුදලක් ලබා දීමටත් , ධජ මඟින් අලංකාර කිරිමත් හා සෙත්පිරිත් පිංකම පැවැත්විමටත් , මෙම ආලෝක පූජාව සඳහා ලබාදෙන රු.140000/= ක මුදල සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතිය ලබා ගැනිම සුදුසු බවත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කරන ලදුව ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි හේමන්තා මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඒ පරිණත අපේ විදානපතිරණ ප්‍රජා සේවා නිලධාරනිය සත්‍ය වශයෙන්ම යමක් අධ්‍යනය කර අපගේ අදහසුත් සමඟ ගැනිමට අපට මග පෙන්වා ඇත.අපි සතුටු වෙනවා. අපි හිතුවේ අපගේ හිටපු නිලධාරිණිය තමයි කියා දකුණු ලකේ ඉහළම නිලධාරිණිය කියා. ඊටත් වඩා වැඩ පෙන්වන කෙනෙකුත් ඉදලා තිබෙනවා. මේ පාසල් සම්බන්ධව කතා කරනවිට මේ පාසල් කිහිපයකට පමණක් ලබා දිමෙන් මතභේත ඇති විමට පුළුවනි. අපේ සභාව සතුව අවශ්‍ය නිසා මැදිහත්ව යම් කිහිපයක් ලබා ගන්න. අපේ මේ දුප්පත් මුදල් ටික කොහේටවත් දෙන්න යන්න එපා.අපිට ඊටත් වඩා වැඩ කටයුතු තිබෙනවා.ක්‍රිඩා පිටිය ගැන බහුලවම කියවෙනවා.තවත් බොහෝ ප්‍රමුඛතා ලේඛණයක් තිබෙනවා.මේ භාණ්ඩ බෙදිමට ගියහොත් අපගේ මෙහි නිෂ්පාදකයාම වන ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතා ප්‍රකාශ කරනවා මෙතරම් වියදම් කරන්න එපා කියා. එම නිසා අපගේ අවශ්‍යතාවයට ලබා ගන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ක්‍රිඩාංගණය ගැන දැන ගැනිමට අවශ්‍යයි. දැන් මෙහි ජිනසේන සමාගමේ වැඩ කටයුතු සිදු කර අවසන්ද ? මොකක්ද තත්වය.

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා මුලාසනය ඔබතුමාට භාර දි සභවෙන් එළියට ගියෙත් ඒ සම්බන්ධව දුරකථන ඇමතුමක් ලැබුණු නිසායි. දුරකථනයට මාගේ බිරිඳ කතා කළත් මා සභාවේ සිටින විට කතා කරන්නේ නැහැ.ක්‍රිඩා පිටිය සම්බන්ධව කමල් ධර්මසිරි මහතා කතා කළා.මා දැන් නව සභාපති ශම්මි සිල්වා මහතා සමඟ සාකච්ඡා කලා. මේ සඳහා නව ඇස්තමේන්තුව ලක්ෂ 138ක් වැයවෙනවා. එම මුදල ක්‍රිකට් මණ්ඩලයයි දරනු ලබන්නේ.මේ වැඩ කොටසේ ටෙන්ඩර් කිරිමයි තිබෙන්නේ. එහි මේ දිනවල ප්‍රශ්නයක් තිබෙනවා. ඡන්දයක් පවතිනවා මේ දිනවල. එම නිසා ටිකක් ප්‍රමාද වි තිබෙන්නේ. අප්‍රේල් මස 28 වෙනිදා ශම්මි සිල්වා මහතා අම්බලන්ගොඩ නගරයට පැමිණිමට සිටියේ. රටේ අප්‍රේල් මස 21 දා රටේ පැවති තත්වය නිසා එය නැවතුණා.ලක්ෂ 138ක් නගර සභාවට වැය කරන එක ප්‍රශ්නයක් නැහැ. මෙහි තාක්ෂණයක් සමඟ මෙය සාදන එක ක්‍රිකට් මණ්ඩලය දන්නවා. මෙය හැදුවට පසු අපගේ සේවකයන් 3කු පුහුණු කිරිමට පොරොන්දු වුණා. මොවුන් මෙහි නඩත්තු කටයුතු , තණ තිල්ල පිළිබඳ ආදි දේවල් පුරුදු පුහුණු කිරිමට කටයුතු කරන බව.ඔවුන් තිදෙනා පුහුණු කිරිමට කලින් ලබා දි තිබුණේ මග්ගොන ප්‍රදේශයේ ක්‍රිඩාංගණයක. නමුත් අද දැනුම් දුන්නා ගාල්ල ක්‍රිඩාංගණයට යොමු කරන බවට. එය ඇත්ත තත්වය.අපි මෙයට සැදිමට මුදල් යොදනවාට වඩා මේ පිළිබඳව විශේෂඥ දැනුම ඇති කෙනෙකු සිටිය යුතුයි. ඔවුන්

ලවා මෙය කරගත යුතුයි. එම දැනුම ඇත්තේ ක්‍රිකට් මණ්ඩලයටයි.ක්‍රිඩාංගණයක සාමාන්‍ය තණකොළ වවනවාට වඩා වෙනස් ලෙස 3ආකාරයකට සිටවිය යුතුයි.එම කටයුත්ත සිදු කරන එක අපගේ වගකිමකි.ඔවුන් අපට මාස 3කින් මෙය සිදු කරන්නම් කිවා. අපි මේ වසර නිම විමට ප්‍රථම නිම කිරිමට බලාපොරෝත්තු වේ. විසිරි ජල පද්ධතිය සැකසිම සම්බන්ධව ඔවුන් අවශ කටයුතු සිදු කර අවසන්. දැන් ඊළඟ සතියේ ළිඳ සාදා දිය යුතුයි.එවගේම ජල පොම්පාගාරය සාදා දිය යුතුයි. ගිය සභාවේ ටෙන්ඩර් විවෘත කරනු ලැබුවා . නමුත් අපිට එහි විස්තර තවම ලැබි නැහැ.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගරයෙන් ඉතා දක්ෂ ක්‍රිඩකයන් බිහි වි තිබෙනවා. දැන් මේ අම්බලන්ගොඩ ක්‍රිඩාංගණය සැදිමට මෙච්චර කියනවා. නමුත් බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රිඩාංගණ 6ක් සැදිමට ටෙන්ඩර් කර තිබෙනවා.අම්බලන්ගොඩ එක නැහැ. මා ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේමහතාටත් ප්‍රකාශ කර සිටිනවා. දැන් ඔබතුමාලාගේ පක්ෂයේ අමාත්‍යවරයෙක් සිටින්නේ. මෙය බලන්න කියා.

<u>**ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙය ඇවිත් ක්‍රිඩා අමාත්‍යාංශයෙන් කරන එකකි. මෙය සිදු කරනු ලබන්නේ ක්‍රිඩා මණ්ලයෙනි.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, පින්නදුවේ වැසියන් 5කු පමණ ඉල්ලිමක් කර සිටිනවා. අමල් වර්ණකුලසූරිය, නිශාන්ත වර්ණකුලසූරිය. ආර්.එම් කෝසල , ආර්.එම් ධම්මිකා යන අය විසින් ඉල්ලා සිටිනවා පින්නදූව 3වෙනි පටුමගේ පදංචිව සිටි මොරටුවාවඩු සද්ධාසේන කියන අයට අයත් ඉඩම් කොටසක් මිලදි ගනු ලැබුවේ අය අපයි. අප වසය කරන මාර්ගයේ නිවාස වලට වරිපණම් අංක ලබා නොදි සිටිමෙන් අප දැඩි දුෂ්කරතාවයකට පත්වි ඇත.ඊට අවශ්‍ය කටයුතු සිදු කර දෙනමෙන් ඉල්ලා සිටි. ඔබතුමා දන්නවා අර ඌරු කොටුවක් තිබු මහ ඉඩම හිමිකරු විකුණා ගියා ඉඩම විකුණා. දැන් ඔහු අපේ ලංකාවේ සිටිනවාදකියා දන්නේ නැහැ.ජිවතුන් අතර සිටිනවාද කියා දන්නේ නැහැ.ඔහුට නියෝගයක් දමා තිබෙනවා මේ ඉඩම් කැබලි නැවත අනුබෙදුම් කරන්නේ නම් නගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි වලට අනුව ප්‍රවේශ මාර්ග ඇතුලත් කරන ලෙස. මොහු මේ පහසුකම් ලබා නොදි තමයි මේ ඉඩම විකුණා දමා ගියේ. දැන් මේ මාවත අඩි 30ක් විතර පළලයි.මොවුන්ට වරිපණම් අංක ලබා ගැනිමට ක්‍රමයක් තිබේද? ඔවුන් කොටස් වශයෙන් වුණත්ලබා ගැනිමට සුදානම්.

<u>**ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙය මෙතැන කතා කරන්න එපා. සැලසුම් කමිටුවට ඉදිරිපත් කරන්න.මොකද සැලසුම් කමිටුව ගනු ලැබු තින්දුවක් නිසා.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, එහෙම වුණොත් ඒ ඒ කොටස් වලට 1% ගාස්තු ගෙවිමට යම් සහන පදනමක් ලබා දිය හැකිද ඔවුන්ට.

<u>**ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

බලමු එය. ඔය ලිපිගොනුව බලන්නේ නැතිව මා දන්නේ නැහැ ඒ පිළිබඳව.

<u>**ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මිට මාස කිහිපයකට පෙර වාද විවාද වලින් සහිතව මේ ගරු සභාවේ සම්මත වුණා. කොට්ඨාශ ක්‍රමයට වැඩ කිරිම.නමුත් මේ ක්‍රමයේ මානව හා භෞතික සම්පත් යෙදවිමේ යම් යම් අසාර්ථකත්වයක් දැක ගන්නට ලැබුණා. දැන් මාස 1 ½ වෙනවා අප ගම් ප්‍රදේශයේ මෙම වැඩ කොටසක ඉටුකරනු ලැබුවේ.ඉතා අපහසුතා මැද තමයි ඉටු කරගනු ලැබුවේ. දැන් මහ මුකලාන වැවි තිබෙනවා මාර්ග වල. දැන් මේ වැඩ කොටස

පලවෙනි වටයේ පමණක් කර දෙවැනි වටයේ අහෝසි කිරිමට බැරිද?අපගේ ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා ඉදිරිපත් කරනු ලැබුවේ ඉතා වටිනා යෝජනාවකි. සම්පත් හිඟකම නිසා මෙය කරගැනිමේ දැඩි අපහසුවක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් තේරුම් ගත යුතුයි. අද දිනයේ හෙප්පුමුල්ල කොට්ඨාශයේ යොදවා ඇත්තේ. අද කට්ටිය යොදවා ඇත්තේ ඉතා අඩුවෙනි. අද දිනයේ ප්‍රජාපති විද්‍යාලය සඳහා පිරිස් යොදවා තිබෙනවා. යම්කිසි ප්‍රශ්නයක් ඇති වුවහොත් මාර්ගය සකසා ගත යුතුයි. එය සුද්ද කිරිමට. ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතා පැමිණි විට මා ප්‍රකාශ කරනු ලබන්නේ මට මෙය අද දිනයේ කළ යුතු බවයි. දේවානන්ද විද්‍යාලයේ පිටුපස සුද්ද කළ යුතුයි. මේ සිටින පිරිසගෙන් වැඩ කර ගන්න අමාරුයි. තිබෙන විදියට ක්‍රියාත්මක කරගෙන යන්න.ඔබතුමාට මාස 1 ½ උඩදි ලැබුණාට මට තවම හම්බ වුණේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ අත්දැකිම ලබපු මන්ත්‍රීවරයෙක් මා. ගරු උප සභාපතිතුමා සමඟ පොඩි ප්‍රශ්නයකුත් ඇතිවුණා. මෙතුමා කරනු ලැබූ යෝජනාව මා අගය කරනවා.ඔබතුමා දෙනු ලැබූ සහායත් මා අගය කරනවා. ගරු මන්ත්‍රීවරයෙක් විදියට මේ සුමානයක කාලයක කොට්ඨාංශය තුල වැඩ කිරිම ගැන අවංකම සතුටු වෙනවා.ඒ අදාල ගරු මන්ත්‍රීවරයා එම කොට්ඨාශය තුල මේ දින ටිකේම සිටිමෙන් විශාල වැඩ කොටසක් කර ගැනිමට පුළුවනි. මොකද එම අත්දැකිම මට තිබෙනවා. ප්‍රායෝගිකව ගැටළු තිබුණා.කාලගුණේ පිළිබඳ ප්‍රශ්න, සේවකයන් යෙදවිමේදි. විශේෂයෙන් මා කිව යුතු දෙයක් තිබෙනවා කර්මාන්ත අංශයෙන් හා සෞඛ්‍ය අංශයෙන් සේවකයන් හා නිලධාරින් පිළිබඳව මා ඇඟයිමක් කරනවා. විශේෂයෙන්ම මේ ආරක්ෂක ප්‍රශ්නය නිසා බැකෝ යන්ත්‍රය දින 5න් ම මා හට ලැබුණේ දින 1 ½ පමණි.අර ඉතිරි ටික මට කර ගැනිමට නොහැකි වුණා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ දින 7 කොට්ඨාශය තුල වැඩ කාණු පද්ධති ආදි වැඩ කටයුතු කිරිම ගැන මා සතුටු වෙනවා. 75% ක් විතර මා සතුටු වෙනවා. ගරු සභාපතිතුමා විදියට මා ඔබතුමාට විශේෂයෙන් ස්තුති වන්ත වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ යෝජනාව මා කරනු ලැබුවේ ඒ අදාල මන්ත්‍රීවරයා ප්‍රකාශ කළ පරිදි එම ගම්වලට ඒ මන්ත්‍රීවරුන්ට සේවයක් කිරිමට පුළුවන් වෙයි කියන මතයේ සිටයි. ගරු සභාවක් විදියට මේ වගේ යෝජනා ක්‍රියාත්මක කිරිමට අපහසුයි. හැබැයි මා ඉන් අදහස් කළේ නැහැ ඔබතුමාට අනිවාර්යෙන්ම මෙය කරගෙන යන්න කියා. ඔබතුමාට මේ හදිස්සි අවස්ථාවකදි මේ යෝජනාව නතර කර එම හදිස්සි අවශ්‍යතාවයට මුහුණ දිය හැකිය. එහෙම අවශ්‍යතාවයක් නැහැ. මේ තිබෙන වතාවරණයේදි මේ තිබෙන කාර්යයන් කර ගන්න.එයට මුහුණ දෙන්න. ඊට පසු එතුමාට දිනයක් ලබා දෙන්න මේ දිනයේ සිට ඔබතුමාගේ කොටසේ වැඩ කටයුතු සිදු කරනවා කියා.එවිට ගැටළුව අවසන්. මා අදහස් කරනු ලැබුවේ ඊට වඩා එහාට පුළුල්වල ගිය වැඩසටහනකි.මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්, දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරිතුමිය සමඟ සාකච්ඡා කර ඒ අපේ සියළුම මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන් කොට්ඨාශයට සම්බන්ධ කිරිමට. විශේෂයෙන්ම ඩෙංගු උවදුර ඇති වකවනුවක එම කොට්ඨාශයේ එක් දිනයක හෝ දෙකක එම නිලධාරින් 7 සැම නිවෙසක්ම පරික්ෂා කර බැලිමට.ඊටපසු එම කුණු කසළ පාරට ගෙනත් දමා අපගේ ට්‍රක්එකෙන් ගෙනහින් දැම්මට.ඒ ගමක් සුද්ද කිරිමට. මා මේ පිළිබඳව ගරු ලේකම්තුමිය සමඟ සාකච්ජා කළා. ඒ අදාළ කොට්ඨාශය තුල ලේකම්තුමිය හා අදාල ප්‍රධාන නිලධාරින් 4නා සමඟ සාකච්ජා කළ අදාල කොට්ඨාශය තුල කළ යුතු වැඩ කොටස් ටික සවිස්තරව ලබා දිමට . මේ ජනතාවගේ ඉල්ලීම්. සමහර ජනතාවගේ ඉතා කුඩා ඉල්ලීම්.නමුත් මෙතැන මේ පොඩි දේ වෙනුවෙන් සේවකයකු ගන්න බැහැ. මා 4වතාවක් ප්‍රකාශ කර සිටියා හල්වතුරේ බොක්කුවට පස්දමා බස්රථ යාමට සාදා තිබුණා. හැබැයි එහා පැත්තේ කාණු වසා.සම්පුර්ණ කාණු වසා. මේ නිසා කාණුවල ජලය ගලා බසින්නේ නැතිව මදුරුවෝ

බෝ වි ඇත. ජනතාව 3න් වතාවක් දුරකථන ඇමතුම් ලබා දුන්නා.මේවා ඉතා පොඩි කරණා. මා ඉල්ලා සිටියා එක් සේවකයකු යොදවා පස්ටික අරගෙන දමා ජලය බස්සන ලෙස.පසුව අපි කාණු සුද්ද කර ගන්නම්.ඒ දේටත් අපට වේලාවක් නැති වෙනවා. මා ප්‍රකාශ කර සිටියේ මේ සියළුම සේවකයෝ එක් කොට්ඨාශයකට යොදවන්න. ඔබතුමාගේ මාර්ග යෝජනා වලට 10කු ගියවිට හිමාල් මහතාට ඉතිරි වන්නේ සේවකයන් 2කු පමණි.එහෙම නැතිනම් උපරිම 3කි.එකෙනුත් මළ ගෙදරක් හෝ විශේෂ මොකක් හරි වැඩකදි ඒ පැත්තට මේ පැත්තට ඇදීමට සිදු වෙනවා. එම සතිය තුල අදාළ කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරයාට මාර්ග වල නම් වැඩ කටයුතු සිදු කළ යුත්තේ. ඔහු එම වැඩ කටයුත්ත සිදු කර ගනු ලබයි.උදාහරණයක් ලෙස මාගේ කරිත්ත කන්ද ප්‍රදේශයේ මට තිබෙන්නේ කාණුටික සුද්ද කිරිමට නම් ගස්වල අතු කැපිමට නම් එම වැඩකටයුතු ටික ඒ අදාල නිළධාරින්ට ඉදිරිපත් කරනවා. එවිට ඔවුන් දන්නවා මේ සතිය තුල මේ වැඩ කටයුතු ටික තමයි මේ කොට්ඨාශයේ සිදු කෙරෙන්නේ කියා. වරිපණම් ගෙවන අපට ඡන්දය දුන් ජනතාව දන්නවා ගමට පැමිණ ගමට වැඩක් කරන බව. සමහර ගම්වල ඒවා කෙරෙන්නේ නැහැ. ගස්කොළන් වල අතු කැපුවෙත් නැහැ. ඒ ජනතාව කැපුවෙත් නැහැ. දැන් වසර ගණනාවක්ම කොමසාරිස් පාලනය තිබුණ නිසා.අසල් වැසි ගෙදර මනුස්සයාට බැහැ අසල්වැසි නිවසේ මේ ගස කැපිමට.මහා පරිමාණ ක්‍රියාවලි නෙමේ. පාරවල් තාර දැම්මට නෙමේ. කාණුටික සුද්ද පවිත්‍ර කර ගස්කොළන් වල අතු කැපිම, ගම සුද්ද පවිත්‍ර කිරිම වැනි සුළු ක්‍රියාවලින් ටිකක් පමණි. සේවකයන් 2කුගෙන් මෙය සිදු කරන්න පුළුවන්ද කියන එක ප්‍රායෝගික ගැටළුවක් තිබෙනවා.මා ප්‍රකාශ කරන්නේ මේ ඔබතුමාගේ මර්ග සංවර්ධන වැඩ සටහනත් සමඟ එකට කරන්න.එතකොට කිසිම ගැටළුවක් ඇති වන්නේ නැහැ. උදාහරණයක් ලෙස ඔබතුමාට අවශ්‍ය වෙනවා නම් අද හදිස්සි තත්වය මත සියළුම සේවකයන් අවශ්‍ය වෙනවා නම් ඒ සියළුම සේවකයන් යොදවා එම කටයුත්ත සිදු කරන්න.ගරු සභාපතිවරයා වශයෙන් ඔබතුමාට ඒ බලය තිබිය යුතුයි. උදාහරණයක් ලෙස කළුවඩුමුල්ල ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කරනවා නම් මේ මාර්ග දෙකේ තාර දමන්න කියා. එම සතියේ එම මර්ගවල තාර දමා දෙන්න.ඊළඟ දින 3දි පුළුවනි කාණු සුද්ද කර ගස් කොළන් ටික කැපිමට.එවිට එම කොට්ඨාශයේ වැඩ කොටස් 50%ක්වත් කෙරෙනවා.නැවත මාස 1 ½ කින් 2 කින් මෙය නැවත ගමට පැමිණෙනවා.ගරු සභාපතිතුමාට , ලේකම්තුමියට බලය තිබෙනවා එම වැඩය නතර කර සේවකයන් වෙන වැඩකට යොදවන්න.මා මේ කරන දෙයින් ජනතාවට දැනෙනවා නගර සභාව යමක් කරන බව .ගරු මන්ත්‍රීවරු වශයෙන් ජනතාවගෙන් පාර තොටේදි , වාහනයට අත දමා කියන මේ පැමිණිලි නතර වෙනවා. ජනතාවට දැනෙනවා ඒ අයට යම් සේවයක් වන බව. එයයි මෙහි ප්‍රතිඵලය. මා ප්‍රකාශ කරන්නේ මාගේ සතිය තුළ ලේකම්තුමියණනි මාගේ කොට්ඨාශය තුළ මා කියන වැඩ කටයුතු ටික සිදු කිරිමට බැරිද ? එකඟතාවය විතරක්නේ අවශ්‍ය.එතුමා කියන වැඩ කොටස් ටිකට නිලධාරින් එකඟ විමට පුළුවන්ද ? බැරි දේ කොහොමත් කරන්න බැහැ. මාගේ සතිය තුල මා මගේ කොට්ඨාශය තුල සිටිනවා ඒ දායකත්වය සපයනවා නිලධාරින්ට.දැන් මෙතුමා දින 5ම මහන්සි එම වැඩටික කරගනු ලැබුවා නිලධාරින් මගින්. එවිට එම නිලධාරින් එම කාර්ය සංතෝෂයෙන් ඉටු කරනවා. අපි කිසි කෙනෙක් දන්නේ නැතිව ගමකට පැමිණ වැඩ කටයුතු ටික කළ විට ඒ අධික්ෂණ කටයුතු ටික කිරිමට නිලධාරින් 2 සිටිනවා . එපමණයි.ඔවුන්ට ඔතන පැය ගණනම රැදි සිටින්න බැහැ.එහෙම මෙතැන දවසක් මෙතැන වරුවක් වැඩ කළා කියා ජනතාවට දැනෙන්නේ නැහැ.නගර සභාවෙන් මෙපමණ වැඩක් කරනවා කියා. ලක්ෂ ගණනක් මුදල් වියදම් කරනවා.එම කාරණාව කොට්ඨාශය තුල එකතු වි කළ විට එහි ප්‍රතිඵලයක් තිබෙනවා. ප්‍රතිලාභයකුත් තිබෙනවා. මෙතරම් වියදම් යන්නෙත් නැහැ. දිනක් වැඩ කිරිමට නොහැකි වුණත් තවත් දිනයක් දිර්ඝ කරන එකනේ තිබෙන්නේ. මොකද අපගේ සේවකයන් විසින් මෙම කාර්ය ඉටු කරන නිසා.හාභිරව සිටින්නේ ඔය මහජන සෞඛ්‍ය පරික්ෂකවරු විතරයි.කොහොමත් අපි කිව්වත් නොකිව්වත් ඩෙංගු සඳහා වැඩ සටහන් හදනවා.එතකොට නිවෙස් පරික්ෂා කිරිමේදි.එම නිලධාරින් ඒ සතිය තුල එම ගම පරික්ෂා කළ විට අංග සම්පුර්ණ වෙනවා එම ගම.මෙයට පුළුවන් ආකාරයට මේ කාර්ය ඉටු කර ගැනිමට සහායෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි. ඊයේ දිනයේ සිට අපගේ කොට්ඨාශය තුලයි මේ සුද්ද පවිත්‍ර කටයුතු සිදු වන්නේ.සෞඛ්‍ය අංශයෙන් සේවකයින් 4කු ලැබුණා.කර්මාන්ත අංශයෙන් 2කු ලැබුණා.බොහෝ දුරට ඊයේ දිනයේ වැඩ කටයුතු මා ළඟ සිටම කරවා ගත්තා. ගොඩක් වැඩ කෙරුණා. එම නිසායි මා අද උදයේ ඔබතුමාට කතා කළේ. බැකෝ යන්ත්‍රය පැමිණ තිබුනේ නැහැ. මා හිතන්නේ බැකෝ එක එච්චර අවශ්‍ය වෙනකන් නැහැ.මට වැඩිපුර දිනයක් අවශ්‍ය වන්නේ නැහැ. තවත් දිනයක් තිබෙනවා.මාර්ගයේ තාර දමන වැඩය ඔබතුමා කර දෙනු ලැබුවා. ඒ පිළිබඳව ඔබතුමාට මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා.ඊට සහායෝගය ලබා දුන් කර්මාන්ත අංශයේ වැඩ පාලකතුමාටත් සෞඛ්‍ය අංශයේ සාරාංග මහතාටත් ඔබතුමාටත් ගෞරව පූර්වක ස්තුතිය පුද කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහිදි මා සදහන් කළ යුතුයි. ගරු මන්ත්‍රීවරු සමඟ යම් ගැටළුකාරි තත්වයක් උදා වී තිබුණේ අපි බලයට පත්වන විට සමස්ත මාර්ග පද්ධතියම නරක තත්වයේ තිබුණේ. අදවන විට එම තුවාලය 80% ක් 90% සුව කර අවසන්. උදාහරණයක් ලෙස හිරේවත්ත කොට්ඨාශයේ තාර දැම්මට එක පාරක්වත් නැහැ.පටබැඳිමුල්ල ප්‍රදේශයේ තාර දැම්මට එක මාර්ගයක්වත් නැහැ. හෙප්පුමුල්ල ප්‍රදේශයේ තාර දැම්මට එක මාර්ගයක්වත් නැහැ.ටෙන්ඩර් කර තිබෙනවා අලුත් පාරක් දැම්මට. කරිත්ත කන්ද ප්‍ර දේශයේ තාර දැම්මට මාර්ග නැහැ. එක පුංචි කොටසක් තිබෙනවා.මේ දිනවල කළුවඩුමුල්ල ප්‍රදේශයේ වැඩ කරගෙන යනවා.ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් කතා කර දැනුම් දුන්නා ජාතික සවිය යටතේ ලියනාරාච්චි ප්‍රදේශ සංවර්ධනය කරන බවට. එහි තාර දැම්මට පසු කළුවඩුමුල්ල ප්‍රදේශයේත් නැහැ.ඕකන්ද ප්‍රදේශයේ තිබෙන්නේ විහාරගොඩ පාර. විහාරගොඩ පාර ගම්පෙරළිය වැඩසටහන යටතේ සිද්ද කරනවා.ඊට අමතරව පොල්වත්ත පාර තිබෙනවා. ඊට අමතරව පොල්වත්ත පුර පාර තිබෙනවා.ඔබතුමාලා ගම්පෙරළිය වැඩසටහන යටතේ එය ලබා දි තිබෙනවා. දැන් ඉතිරි වෙන්නේ තල්ගස්ගොඩ විශාල කොටසක් අයිති වෙනවා.ඔබතුමාගේත් සම්පූර්ණ අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පින්නදූව ගම්මානයේ තවත් මාර්ග කිහිපයක් තිබෙනවා. පින්නදූව පටුමග හා පින්නදූව වටරවුම් පාර.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කැඩිච්චා නැහැ. මා ගොස් බලා තිබෙනවා.මා සිතු මාර්ග වලට වඩා ඔබතුමාලා කරනු ලැබුවේ වෙනත් මාර්ගයි.මා දුටු පින්නදූවත් කෙරම්ණියත් මැද තිබෙන මාර්ගය තමයි දූව වත්ත පාර . එය කැඩිලම තිබුණ මාර්ගයක් . නමුත් ඔබතුමා කළේ අන්තිම කොනේ තිබෙන මාර්ගයයි. මා හිතනවා ලබන මාසය වන විට සමස්ත පාරවල් 100% ක්ම නිම කරන්න පුළුවනි.ඔය ගම් පෙරළිය වැඩසටහන යටතේ කරන මාර්ග වල වැඩ අවසන් වු විට සියළුම මාර්ග අවසන්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

මහ අම්බලන්ගොඩ මාර්ගයයි, මානිම්මුල්ල මාර්ගයයි යන්න බැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වතුගෙදර සිට පැමින සුසාන භුමියට ඇතුළුවන තැන මාර්ගය. මා එදා ඔබතුමාටත් පෙන්නුවා.ඔබතුමා ගිහින් බලන්න. යන්න බැහැ. පණුවෝ නලියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සමහර මාර්ග වල ගම්පෙරළිය යටතේ දුන්නේ ජනවාරි මාසයේ. අපට මෙය සිදු කරනවා කියා.තාම ඒ වැඩ සටහන් පටන් ගත්තේ නැහැ.තත්වය බොහොම දරුණු අතට ගිහින් තිබෙනවා.ඉතා ඉක්මනින් මේ වැඩ කොටස් අවසන් කරන ලෙස ඉල්ලා සිටිනවා.නැතිනම් ජනතාවයි මින් තැලෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

මානිම්මුල්ල පාරේත් මහ අම්බලන්ගොඩ මාර්ගයෙත් කැඩුණු තැන් වැසුවාට ඒ මාර්ග දෙකම කැඩී තිබේ.යන්න බැහැ වළවල්.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මානිම්මුල්ල මාර්ගය ගම්පෙරළිය යටතේ නම් කර තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

පොඩි ප්‍රමාදයක් සිදු වුණා. අපගේ ගරු මන්ත්‍රීවරු අර යෝජනා වලට යම් යම් ගැටළු මතු වුණ නිසා දැන් ඒ ගැටළු විසඳලා එහි සංශෝධනත් සමඟ මුදල් අමාතශාංශයටත් ප්‍රතිපත්ති අමාත්‍යාංශයටත් ලබා දුන්නා.සංශෝධන නැති ඒවා ක්‍රියාත්මකයි. දැන් මේ හිරේවත්ත කොට්ඨාශයේ හැදෙනවා.මා ප්‍රකාශ කරනවා විලේගොඩ හංදියේ සිට මහ අම්බලන්ගොඩ මාර්ගය කාපට් කරනවා. අද එම සමාගම ගිවිසුම් අත්සන් කරනවා . තල්ගස්ගොඩ ඩිපෝ එක අසළමාර්ගය ගොඩහේන මාර්ගය කාපට් කරනවා. එම ගිවිසුමත් අද අත්සන් කරනවා.ගම්පෙරළිය මාර්ග ටික ඔක්කොම ක්‍රියාත්මක වෙනවා. මට ගැටළුවක් ඉදිරිපත් කලා. මහ අම්බලන්ගොඩ ළමා උද්‍යානය සවි කිරිමට පැමිණි සමාගමෙන් ප්‍රකාශ කළා ඔබතුමා අර නිවෙස් දෙකට යාමට පාර තබන්න කියා.එක්කෙනෙක් මට අද කතා කළා.එතකොට අඩි 10 පාර තැබුවාම ළමා උද්‍යානයේ දේවල් සවි කිරිමට ඉඩ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දෙපැත්තේ සවි කරන්න. අඩි 10ක් පාර තබන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එවිට නිවෙස් දෙකටම පාර තැබිය යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අඩි 10 පාර ගොස් දෙපැත්තේ ගේට්ටුවලට බෙදෙන්න දමන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

දෙපැත්තෙන් අඩි 20 ක් දුන්නාම ළමා උද්‍යානයක් ඉදිකරන්න බැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අඩි 20ක් නෙමේ. අඩි 10 පාර දුන්නාම ළඟ ගේට්ටුවක් තිබේනම් එතැනින් පාර දෙන්න.මේ අය සමඟ එකකට එක කරන්න ගියොත් මේ වැඩය කරන්න වෙන්නේ නැහැ.නඩුවක් දැම්මොත් අපට මෙය කල් යනවා.එතකොට ඔබතුමාගේ මුදල් අපරාදේ. මෙය කරන්නත් බැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ඒ ප්‍රමාණවල් ටික අපට වෙන්කර දෙන්න පුළුවනිද ?

<u>**ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ප්‍රාදේශිය ලේකම් හා තාක්ෂණ සේවා නිලධාරි, සැලසුම් අධ්‍යක්ෂක සමඟ ගොස් මා පෙන්නුවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ඔබතුමා කියන පරිදි නඩුවකට ගියොත් කල් යනවා . මුදල් වැයවෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මුදල් යනවා නෙමේ. කාලය වැයවනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

එය කොන්දෙකෙන් දෙන්න බැරිද ? නිවෙස් දෙකටම වෙන්න.එක ගෙදරකට ලලිත් මහතාගේ ගබඩාව පැත්තෙන් පාර තිබෙනවා.එම නිවසට පාරක් අවශ්‍ය නැහැ. ඒ අයට අයිතියකුත් නැහැ ඔතන පාර.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්**</u>

දෙගොල්ලන්ටම නැහැ පාරක් . මෙය අදාල සිතියම ගෙන පෙන්වන්න කියන්න. දැන් මෙහි දෝෂාරෝපණය ඇවිත් තිබෙන්නේ ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවියට, මට හා ඔබතුමාටයි.ඒ වාට නම් බැණුම් අහන්න බය නැහැ. අපි ඇවිත් තිබෙන්නේ මෙතැන වැඩක් කර යන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

අර නිවසට නම් කිසිසේත්ම අවශ්‍ය නැහැ.

<u>**ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ගරු මන්ත්‍රිවරු මැදිහත්වෙලා කටයුතු කරන්න. මට ප්‍රශ්නයක් නැහැ.මා ඔබතුමාලාට සහාය දෙන්න එතැනට ගියා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

අර පැත්තේ ගෙදරට නම් කිසිසේත් පාරක් අවශ්‍ය නැහැ . ඒ අයට පාර තිබෙනවා.කේ.ඩී.පි ගෙදරට පාරක් තිබෙනවාද පිටු පසින්

<u>**ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පාරක් නැහැ පිටුපසින්.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

දැන් කොහොමහරි පාරක් දෙන්න වෙනවානේ.ඔබතුමා අර අයට මෙහෙම ගෙන බෙදන්න කිව්වාට ඒ අයට පාරක් දෙන්න අවශ්‍ය නැහැ.අපි යෝජනා කරන්න කේ.පි. ටි . නිවස මුල්ලෙන් පාර දී එක එල්ලේම වට කරන්න.එතකොට අර බඩු ටික සවිකරන්න පුළුවනි. නැතිනම් ලොකු අපහසුතාවයක් වෙනවා.එම

සමාගම ප්‍රකාශ කර සිටියා අර පෙන්නපු ටිකේ බඩු සවිකරන්න ගියාම වැටවල් ගසන්නත් ලොකු වියදමක් යනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වැටවල් ගසනවා කිව්වා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නැහැ වැටවල් ගසන්න කැලි කැලි විශාල මුදලක් වැය වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාට ලක්ෂ 25ක් ලැබෙනවානේ. ලක්ෂ 9ක් ඉතිරිවෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

නැහැ ලක්ෂ 25ක් නෙමේ. ලක්ෂ 17කි.මෙතැන හල්වතුරේ එකකට සම්පූර්ණ ලක්ෂ 25ම දුන්නා.එතැනින් පාර දුන්නොත් මේ බඩුටික සවිකර වැට ගසා ලස්සනට බංකු ටික සවිකරන්න පුළුවනි.අදාල සමාගම ප්‍රකාශ කරන්නේ අර විදියට වැට ගැසුවොත් බඩුටික සවිකරන්න ඉඩ මදි. එහෙම වුණොත් තවත් බඩු අඩු කරන්න වෙනවා. එහෙම වුණොත් තවත් සංශෝධනයක් දමන්න වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඔබතුමාලාට අවශ්‍ය වන විදියට කොනෙන් දි කරන්න. මං බැලුවේ ඔය පාර්ශව දෙකෙන්ම ඔය පාර භාවිතා කර තිබෙනවානේ.භාවිතා කර තිබෙන නිසා හදිස්සියේවත් නඩුවකට ගියොත් අපට මේ වැඩය අවුරුදු දෙක තුනකට නතර කිරිමට වෙනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එහා පැත්තේ ගෙදර අයට පාර තිබෙනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

හරි ඒ වුණාට නඩුවක් ගියොත් නතර කරන්න වෙනවා.ඊට හොඳයි ඒ අයට වෙන්කළාම හිත සතුටු වෙනවා. නඩුවක් දමන්නෙත් නැහැ.වැඩේ කෙරෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහෙම නම් අයින් දෙකෙන් වෙන්කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

නඩුවක් දානවාද කියා බලමු

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙහෙමයි නඩුව දැම්මටත් ආවා මං ළඟට.මා ප්‍රකාශ කළා ඔයා නඩුවක් දමනවානම් දැමිය යුත්තේ මටයි කියා.අපෝ කියා ඔහු ගියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ඉතිං දාපු දෙන් නඩුවක්.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මට ප්‍රශ්නයක් නැහැ. මා උසාවි යන නිසා මට නඩුවකට යන එක මහදෙයක් නෙමේ.නඩු කියන එක නෙමේ ප්‍රශ්නේ. මෙයට තහනම් නියෝගයක් ගියොත් අපිට මේ මුදල් ටික මේ අවුරුද්දේ යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

මුදල් ටික යන්න දෙන්න බැහැ. සංශෝධන බැහැ මෙහි.මුදල් ටික යන්න බැහැ ඔක්තෝම්බර් මාසය වන විට මේ ටික නිම කරන්න ඕන. අර ගෙදරට ලිඛිතව දන්වා යවමු . කේ.ටී.ආර් නිවසට පාර දෙන්න.එහෙම නැතිනම් අර අයට මුල්ලේ තාප්පය තිබෙන මුල්ලෙන් පාර දෙන්න. ඒ අයට කරුණු පැහැදිලි කර ළමා උද්‍යානයට වැටක් ගැසිමට අවශ්‍ය නිසා. අර ජංගල් නෙට් කියන එක සවි කිරිමට විශාල ඉඩක් අවශ්‍යයි. එහි ළමුන් 60කට විතර එකවර සෙල්ලම් කළ හැක.එය සවිකරන්න බැහැ අර වගේ කැළි කැළි වන සේ වැට ගැසිමෙන්.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හරි ඔබතුමාලා එය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පි.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ඔබතුමාලා අපේ ගමේ. අපි ඔතනින් ගමන් කරපු අය. නගර සභාව සතු භූමියක් නැහැ.එය කෙරෙන හරි විදියකට කරන්න.නැතිනම් ඔය නගර සභාව සතු භූමියක් නෙමේ වෙනවා. මෙතැනින් පාරයි අතිනින් පාරයි දෙන්න ගියාම.ඒ පාර ගැස් කඩයට මෙහායින් කැල්ලයි. තව එහායින් කැල්ලයි.තව එහායින් කැල්ලයි. හරියට අනුබෙදුම් හතරක් ඉදිරිපත් කළා වගේ. එක්කෝ ඔයටිකට අනු බෙදුම් දෙන්න ඕන.මෙය නගර සභා සතු දේපල .එයට මොකක්ද කරන්නේ කියා පිළිතුරු ලබා දෙන්න.දැන් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමානේ මෙයට ප්‍රතිපාදන දෙන්නේ . මෙයට පිළිතුරක් ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දූවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා කිවු පරිදි අර අයට ලිපියක් යවනවා ඒ අයට පාර ඇත්තේ පිටු පසින් කියා. කුඩා කාලයේ සිටම අපි දන්නවා උචිත් කමල් මහතා ඔය පාර භාවිතා කළා.ඔවුන් සාධාරණයි තාප්පය සමඟ අඩි 10ක පාර දීම එහා කොනෙන්. එවිට එක හා සමාන ළමා උද්‍යානයක් අපට තිබෙනවා.මේ බඩු වලට ආරක්ෂාවක් ඕන. ලක්ෂ 17ක බඩු සවිකරන්නේ.නගර සභාවෙන් ලිපියක් යවන්න. තාප්පය අයිනෙන් පාර භාවිතා කරන්න. අර අයට අරපැත්තේ පාර භාවිතා කරන්න කියා. මොකද මෙතැන ළමා උද්‍යානයක් තිබු තිනකි . මෙතැන මැද කොටසේ ළමා උද්‍යානය හදනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

2019 අගෝස්තු මාසයේත් 2018 ඔක්තෝම්බර් මාසයේ පැවති සභා වාරයේත් මේ අදාහානාගාරය පිළිබඳ සාකච්ඡා කළා. නමුත් මේ වන කම් කිසිම දෙයක් කෙරුණේ නැහැ. ගොඩනැගිලි කඩන් වැටිලා, වල් වැදි ඇත. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලක්ෂ 17ක් කොහේ වෙන්කළා කිව්වා .නමුත් මෙය කෙරි නැහැ.දැන් මෙය කරන්න. මේ ස්ථානයට ලංකාවේම සිටින ජනතාව පැමිණෙනවා.එසේ පැමිණිමෙන් ඔවුන් සිතනවා මේ නගර සභාව මොකක්ද කියා. මේ විදියට විදහා දක්වන්න එපා.මේ ගොඩනැගිලි ටික කඩන්න. දැන් සභාවෙන් හරි මුදල් වෙන්කරන්නකෝ.මගේ නිල සෙවණ හදන එකත් නතර වුණා. ලක්ෂ 120ක උද්‍යාන

හදනවා කියා. දැන් මා එතැන නිල සෙවණ හදනවා.ඔබතුමා සුද්ද කර දුන් තැන.ගමේ කිසි ආරවුලක් නැහැ.පෙර පාසලත් හරි, දරුවන්ට සෙල්ලම් කිරිමට ක්‍රීඩා පිටියත් බෙරෙනවා.මට නිල සෙවණට වඩා ගමේ ජනතාව ඕන.එදා ඔබතුමා සුද්ද කරන තැන නිල සෙවණ හදන්න ඉඩ දෙන්න.ගොඩනැඟිලි ටික කඩා ඉවත් කරන්න. අපි අදාහනාගාරයෙන් යම් මුදලක් උපයනවානේ.එතැන ලස්සනට සාදා දෙන්න.සමහර ජනතාව ප්‍රකාශ කරනවා අර කැඩුණු ගොඩනැඟිලි වල එක එක්කෙනා සිටිනවා කියා. දැන් මේ රටේ පවතින තත්වය අනුව ආරක්ෂක තත්වයට බලපෑම්වේ.මෙය ඉක්මනට කරන්න.ගරු ප්‍රධාන අමාත්‍යතුමා මුදල් වෙන්කර මොකක්හරි ප්‍රශ්නයක් වුණානේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මහ ඇමතිතුමා මුදල් වෙන්කරන්න යන විට මෙතුමා කරන ප්‍රකාශ ආරංචි වී එය නැවැත්තුවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

අන්න පෙනවානේ ඔබතුමා කරන ප්‍රකාශ නිසා ලක්ෂ 120ම අවලංගු කරලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපට එකත් නැති වුණා

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එතුමා සමඟ මා අවුරුදු 20කට වැඩියේ වැඩ කරලා තිබෙනවා.ඔබතුමා ගත්තේ ඊට පසුව. එතුමා සමඟ වැඩ කරන්න ගෙන වසර 5ක් විතර ඇති.මා වසර 20ක් වැඩ කළා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වසර 20ක් වැඩ කළ එක වැඩක් නැහැ මෙතන. ඔබතුමා යම් යම් ප්‍රකාශ කරන විට හිතන්න ඕන.ඔබතුමා නගරාධිපති.ඔබතුමා වගකිමෙන් කතා කළ යුතුයි. අපි ගිහින් බලන්නේ මේයට යම් මුදලක් ලබා ගැනිමට

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි පොරොන්දු වුණේ නැහැ. ඔබතුමලා තමයි පොරොන්දු වුණේ දැන් මෙහෙම දෙයකට මුදල් ලබා දෙනවා කියා. අපි එයට කැමැත්ත දුන්නා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා එයට එකඟ වෙන්නේ නැහැ. ගරු සභාපතිතුමා එහෙම ප්‍රකාශයක් කළා කියා නගරයට එන මුදල් නතර කරන්න එපා.එය වැරදි වැඩකි.ගරු සභාපතිතුමාට ඕන ප්‍රකාශයක් කළ හැකියි.ඒ හින්දා නතර කරන එක වැරදියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා කියන කතාන්දරය නෙමෙනේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

මා කියන කතාන්දරය නෙමේ.ගරු සභාපතිතුමාට ඕන ප්‍රකාශයක් කළ හැකියි. හැබැයි නගරයට එන මුදල් නේ ඒ.එය නගරයට කරන දෙයක්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

නගරයට තමයි කළේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ර්.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමා දැන් පළාත් සභා අවසන්නේ. මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා නිලයේ නැහැ. මා ඉල්ලා සිටිනවා මෙයට සභාවේ අනුමතිය ලබා ගන්න.මට අවශ්‍ය වන්නේ අදාහනාගාරයේ කැළය සහ කැඩි ඇති ගොඩනැඟිලි සියල්ලම ඉවත් කරන්න.අදාහනාගාරය සකස් කර දෙන්න.මොකද ආදාහනාගාරය මුදල් උපයනවා.අර ආදාහනාගාරයේ පහළ සුද්ද කර දෙන්න.

<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැන් ආදාහනාගාරයේ එකක් නෙමේනේ. ඔබතුමියට අවශ්‍ය ගොඩනැගිල්ල සෑදීමටනේ.දැන් එය යෝජනා කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී ර්.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

මා යෝජනා කළා. ගමේ හැමදෙනා ඔබතුමාලා අපි සකච්ඡා කරනිසා මා යෝජනා කරනවා මුලින්ම යෝජනා කළ ස්ථානයේ ආදාහනාගාරය ඉදි කිරිමට .පොල්වත්ත ප්‍රදේශයේ බැකෝ එක ගිහින් සුද්ද කර දුන් ස්ථානය.

<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ කියන්නේ සුසාන භූමිය පහළ

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

මේ යෝජනා කරන ස්ථානය අපට හරියටම පැහැදිලි නැහැ. යෝජනා කරනවා . ස්ථිර කරනවා.එහෙම මේ සභාවට ඉදිරිපත් කරන්න බැහැ.පුද්ගලික දේවල් වගේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ර්.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

නැහැ. ගරු නගර සභා මන්ත්‍රී සරත් මහතාණෙනි මි කියන්නම් ස්ථානය.මෙය මුලින්ම අනුමත කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අනුමත කර යවා තිබුණේ ඒ ස්ථානයයි.

<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රීතුමා මේ සභාව විසින් නිල සෙවණ ඉදිකිරිම සඳහා අනුමත කර තිබුණේ පොල්වත්ත ආදාහනාගාරයේ පහළ කොටසයි.එම කොටස අපි සුද්ද කරලත් දුන්නා.ඒ ඉදිරිපත් කිරිමට විරෝධතාවයක් පැන නැගුණ නිසා මේ සඳහා ගරු මන්ත්‍රීවරු මණ්ඩලයක් පත් කරන ලදි. ඔවුන් විසින් තීරණය කරනු ලැබුවා පුස්තකාලය අසළ ඉදිකරන ලෙස.පුස්තකාළය අසළ ඉදිකරන එක ජනතාවගේ විරෝධතා මත පන්සල අසළට ගියා.දැන් පන්සල ලඟ ඉදිකරන්න එපා කියන නිසා එතුමිය ඉල්ලා සිටිනවා නැවත මුල් ස්ථානයම ලබා දෙන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් එතැනට තමයි මුදල් වෙන්කරනු ලැබුවේ.මා යෝජනා කරනු ලබන්නේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට යවන ලද ආදාහනාගාරයේ පහල කොටස . මුලින්ම මේ සභාවට යෝජනා කරනලද ස්ථානය. එය ආදාහනාගාරයේ පහළ කොටසයි.ගම්වල ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. මා එය යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ යෝජනාවට විරුද්ධ අය ඉන්නවාද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳ අදහසක් කිව යුතුයි. ඔබතුමා පටලැවිලි දමන නිසා ප්‍රකාශ කරන්නේ.ඔබතුමා සමඟ වසර 14ක් පමණ කාලයක් සිටියානේ. මෙයට විරුද්ධ වුණා කිවුවානේ. මෙතුතමියට කතා කර බලන්න කියන්න.ප්‍රදේශයේ මන්ත්‍රීවරු සිටිනවා.ඔවුන් සමඟ සාකච්ඡා කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා, සභාව විසින් කළ යුත්තේ එක එක ජනතාව සමඟ සාකච්ඡා කිරීම නොව ගරු මන්ත්‍රී මණ්ඩලයත් සමඟ සාකච්ඡා කර ගන්න තීන්දු ක්‍රියාත්මක කිරීම.එවිට ගරු මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන යෝජනාවක් තිබේ නම් එය කරන්න.නැතිනම් නැහැ.මේ යෝජනාවට විරුද්ධ කවුරු හරි ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

විරුද්ධ අය නෙමේ .ගමේ අය සමඟ සාකච්ජාවක් පවත් වන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සාකච්ජාව පවත්වන්නේ මෙහි. වෙන කොහේවත් පවත්වන් අවශ්‍ය නැහැ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් ඔබතුමා ජනතාව විරුද්ධ වන විට මෙය නවත්වනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා නතර කර නැහැ.මා ප්‍රකාශ කර සිටියේ මේ සභාවේ සිදු වුණු දේවල්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,පොල්වත්ත සුසාන භූමියට අයිති ඉඩම තමයි එහි තිබෙන්නේ.මා යෝජනා කරනු ලැබුවේ එහි පහළ වාහන නතර කිරීමේ අංගනයක් ඉදිකිරීමට.අපි මුදල් ඉල්ලා සිටියා. අපට මුදල් ලබා දෙනවා කිව්වා. ගම්පෙරළිය යටතේ.ගරු ජනාධිපතිතුමාත් ගරු අගමැතිතුමාත් දෙපැත්තට ඇද්ද නිසා තමයි මුදල් නාවේ.ඊට පසු නගර සභාවෙන් ඇස්තමේන්තුව හැදුවා ලක්ෂ 160ක මුදලකට.කොහොමහරි ඔතන එම වාහන නතර කිරීමේ අංගනය හදන්න.ගොඩනැඟිලි ඉදිකරන එක නෙමේ. මොකද මෙය අපි

ගෙන ආ යෝජනාවකි.සුද්ද කර එය සකස් කරන්න. පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කරන ලෙස ඉල්ලා සිටියේ. ගිය වෙසක් පෝය දිනයේ. ගරු සභාපතිතුමාට යෝජනා කරනු ලැබුවේගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රකාශ කර සිටියා නගර සභාවේ විස්තර දන්වන ලෙස .මේ ගොඩනැගිල්ල කඩා ඉවත් කිරිමට.අපි ඔය ස්ථානයට විරුද්ධයි. පොල්වත්ත ආදාහනාගාරයේ ගරු ස්වාමින් වහන්සේලා ආදාහනය කරන ලද ස්ථානය.පින්නදූව සිරි මහින්දාරාමේ ගරු ස්වාමින් වහන්සේ ආදාහනය කරනු ලබන්නේ එම ස්ථානයේ.දැන් ගරු ස්වාමින්වහනසේලා ආදාහනය කරන්නේ නැති නිසා එම ස්ථානයේ රථවාහන අංගනයක් සෑදිමට යෝජනා කරනු ලැබුවේ.එතැන එය ඉදිකළ යුතුයි . අපි කොහෙන්හරි මුදල් ගෙනත් දෙන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්දා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය ආදාහනාගාරයට අයිති කොටසක් නෙමේ.එහි ස්වාමින් වහන්සේලා ආදාහානය කරන්නේ නැහැ.මේ සඳහා ඡන්දයක් විමසා මට මෙය හදන්න ඉඩ දෙන්න .මේ කිසිම දෙයක් කරන්න වෙන්නේ නැහැ. පුදුම කරුමයක් වෙලා තියෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්</u>

ඔබතුමිය දන්නේ නැහැ මෙය පොල්වත්තට අයිතිද නැද්ද කියා. එය පොල්වත්තට අයිති.අපි දන්නවානේ. ඔය ඉඩම ගෙන ඇත්තේ ශතය ශත දෙක එකතු කරලා.ඒ කාලය ගැන ඔබතුමිය දන්නේ නැහැනේ.ගමේ ඔය කියන කට්ටිය දන්නේ නැහැ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

දැන් යෝජනා 2ක් වෙලා තිබෙනවා. අපේ ගරු ධනසේන මාදුවගේ මහතා යෝජනාව ගෙනවිත් මාස 6ක් පමණ වෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

දැන් මේ තත්වය වලක්වන්න කියා පළාත් පාලන කොමසාරිස්තුමිය එවා ඇත්තේ.මෙවැනි පැවැත්මක් ඇති මෙවැනි සභාවකට වරින් වර යෝජනා කිරිම වැරදියි.නිත්‍යානුකූලභාවයෙන් නැහැ.එවැනි යෝජනාවක් තිබේ නම් ඒ වාරයේදි කරන්න.මට ගමකට මුදල් දෙනවා නම් එය කවුරු දුන්නාත් මා කරවනවා.ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට එය අවශ්‍ය නැති වුණාට මා එය වැදගත් ලෙස සලකනවා.ඔබතුමිය නිසි විදියට ඉදිරිපත් කරන්න එම යෝජනාව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ  මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මිට පෙර අපේ කර්මාන්තය ඉදිකිරිමේදි ටෙන්ඩර්පත් කැදෙව්වා. ඒ ටෙන්ඩර්පත් ලැබී තිබෙනවාද ?

<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එය අද උදේ ලැබී තිබෙන්නේ. මා එය ලබන සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කළා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

අපට දැන ගැනිමට තිබෙනවා තනායම භූමිය තුල වැටක් ඉදිකර තිබෙනවා. අපි කලින් දිපු අය නෙමේ වෙන නමකින් තමයි අස්කොට් ලංකා වෙන නමකින් තමයි මේ කටයුතු සිදු කරන්නේ. ගිවිසුම් ගසන විට අපි හිටියේ නැහැ. මා අයින් වි ගියා.අපිට දැන ගන්න ඕන අර ගිවිසුම් ප්‍රකාරව කොහොමද වෙන නමකට ආවේ.එතකොට මෙය ඉදිවෙනවාද?මොකද මෙය ජනතාවට විශාල ප්‍රශ්නයක් ලෙස තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ජල සම්පාදනය ඉදිරිපිට කාණු පද්ධතියක් තිබුණා.ඒ ජල සම්පාදනයේ තාප්පය ඉදිකිරිමේ කොන්ත්‍රාත්කරු එමකාණු පද්ධතිය වසා ඇත.මට නෙමේ මෙය අයිති. ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතාට මෙය අයිති.මා එනවිට නිමල් මහතා කතා කර කිව්වා. බලන්න මේ මාර්ගයේ හැටි කියා. ඒ ජලසම්පාදන මණ්ඩලය ළඟින් තිබුණා කාණුව . දැන් එම කාණුව සම්පූර්ණම වසා තාප්පය ඉදි කර තිබෙන්නේ. එහෙම සිදු වුණාම තමයි ඩෙංගු උවදුර ඇති වන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ ජලසම්පාදන මණ්ඩලයෙන් පාර අල්ලා ගෙන ද? එහෙනම් කණුව උඩද සාදා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

කාණුව නැහැ. සම්පූර්ණ වසා තිබෙනවා පස් දමා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණසේවා නිලධාරි මහතණෙනි මේ කියන කාරණය ගැන බලන්න. ජලසම්පාදන මණ්ඩලය වැරදි නම් අවශ්‍ය කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස් එම් රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා ප්‍රකාශ කරන්නේ අම්බලන්ගොඩ ආදාහනාගාරයේ ගල් ගැලවි තිබෙනවා . එය කඩාගෙන වැටෙන්න කලින් ප්‍රතිසංස්කරණය කරන්න. මානාන ක්‍රිඩාංගනයේ ලොරි ගන්නවා කියා කොන්ක්‍රිට් දමා විශාල ප්‍රශ්නයක් ඇති වි එය වසා දමා තිබුණා.නමුත් අඩි 03ක පමණ ඇතුල් විමක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මේ දිනවල මේ ක්‍රිඩාංගණයට පස් දමාගෙන යනවා. පලමු අදියරට රු.500000/= හා දෙවැනි අදියර රු.500000/= ක මුදලක් යටතේ ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබෙනවා.සභාව විසින් අනුමත කරා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, හිරේවත්ත පෙර පාසලේ ගේට්ටුව ඇර තිබෙනවා. එය ඉබ්බෙක් දමා වසා තබන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා නම් දන්නේ නැහැ. මට වඩා ගරු මන්ත්‍රිතුමනි ඔබතුමා දැන ගත යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අද අලුතින් හැදූ වැසිකිළි දෙකට ගරු සභාපතිතුමා මා යැව්වා.මේ සඳහා ලක්ෂ ගණනක් වියදම් කර සාදා ගොම ගාන්න වගේ වතුර බැස යන තැන සාදා තිබෙන්නේ.එය දැක්කාම හරිම අපරාදයකි. කවුරු කළාද කියා දන්නේ නැහැ.එක්කෝ සුදු සිමෙන්ති ටිකක් දමන්න.එය වතුර බැසිමට සකසා ඇත්තේ එතැනට.මොනවාහරි වැටුණාම එකතු වි ගඳ ගසයි.

**<u>ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

සඳුන් මහතණෙනි මොකක්ද මේ සිදු වි ඇත්තේ. සභාවේ වැඩ කටයුත මෙයින් අවසන් කරනවා.

- **පස්වරු 2.30 ට රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

රණසි උත්පලා ගුණවර්ධන මිය
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2019 -05–29 වන දින,**
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.